# දකුණු ආසියාවේ සුළුතර ජන අයිතිවාසිකම්

# සහ

# ආගමික සහජීවනය ප්‍රවර්ධනය කරමු

# මානව හිමිකම් සුරකිමු

පුහුණුකරුවන් පුහුණු කිරීමේ අත්පොත

2019 ජූනි 30 - ජූලි 03, නේපාලයේ කත්මණ්ඩු නගරයේ පැවති පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ මුළුවේ වාර්තාව

# දකුණු ආසියාවේ සුළුතර ජන අයිතිවාසිකම්
# සහ
# ආගමික සහජීවනය ප්‍රවර්ධනය කරමු
# මානව හිමිකම් සුරකිමු

පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව

2019 ජූනි 30 - ජූලි 03, කත්මණ්ඩු, නේපාලය.

දකුණු ආසියාවේ සුළුතරයේ අයිති වාසිකම් සහ ආගමික සහජීවනය වැඩිදියුණු කිරීම සඳහා මානව හිමිකම් ප්‍රවර්ධනය රාමුවක් සකසා ගැනීම සඳහා මැදිහත්වන මානව හිමිකම් ක්‍රියාධරයින් පුහුණු කිරීමට මෙම අත්පොත සම්පාදනය කර ඇත.

ISBN: 978-955-1489-26-7

**මූල්‍ය අනුග්‍රහය** -යුරෝපා සංගමය (European Union)

**සැලසුම් අනුග්‍රහය**

ජාතිවාදයට හා සියලු වර්ගයේ වෙනස්කොට සැළකීමට එරෙහි ජාත්‍යන්තර ව්‍යාපාරය
ආසියානු කොමිටිය (IMADR –Asia Committee)
345/18A කුරුප්පු පාර, කොළඹ 08, ශ්‍රී ලංකා.
දුරකථනය+ 94115757323
ඊ මේල්: asiacommittee@gmail.com

මානව හිමිකම් සඳහා දකුණු ආසියානුවෝ (SAHR)
345/18 කුරුප්පු පාර
(17/7 කුරුප්පු පාර
කොළඹ 08, ශ්‍රී ලංකා
දුරකථන/ෆැක්ස්+94112695910
ඊමේල්:sahr@southasianrights.org
වෙබ්:www. southasianrights.org

ජගරන් නේපාලය (Jagaran)
P.O Box:19487
Anamnagar-32
Kathmando, Nepal
Tele: +977015705439 ,Email:info@jagarannepal.org

මුද්‍රණය හා ප්‍රකාශයට පත්කිරීම 2020

සැළසුම හා පිටු සැකසීම : Originals Creative Print Solutions

සියලු හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනය පිටපත් කිරීම සහ විකිණීම සඳහා නොවේ. එහෙත්, ඉගැන්වීමේ අරමුණ ඇතිව ඕනෑම ක්‍රමයකට නැවත සකස් කිරීමේ හැකියාව ඇත. පරිවර්තනය සඳහා වෙනත් ප්‍රකාශනයකට නැවත ප්‍රයෝජනයට ගැනීමට පිටපත් කිරීමට පෙර පිටපත හිමිකරුගෙන් ලිඛිත අවසර ලබාගතයුතු ය.

## පටුන


| | |
|---|---|
| පිළිගැන්වීම් | IV |
| හැඳින්වීම | V |
| ප්‍රමුඛතාවයන් | 1 |
| සහභාගිවන්නන්ගේ අත්දැකීම් හඳුණාගැනීම | 1 |
| වැඩමුළුවේ න්‍යාය පත්‍රය පරිසමාප්ත කරගැනීම | 5 |
| පුහුණු සැසි | |
| ඉගෙනීම සහ මෙනෙහි කිරීම සඳහා ඉඩකඩ නිර්මාණය කිරිම | 6 |
| මානව හිමිකම් සංකල්ප සහ සංදර්භය | 7 |
| තොරතුරුවල වැදගත්කම | 8 |
| පදනම් තොරතුරු එකතු කිරීම -මූලාශ්‍ර | 10 |
| සාක්ෂි ගොණුකිරිම, තහවුරු කිරීම හා සාක්ෂි පිළිබඳ තක්සේරුකිරීම | 10 |
| ප්‍රමිතීන් යොදාගනිමින් මානවහිමිකම් උල්ලංඝනයන් නිශ්චිතව පැහැදිලි කරගැනීම | 13 |
| සම්මුඛ සාකච්ඡා තුළින් තොරතුරු රැස්කිරීම | 15 |
| තොරතුරු පටිගතකර ගැනීමේ මූලිකාංග | 19 |
| දත්ත සෙවීමේ වාර්තාවක් ලිවීමේ මූලිකාංග | 20 |
| දත්ත සෙවීමක් සැළසුම් කිරීම සහ පවත්වාගෙන යෑම | 21 |


## තොරතුරු සඳහන් ලේඛණ


| | |
|---|---|
| අත් පත්‍රිකා 1 මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර පනත | 23 |
| අත් පත්‍රිකා 2 තොරතුරු එක්රැස් කිරිමේ වැදගත්කම- ජොනතන් කුටැබ් | 24 |
| අත්පත්‍රිකා 3 තොරතුරුවල මූලාශ්‍ර හඳුණාගැනීම | 26 |
| අත්පත්‍රිකා 4 විශ්වාස හෝ ආගමික නිදහස කෙරෙහි වූ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් | 28 |
| අත්පත්‍රිකා 5 ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් උපයෝගිකර ගැනීම | 52 |
| අත්පත්‍රිකා 6 සම්මුඛ සාකච්ඡා පැවැත්වීම | 58 |
| අත්පත්‍රිකා 7 ප්‍රමිතිගත පටිගත කිරීමේ ආකෘතිය | 59 |
| අත්පත්‍රිකා 8 කාලානුරූප තොරතුරු සම්පාදනය | 63 |

# පිළිගැන්වීම

පුහුණු කිරීමේ කරුණු ඇතුළත් ප්‍රකාශනය සහ පුහුණු කරන්නන් පුහුණු කිරිමේ වැඩමුළුව පැවැත්වීමට මූල්‍ය ආධාර ලබාදීම සම්බන්ධයෙන් අපි යුරෝපා සංගමයට ස්තුති කරමු.

මෙම වැඩ මුළුව පැවැත්වීමට අප තෝරාගත්තේ පුරා දශක තුනකට අධික කාලයක් පුරා මානව හිමිකම් ක්ෂේත්‍රයේ ක්‍රියාධරයෙකු සහ සම්පත්දායකයෙකු වශයෙන් කටයුතු කළ ඉන්දියාවේ ඩී. ජේ. රවින්ද්‍රන් මහතා ය. ඔහුට සහ සහායක සම්පත්දායිකා කල්පලතා ඩියුටා මහත්මියට ද දකුණු ආසියාවේ නන්දෙසින් පැමිණි සහභාගිකයින්ට ද ස්තුති කිරිමට කැමැත්තෙමු.

මෙම පුහුණු කරන්නන් පුහුණු කිරීමේ වැඩමුළුව සැළසුම් කිරීම, සැපයුම් සහ සේවා සැපයීමෙන් උපකාර කළ ඉමඩා, සහාර් සහ ජගරන් නේපාල් සංවිධානවල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට සහ කාර්යමණ්ඩලයට ද අපගේ ස්තුතිය හිමිවේ.

# හඳුන්වාදීම

පසුගිය සමයේ සුළුජන ආගම් නොඉවසීම වර්ධනය වීමත් සමගම එහි ප්‍රතිඵලයක් වශයෙන් දකුණු ආසියාවේ සුළුතර ජන කණ්ඩායම්වලට එරෙහි ප්‍රචණ්ඩ සිදුවීම් ඉහළ යෑමක් දක්නට ඇත.

එසේ පීඩාවට පත්වන වින්දිතයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිම සහ වැඩිදියුණු කිරීම සඳහා එවැනි ප්‍රචණ්ඩත්වයන්ට ප්‍රතිචාර දැක්වීමට සහ ආරක්ෂාව සැපයීමට මැදිහත් වන මානව හිමිකම් ක්‍රියාධරයින්ගේ නිපුණත්වය සහ දැණුම ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවයක් මතුව තිබේ.

මෙම සංදර්භය තුළ, 2019 ජූනි 30- ජූලි 03, කත්මණ්ඩු හී දි දකුණු ආසියාවේ සුළුතර ජන අයිතිවාසිකම් සහ ආගමික සහජීවනය වැඩිදියුණු කිරීම සඳහාත්, මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ද, මැදිහත්වන ක්‍රියාධරයන්ගේ නිපුණත්වය වර්ධනය කිරීමත්, මෙම කාර්ය හරහා නිරන්තරයෙන්ම අපට මග පෙන්වන සැලැස්මක් නිර්මාණය කරගැනීම අරබයා පුහුණු කරන්නන් පුහුණු කිරීමේ වැඩ මුළුවක් ජගරන් නේපාල්, මානව හිමිකම් සඳහා දකුණු ආසියානුවෝ (සහාර්) සහ සියලු ආකාරයේ වෙනස්කොට සැලකිම් සහ ජාතිවාදයට එරෙහි ජාත්‍යන්තර ව්‍යාපාරයේ- ආසියානු කමිටුව (ඉමඩා) සංවිධානය කළ හ.

දකුණු ආසියානු කලාපයේ ඉන්දියාව, බංගලාදේශය, මාලදිවයින, ශ්‍රී ලංකාව, පාකිස්ථානය හා නේපාලයේ අපගේ සාමාජික සංවිධාන නියෝජනය කරමින් පැමිණි ක්‍රියාධරයන් මෙයට එක්විණි. ඩී. ජේ. රවින්ද්‍රන් මහතා සහ කල්පලතා ඩියුටා මහත්මිය සම්පත්දායකයන් වශයෙන් කටයුතු කළහ.

අප විසින් ඉදිරිපත් කරන මෙම වාර්තාව පුහුණුවේ සැලසුම සහ අන්තර්ගතයේ විස්තරයක් සපයයි. පුහුණු වැඩ මුළුව වෙනුවෙන් විශේෂයෙන් සකස් කරන ලද තොරතුරු සහිත ලේඛණ සහ බෙදාහරින ලද අත්පත්‍රිකාද ඇතුළත් ය.

අපගේ සාමාජික සංවිධාන වලින් පැමිණි නියෝජිතයන් මෙන්ම සංවිධාන ද මෙවැනි වූ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමේ දී මානව හිමිකම් නියාමකයින්ට මගපෙන්වීමක් ලෙස මෙම ප්‍රකාශණය භාවිතා කරණු ඇතැයි අපේක්ෂා කෙරේ.

# මූලික වැඩකටයුතු

## සහභාගිවන්නන් ගේ අත්දැකීම් හඳුණාගැනීම

පුහුණුවක අවශ්‍යතාවයන් සංදර්භගත කිරිමට සහභාගි වන්නන්ගේ පුහුණු අවශ්‍යතාවයන් සහ අත්දැකීම් ආරම්භයේදීම සාකච්ඡාවක් තුළින් හෝ පුහුණු සැසිය ආරම්භ කිරීමට පෙර ප්‍රශ්න පත්‍රයක් ලබාදිමෙන් අවබෝධ කරගත හැකි ය.

උදාහරණයක් ලෙස, මෙම වැඩමුළුවේ සහභාගිවන්නන්ගේ පුහුණු අවශ්‍යතාවයන් සහ අත්දැකීම් පහත සඳහන් පරිදි සම්පිණ්ඩනය කළ හැකි ය.

### සහභාගිවන්නන්ගේ අත්දැකීම්

**මූලික මානව හිමිකම් අත්දැකිම්**

- ජාතීන් අතර ප්‍රචණ්ඩත්වය හේතුවෙන් විපතට පත්වූවන්ට සහනාධාර සැපයිම.
- ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සංවර්ධන ක්ෂේත්‍රයේ වැඩකර තිබීම.
- ප්‍රජාතන්ත්‍රවාදි අවකාශයට ඇති අභියෝග, ජාතිවාදය, කුල පීඩනය, අනීතික ඝාතන සහ පලිගැනීමේ ඝාතන, අත්අඩංගුවේදී හිංසනයට ලක්වීම, වධබන්ධන, මානවහිමිකම් ක්‍රියාධරයන් මුහුණ දෙන අවදානම සහ තර්ජන, මානව හිමිකම් සම්බන්ධව වැඩකරන ආයතන මුහුණ දෙන අභියෝගයන් සම්බන්ධයෙන් අත්දැකීම් යනාදිය.
- සංක්‍රමණිකයින්, ළමා ශ්‍රමිකයින්, වෙනත් ශ්‍රමිකයින් , මිනිස් වෙළඳාමට (කුට්ඨනයට) ගොදුරුවූ - වින්දිතයින් සමඟ වැඩ කිරීම.
- අනීතික ඝාතන සම්බන්ධයෙන් මැදිහත්වීම
- පසුගිය වසර 7 පුරා නීති විරෝධි අත්අඩංගුවට ගැනිමේ හා වධ බන්ධනයන්ට ලක්වූවන් නියෝජනය කිරීම.
- ජාතික හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සමඟ මානව හිමිකම් නගාසිටුවීම සහ ක්‍රියාධරයින් ආරක්ෂා කිරීමට වැඩ කිරීම.
- සිවිල් වැසියන්ගේ ආරක්ෂාව සම්බන්ධව වැඩකිරිම.

**මානව හිමිකම් කඩවීම් සම්බන්ධ සිදුවීම් ගවේෂණය**

- විශේෂයෙන් ළමුන්ට සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සහ හිංසනයන්ට අදාළව සිදුවන පොලිස් බලපෑම් සහ මානව හිමිකම් කඩකිරිම් පිළිබඳව තොරතුරු ගොණුකිරීම සහ මානව හිමිකම් කඩවීම් සම්බන්ධව සොයාබැලීම.

**මැතිවරණ නිරීක්ෂණය /අධිකරණ කටයුතු**

- ස්ත්‍රී පුරුෂ සමාජ භාවයට අදාළව ජාතික පාර්ලිමේන්තු මැතිවරණය නිරික්ෂණය කිරීම.
- මානව අයිතීන් උල්ලංඝනයන් හා මැතිවරණ ප්‍රචණ්ඩත්වය නිරීක්ෂණය කිරිම.

**අධ්‍යාපනය / දැණුම නිර්මාණය / පුහුණුව**

- දැණුවත් කිරීමට භාවිතා කරන උපකරණ සැළසුම් කිරිම ( පොස්ටර්ස්, අත්පත්‍රිකා, ඩිජිටල් පුවරු, ස්ටිකර්)
- කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය නිමාකිරීම (EVAW),ස්ත්‍රිපුරුෂ සමාජභාවය(GBV), අන්තවාදි ප්‍රචණ්ඩත්වය වැළැක්වීම, සමාජ සහජීවනය, අව ර ඩිකල්කරණය, ඉවසීම, , ප්‍රජාතන්ත්‍රවාදි ආකල්ප, අනාගමිකත්වය, කාන්තාවන් හා මානව හිමිකම්, බහුත්වවාදය, විවිධත්වය සම්බන්ධව මූලික වශයෙන් පුහුණු සැසි පැවැත්වීම.
- වින්දිතයින්ට සහ මානව හිමිකම් ක්‍රියාධරයින් මූලික කරගත් ඔවුන්ගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘති සහ වැඩසටහන් වල ධාරිතාවය නිරන්තරයෙන්ම පුළුල්කිරීම සහ සංකල්පගත කිරිමට ශක්‍යතාවයක් ලබාදීම.
- තරුණ තරුණියන් සඳහා නායකත්ව පුහුණු වැඩ මුළු සංවිධානය කිරිම.

**පර්යේෂණ /උද්දේශනය**

- අව වරප්‍රසාදිත ප්‍රජාවන්, විශේෂයෙන් විවිධ සුළුජන ආගමික ප්‍රජාවන් මුහුණදී සිටින මානව හිමිකම් කඩවීම් සම්බන්ධව මැදිහත්වීම, උද්දේශන (Advocacy) සහ පර්යේෂණවල නියැලීම.
- ආගමික සුළුතර ප්‍රජාව මුහුණපාන පුරවැසි භාවය අහිමි කරවීම් සම්බන්ධව සහ ආගම පදනම් කරගත් වෛරී අපරාධ පිලිබඳ නඩු වලට සම්බන්ධවීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම.
- ප්‍රචණ්ඩ අන්තවාදයේ වර්ධනය සහ මානයන් (ප්‍රාරම්භනය) මූලිකව හඳුනාගනීම.
- ආධාර ලබාදෙන ආයතන හඳුනාගැනීමට සිවිල් සමාජ සංවිධානවලට(CSO)උපකාර කිරිම.

| පුහුණු අවශ්‍යතාවයන් | |
|---|---|
| නිරීක්ෂණය | • සුළුතර ප්‍රජාවන්ගේ අයිතීන් උල්ලංඝනය කිරීම් නිරීක්ෂණය කිරීම සඳහා මෙවලම්<br>• උල්ලංඝණයවීම් සෙවීමේ කාර්යයේ දි කළයුතු හා නොකළයුතු දේ.<br>• විවිධ ආගමික ප්‍රජාවන්ට එරෙහිව එල්ලවන ප්‍රචණ්ඩත්වයන් පිලිබඳව මානව හිමිකම් ප්‍රමිතීන් මූලික අවශ්‍යාංග වශයෙන් යොදාගනිමින් දෛනිකව නිරීක්ෂණය කිරීම.<br>• ආගම මත පදනම්ව මානව හිමිකම් ක්‍රියාධරයන්ට එරෙහිව එල්ලවන ප්‍රචණ්ඩත්වයන් විධිමත්ව ලේඛණගත කිරීම.<br>• නීත්‍යානුකූල නඩු විභාගයක් නැති දණ්ඩන සහ ආගම පදනම් කරගත් වෛරී අපරාධ ලේඛණගත කිරීමට අදාළ මෙවලම්. |
| හැකියාවන් පිළිබඳ අවබෝධය ශක්තිමත් කිරීම සහ උද්දේශන සඳහා මෙවලම් | • උපාය උපක්‍රම.<br>• ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ යාන්ත්‍රණයන්.<br>• ලේඛණගත දත්ත ආරක්ෂිතව ක්ෂණිකව බෙදාහැරීම කිරීම සඳහා මාධ්‍යයන් සහ උපාය උපක්‍රම.<br>• රටේ තානාපති දූතසේවාවන් සමග උද්දේෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම. |
| මානව හිමිකම් ප්‍රමිතීන් හා නීතිය පිළිබඳව දැණුම ශක්තිමත් කිරීම. | • සුළුජන ආගමික ප්‍රජාවගේ අයිතීන් ආරක්ෂා කිරීමට අදාළ නීති පිළිබඳ අවබෝධය ශක්තිමත් කිරීම<br>• මානව හිමිකම් ප්‍රමිතීන් පිළිබඳ අවබෝධය ශක්තිමත් කිරීම |
| ආගම් නොරිස්සීම පිළිබඳ අවබෝධය ශක්තිමත් කිරීම | • ආගම් නොඉවසීමට පාදක වන මූලික හේතු.<br>• ආගමික නොරිස්සීම කාන්තාවන් කෙරෙහි ඇතිකරවන බලපෑම.<br>• දකුණු ආසියාවේ ආගම් නොරිස්සීමේ තත්ත්වය.<br>• සමාජ ඉතිහාසයේ සහ සමාජ පිළිවෙත් සමග ආගමික මූලධර්මවාදි අදහස් විවිධ මානයන් ඔස්සේ මුහුවන ආකාරය<br>• මූලධර්මවාදි භාවිතයන් සහ ඉගැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීමේ දී සංස්කෘතික අනන්‍යතාවයන් රැකගැනීමට අවශ්‍ය කරන දේ.<br>• අපගේ සමාජයේ ආන්තීකරණයට ලක්වූ ජනගහනය සහ කාන්තාවන් කෙරෙහි වූ ආගමික මූලධර්මවාදයේ බලපෑම. |

| | |
|---|---|
| **මානව හිමිකම් ක්‍රියාධරයින් ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම** | • මානව හිමිකම් ක්‍රියාධරයන්ට රජයෙන් එල්ලවන මර්ධනකාරී ක්‍රියාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා උපාය උපක්‍රම.<br>• සාක්ෂිකරුවන් රැකගැනීමේ වැඩසටහන් ශක්තිමත් කිරීම.<br>• කාන්තාවන් කෙරෙහි ආගමික නොරිස්සුම්වල බලපෑම.<br>• දකුණු ආසියාවේ ආගමික නොරිස්සුම් පිළිබඳ තත්ත්වයන්.<br>• මානව හිමිකම් ක්‍රියාකාරීන් සහ කාර්ය මණ්ඩලය සඳහා ආරක්ෂක සැලැස්මක් සම්පාදනය කිරීම. |
| **පුණරුත්ථාපනය සහ සහනාධාර සැපයීම** | • ආන්තික ප්‍රචණ්ඩකාරීන් පුණරුත්ථාපනය කිරීම සඳහා වැඩසටහන් සැලසුම්කර සංවර්ධනය කිරීම.<br>• වින්දිතයින්ට උපකාරවීම. |
| **සාමය ගොඩනැගීම සහ ගැටුම් නිරාකරණය** | • ආගමික නොරිස්සිම පිළිබඳ පහත සඳහන් පංතිවලින් ප්‍රණ්ඩත්වය පාලනය කර සාමාන්‍ය තත්ත්වයට නැවත ස්ථාපිතවන ආකාරය.<br>• සමාජ ඒකාබද්ධතාවය සහ ආගමික සහජීවනය, බහුත්වවාදය විවිධත්වයේ අනන්‍යතා අදහස නගාසිටුවීමට බලසම්පන්න පණිවිඩ නිර්මාණය කරන ආකාරය. |
| **ජාලගත කිරීම සහ සහයෝගිතාවය** | • ප්‍රාදේශිය මට්ටමේ හා ජාතික මට්ටමේ සාමූහික ව ඒ හඬත් ගොඩනැගීමේ අවස්ථා ගවේශනය.<br>• අතිකුත් සහභාගිවන්නන්ගේ අත්දැකීම් වලින් ඉගෙනගැනීම. |

# වැඩ මුළුවේ න්‍යාය පත්‍රය පරිසමාප්ත කිරිම

වැඩ මුළුවේ සමස්ත අරමුණු සහ සහභාගිවන්නන්ගේ පුහුණු අවශ්‍යතා සහ අත්දැකීම් මත පදනම්ව වැඩ මුළුවේ සැලැස්ම, පහත සඳහන් පරිදි සකස් කෙරුණි.



## පුහුණු සැසි

ඉගෙනීම සහ මෙනෙහි කිරීම සඳහා වටපිටාව සැකසීම (විනාඩි 9-10)

**පුහුණු කිරීම සහ මෙනෙහි කිරීම සඳහා වටපිටාව සැකසීම**

සැසියේ අරමුණ වන්යේ ආගම් නොරිස්සීම සම්බන්ධ අදහස් සම්බන්ධව සාකච්ඡාවක් මතුකර ගැනීමය. ඒ අරබයා වටපිටාවක් සකස් කර ගැනීමය.

සාකච්ඡාවට මුල පුරන්නට අවශ්‍ය ව්‍යුහයක් ලබාදීමට කියවීම් සහ උපුටනයන් යොදාගෙන තිබේ. ක්‍රමවේදයඃ

ඔවුන්ට පවරන ලද කියවීම් මත සංක්ෂිප්ත ඉදිරිපත් කිරීමක් කරන ලෙස තෝරගත් කිහිප දෙනෙක්ට පැවසූහ. ඉදිරිපත් කිරීමෙන් පසු සහභාගීවන්නන් අතර සාකඡාවක් විවෘතකර පහසුකම් සැළසුවේ ය.

## කියවීම් ආධාරක

1 මානව හිමිකම් සහ රාජ්‍යය, ආගම් ඇදහීම හා අතහැර දැමීම. පීටර් යාකොබ් http://www.opengloblerights.org/human-and-state-embracing-and-abandoning-religions/

2 ආගම සහ මානව හිමිකම් - අනුරූප හෝ ගැටුම්- ෆ්‍රෙඩ්රික් පවෙල්

3 ආගමේ බලය හා මානව හිමිකම්- ලැරී කොක්ස් http://www.kairoscenter.org/power-religon-human-rights

4 ආගම සහ මානව හිමිකම් - දයලෙක්තික සම්බන්ධතාවයක්, බාසි ඩී ගයි පෝර්ට්මන්- http://www.e-ir.info/2011/12/05/religon-and-human-rights-a-dialectical-relationship/

**උපුටාගැනීම්**

*"...පිළිගැනීම සඳහා ඇති කැමැත්ත පිණිස තිබෙන එකම තාර්කික විසඳුම වන්නේ විශ්වීය පිළිගැනීමක් වන සෑම මිනිසකුගේම අනන්‍යතාවයේ ගරුත්වය පිළිගැනීම බවය. මෙම විශ්වීය පිළිගැනීම අභියෝගයට ලක්වූයේ ජාතිය, ආගම, කණ්ඩායම, වර්ගය, ජනවර්ගය හෝ ලිංගිකත්වය අනුව පදනම් වුනු අනන්‍යතාවයන් අනුව කෙනෙක් අනිකාට වඩා ශ්‍රේෂ්ඨය යන තත්ත්වයක් මතුවීමත් සමඟය.*

*"නූතන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය තුළ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ මෙම අනන්‍යතාවයට බැඳුණු දේශපාලනය නැගී ඒම එක් ප්‍රධාන අනතුරකි. අපට ඉන් මිදුණු විශ්වීය වූ අනන්‍යතාවයක් පිළිගන්නා තත්ත්වයක් වෙත ආපසු යාමේ හැකියාවක් නොමැතිනම් මෙම ගැටුම තවදුරටත් ඉදිරියට වර්ධනය වනු ඇත."*

*ෆැරැන්සිස් ෆුකුයාමා*

*"අනන්‍යතාවයඃ ගෞරවය-ආත්ම ගෞරවය සඳහා වූ අයිතිය සහ ද්වේශ සහගත දේශපාලනය*

පුහුණු කිරීම සහ කරුණු සම්බන්ධ මෙනෙහි කිරීමට සුදුසු වටපිටාවක් සැකසීම. (9-10)

මානව හිමිකම් සංකල්ප සහ සංදර්භයන්

# සංදර්භයන් සහ මානව හිමිකම් සංකල්ප.

## අරමුණ

- මානව හිමිකම් ප්‍රමිතීන් හා මූලික සංකල්ප ගැන අවබෝධය ශක්තිමත් කිරිමට.

## ක්‍රමවේදය

සහභාගිකයෝ වින්දිතයින් හඳුනා ගැනීම. එසේ හඳුනාගත් වින්දිතයින් විසින් මුහුණපාන ලද ප්‍රචණ්ඩත්වයන් ගැන විමසීමක් කර, පහත සඳහන් ලෙස ප්‍රතිචාරයන් සටහන් කරගැනීම.

| වින්දිතයින් | උල්ලංඝනයන් |
|---|---|
| ආගමික සුළුතර ප්‍රජාව | වෙනස්කොට සැළකීම |
| වධ බන්ධනයට ලක්වූ වින්දිතයින් | ශාරීරික පහරදීම් |
| ළමුන් | වෛරී අපරාධ |
| වාර්ගික සුළුතර ප්‍රජාව, ආදිවාසි ජනතාව | වෛරී භාෂණය |
| වෙනස් දක්ෂතාවයන් ඇති ජනයා | වධ බන්ධන |
| සංක්‍රමණිකයින් | ඉඩම් වලින් පලවා හැරීම් |
| මානව හිමිකම් ආරක්ෂකයින් | ද්වේශ සහගත චෝදනා |
| ජ්‍යෙෂ්ඨ පුරවැසියන් | මිනිස් ජාවාරම් |
| ලිංගික ශ්‍රමිකයින් | ළමා ශ්‍රමිකයින් |
| ඒඩ්ස් වෛරස් ආසාධිතයින් | වංශය, කුලයට අගෞරවයක් කළ නිසා වන ඝාතන |
| | අනීතෛනතික ඝාතන (extra jubicial killings) |
| | අතුරුදහන් කිරීම් |
| | වරප්‍රසාද අහිමි කිරීම් |

මී ලඟට ඔවුන් විසින් හඳුනාගන්නා ලද උල්ලංඝනයන් පිළිබඳ අදහස් විවෘතව හුවමාරු කරගැනීම සහ ඊට අනුරූපව අයිතිවාසිකම් සටහන් කිරීම. ගසක රූප සටහනක් මත එම කාඩ්පත් සකස් කිරීම.



## ඉගෙනගත් කරුණු

අවධාරණය කළ සංකල්ප

- ගෞරවය
- ශරීරයට ඇති අයිතිය
- වෙනස්කොට නොසැළකීම සහ සමානත්වය
- ජීවිතයට ඇති අයිතිය

මෙම සංකල්ප ගසේ මුල්වල තබන්න.

අයිතීන් අතර ඇති අන්තර් රඳපැවැත්ම සහ නොබෙදිය හැකි බවත් අවධාරණය කරන්න. සහභාගි වන්නන් විසින් විමසා බැලීමට අත්පත්‍රිකා 1 බෙදාහරින්න. සහභාගිකයින්ට ප්‍රශ්න ඇත්නම් සාකච්ඡා කරන්න.




# තොරතුරුවල වැදගත්කම

## අරමුණ

සාකච්ඡාවට පහසුකම් සැලසීම

- තොරතුරු එකතු කිරීමේ වැදගත්කම
- විශ්වාසනිය තොරතුරුවල අගය
- තොරතුරු රැස්කිරීමේ ක්‍රමවේදය සහ දළ විශ්ලේෂණය

## ක්‍රමවේදය

1 ඕනෑම ආකාරයක උල්ලංඝනයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය වන්නේ කුමක් ද? ජොනතන් කුටැබ් ගේ "මානව හිමිකම් ආරක්ෂාවේ පළමුවන අදියර" ( අත් පත්‍රිකා 2) පදනම්කර ගනිමින් කෙටි සටහන හඳුන්වා දෙන්න. සහභාගිවන්නන්ට එහි අඩංගු ප්‍රධාන කරුණු සංක්ෂිප්ත ලෙස ඉදිරිපත් කිරීමට සැලැස්වීම

## පුහුණු කරුණු

- ආරක්ෂාවේ මූලික අදියර- මානව හිමිකම් සඳහා සටන් තැබීමේ දි ඉතාමත්ම බලසම්පන්න ආයුධය වන්නේ උල්ලංඝනයේ නිවැරදි විස්තර ලේඛණ ගතකිරිම හා බෙදාහැරීමය.
- එකතු කරන ලද තොරතුරු විස්තරාත්මක, විශ්වසනීය, අදාල සහ නිවැරදි වියයුතු ය.
- තොරතුරු ප්‍රතිඵලදායි ලෙස බෙදා හැරිය යුතු ය.

2 මී ළඟට, තොරතුරු එකතු කිරීමේ වඩාත් පොදු ක්‍රමවේදය කුමක් ද? යන්න සහභාගිවන්නන්ට සාකච්ඡා කරන්නට ආරාධනා කිරීම.

| තොරතුරු එකතු කිරිමේ ක්‍රමවේදයන් |
|---|
| • සාක්ෂි සහ කරුණු සොයාගැනීමට කණ්ඩායමක් පිටත් කිරීම<br>• පරික්ෂණය පිළිබඳ පත්කර ඇති කොමිෂන් සභා<br>• තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය සඳහා පනත පාවිච්චියට ගැනීම<br>• විභාගය නිරික්ෂණය කිරිම<br>• බන්ධනාගාරයේ රැඳවියන් බැලීමට යෑම<br>• විවිධ කණ්ඩායම් මේ සම්බන්ධයෙන් කරඇති වාර්තා<br>• රාජ්‍ය ලේඛනාගාරය සහ නිල වාර්තා පර්යේෂණ කිරීම<br>• ජාත්‍යන්තර දූත කණ්ඩායම් වාර්තා<br>• අධිකරණ වෛද්‍ය පරික්ෂණ විමර්ෂණය |

3 අවසන් සැසිය - තොරතුරු ගොණුකිරීමේ අරමුණ කුමක් ද?

| තොරතුරු රැස්කිරිමේ අරමුණ |
|---|
| • නීතිමය ක්‍රියාමාර්ගයන්ට ගොනු කිරීම<br>• ඒ සමඟ සාක්ෂි එක්රැස් කිරිම<br>• සත්‍යය,සහ උල්ලංඝනයේ ස්වරූප ස්ථාපිත කිරීම්<br>• ප්‍රතිපත්ති දියුණු කිරිම සහ උල්ලංඝනයන් වැළැක්වීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම<br>• උද්දේශන (Advocacy) හා බලමුළු ගැන්වීම්<br>• වින්දිතයින්ට ආධාර උපකාර සැපයිම<br>• ඓතිහාසික වාර්තා ස්ථාපිත කිරීම<br>• මානව හිමිකම් සහ වගවීම් නිරික්ෂණය කිරිම |




# තොරතුරු රැස්කිරිමේ  මූලික දේවල්

## අරමුණ

තොරතුරු මූලාශ්‍රයන් හඳුණාගැනීම පදනම්ව සාකච්ඡාවට පහසුකම් සැළසීම

## ක්‍රමවේදය

සංක්ෂිප්ත පුවත් වාර්තාවක් සහභාගිවන්නන් අතට දී  ( අත්පත්‍රිකා 3) තොරතුරුවල වෙනස් මූලාශ්‍රයන් හඳුනාගන්නා ලෙස ඔවුනට පවසන්න.

## පුහුණු මූලිකාංග

- තොරතුරුවල  මූලාශ්‍ර ස්ථාපිත කරගැනීම, එම තොරතුරු සෘජු හෝ වක්‍ර වියහැකිය.
- සිද්ධියක් ගැන කලින්ම ලැබෙන තොරතුරු ලබාදෙන්නේ ගවේශන නිලධාරින් සහ ප්‍රථමාධාර ස්වෙඡා සේවකයින් විය හැකි ය. දෙන ලද අභ්‍යාසයන් හි  සෘජු  ප්‍රභවයන්ට ඇසින් දුටු සාක්ෂි ඇතුළත් වේ.
- ඒ පිළිබඳ දැණුමක් තිබෙනවා වියහැකි වන නමුත් සිද්ධිය සමග යම් සෘජු සම්බන්ධයක් නොතිබිය හැකයි.  යම් අයවලුන් හෝ සෘජු නොවන මූලාශ්‍රයන්  ද්වීතික මූලාශ්‍ර වේ.  සිදු වූ ස්ථානයට  පැමිණ නොසිටි නමුත්  පවුලේ සාමාජිකයින් සෘජු නොවන  මූලාශ්‍රයන්ට ඇතුළත් ය.

# සාක්ෂි ගොනුකිරිම, සාක්ෂි තක්සේරු කිරිම සහ තහවුරු කිරිම.

## අරමුණ

- සාක්ෂි ගොණුකරන විවිධ ක්‍රමවේද සහ එබඳු සාක්ෂි මගින්  අවබෝධය ශක්තිමත් කිරීම

## ක්‍රියාදාමය

1. මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ සිද්ධියක් ඇතිවූ සැනෙන්  ජනතාව ප්‍රථමයෙන්ම අසන ප්‍රශ්න මොනවා ද?

| | |
|---|---|
| ඔබ දන්නේ කොහොම ද?<br>ඔබ එය විශ්වාස කරන්නේ කෙසේ ද?<br>ඔබට ඇසින් දුටු සාක්ෂි තිබේ ද?<br>කිසියම් කුපිත කිරීමක් තිබුනා ද? වේලාව කීය ද?<br>මුල් හේතු මොනවා ද?<br>අනික් පාර්ශවය මේ ගැන කියන්නේ මොනවා ද?<br>ඔබගේ නිගමනය පක්ෂපාති ද? ඔබ එය දැනුම් දුන්නේ කාට ද? | මෙබඳු ප්‍රශ්ණවලට ප්‍රතිචාර දැක්වීමට තිබෙන අවශ්‍යතාවය කුමක් ද?<br>සාධක හෝ සාක්ෂි |

2. ඔප්පු කිරීමේ මට්ටම හා සාක්ෂි ගොණු කිරීම පිළිබඳ සාකච්ඡා කිරීම

## ඉගෙනීමේ සටහන් : සාක්ෂි ගොණු කිරීම සහ ඔප්පු කිරීමේ මට්ටම

- සියලු නිගමන සාක්ෂි මත පදනම්විය යුතුය.
- තොරතුරු අනාවරණය කිරිමට සියලුම පාර්ශවයන්ට පැමිණීමට බලකිරිමට රාජ්‍ය නොවන සංවිධානවලට හෝ මානව හිමිකම් නිරීක්ෂකයින්ට අධිකාරි බලයක් නැත. කෙසේ නමුත් ඔවුන්ට තිබෙන්නා වූ සියලුම තොරතුරු එකතුකර ඒවා විශ්ලේෂණයකර නිගමනයට පැමිණීමේ හැකියාව ඇත.
- යම් උල්ලංඝනය කිරීමක් සම්බන්ධයෙන් වාර්තාවීමත් සමඟම එම සිදුවීම ඔප්පු කිරිමට අවශ්‍යවන්නා වු සාක්ෂිවල ස්වභාවය සහ විමර්ශනයට බඳුන් වු කරුණු මත නොයෙකුත් මූලාශ්‍රයන් විශ්ලේෂණය කිරීමට අදාළවන සියලු මූලාශ්‍රවල ලැයිස්තුවක් සකස් කිරීම ප්‍රයෝජනවත් වේ. උදාහරණයක් ලෙස අනීතික ඝාතනයක් විභාග කිරීමට අදාළවන මූලික කරුණු.

  අ. සිද්ධියට භාජනය වූ වින්දිතයා කවු ද?

  ආ. සිද්ධිය වුයේ කොහේ දී ද?

  ඇ. සිදුවුයේ කවදා ද?

  ඈ. මීට සම්බන්ධ යැයි කියන චූදිතයා කවු ද?

  ඉ. සිරුර හමුවුනේ කාට ද?
- මෙවැනි විශ්ලේෂණයක් මත මෙම සිදුවීම සම්බන්ධයෙන් ඍජුව සාක්ෂි ඉදිරිපත් කළ හැකි තැනැත්තා හඳුනාගැනීම.

  අ. මල සිරුර දුටු පුද්ගලයා.

  ආ. පශ්චාත් මරණ පරික්ෂණය පැවැත්වු වෛද්‍යවරයා

  ඇ. සිරුර හඳුණාගත් ඥාතීන්

  ඈ. සිද්ධිය වු ස්ථානයට ලඟා වූ පොලිස් නිලධාරියා යනාදිය.
- මී ලඟට, කවුද? කුමක් ද? කවදා ද? ඇයි ? කොහේ ද? සහ කෙසේ ද? යන මුලික ප්‍රශ්න තහවුරු කිරීමට හැකියාව තිබෙන අය සපයන බොහෝ තොරතුරු ද්වීතියික මුලාශ්‍ර ලෙස හඳුනාගැනීම.

උදාහරණ ලෙස අනීතික ඝාතනයේ වින්දිතයා ඉලක්කයක් වෙන්නට හැකි හේතූන් පදනම්ව තොරතුරු ලබාදිමේ හැකියාව තිබිය හැකි පලාත්බද ජනතාව හෝ පවුලේ සාමාජිකයින්.

- පුවත්පත් වාර්තා යනාදි, පශ්චාත් මරණ පරික්ෂණ වාර්තා වැනි ලේඛණගත සහ ලියන ලද සාක්ෂි සෙවීම.
- සියලුම සාක්ෂිමය කරුණු පසුපස හඹා යෑම ඉතා වැදගත් ය. සාමාන්‍යයෙන් මානව හිමිකම් නිරීක්ෂකයෝ වටිනාකමකින් යුතු සාක්ෂි හෝ හැඟීම්බරව ලැබෙන තොරතුරු පිළිබඳ ගැටලුවලට මුහුණ දෙති. එවැනි අවස්ථාවල දී තහවුරු කරන ලද සාක්ෂි දෙසට යොමුවීම වැදගත් වේ. ද්වීතියික මුලාශ්‍රයන්ගෙන් ලබාගත් සාක්ෂිමත පදනම් වී ගොඩනගන ආකෘති වලින් හෝ සිද්ධිය වු ස්ථානයට පරික්ෂණ චාරිකාවක යෙදීමෙන් සාක්ෂි තහවුරු කර ගත හැකිවේ. ලබාගත් සාක්ෂි විශ්වාස කළහැකි බව සහ සත්‍ය බව තක්සේරු කිරිමට එය වැදගත් ය.
- "අවශ්‍යතාවයක් වෙනුවෙන් සිදු කරනු ලබන ප්‍රකාශනයන්"ද සාක්ෂි ලෙස පාවිච්චිකළ හැකි ය. මාධ්‍යවේදීන් විසින් පවසන ලද පරිදි හතලිහක් වෙනුවට පුද්ගලයින් පස්දෙනෙක් ඝාතනය කළ බව ඇතැම් විට යම් ආණ්ඩුවක් පිළිගැනීම අනීතික ඝාතනයකට උදාහරණයකි. මෙය" අවශ්‍යතාවයක් වෙනුවෙන් සිදු කරනු ලබන ප්‍රකාශනයක් ඇතළත් කිරීමකි. ආණ්ඩුව මරණ පහ පිළිගැනීම පිළිබඳව වගවීමේ තැන් පටන් එවැනි පිළිගැනීම් මානව හිමිකම් නිරීක්ෂකයන්ට සිය ගවේෂණය ඉදිරියට ගෙන යෑමට යොදාගත හැකි ය.
- නිගමනයට ළඟාවෙන තුරු සාධකවල ප්‍රමිතිය ආනාවරණය කිරිම වැදගත් ය. උදාහරණ ලෙස තොරතුරු කෙලින්ම ලබාගැනීමට නොහැකිව තිබීමේ දී තොරතුරුවල ද්වීතියික මූලාශ්‍රයන් සියල්ල සමස්ථයක් වශයෙන් ගෙන ඒ මත නිගමනයක් පදනම් විය හැකිය. එවැනි සිදුවීම් තුළ තහවුරු කරන ලද ද්වීතියික මුලාශ්‍රයන්ගෙන් තොරතුරු ලබාගත් ආකාරය අනාවරණය කිරිම ඉතා වැදගත් ය.
- ඔවුන්ගේ විමර්ශනයන් හි සාධක ඉහල මට්ටමක් අත්කර ගැනීමට මානව හිමිකම් වෙනුවෙන් කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධානවලට නොහැකි වන්නට පුළුවන. නමුත් තමන්ගේ ගවේශනය සාධාරණ සැකයෙන් එහා මට්ටමකින් අත්කරගැනීමට ඔවුන් උත්සහ කළයුතු ය. සැළසුම් කරන ලද ක්‍රියාවේ ස්වභාවය මත ද සාධකවල මට්ටම රඳපවති. සැලකිය හැකි ලිපියක වාද කරුණකට සැළසුම් කරන්නේ නම්, එවිට විශ්වාස කළහැකි ද්වීතියික මුලාශ්‍ර මත විශ්වාසය තැබිය හැකිය. කෙසේ නමුත් ප්‍රධාන වාර්තාවක් ප්‍රකාශයට පත්කිරිමට සැළසුම් කරන්නේ නම් එවිට ඉතා ශක්තිමත් සාක්ෂි අවශ්‍යය.
- විශ්වාසය තබා ඇති සාක්ෂියේ මට්ටම ඕනෑම ලේඛනණයන් හි සාක්ෂිවල මට්ටම අනාවරණය වේ. නිශ්චිතව සමාප්ත කරන වාක්‍ය ඛණ්ඩ සනාථ කිරීමේ මට්ටම අඟවයි. "විය හැකිමයි." " සැළකිය හැකියි " සහ "ඇසින් දුටු සාක්ෂිකරු එසේ කිව්වා." වැනි දේ උදාහරණයකට ගතහැකි ය. අපිට සනාථකර ගැනීමට නොහැකි ක්ෂණික අර්බුදකාරි තත්ත්වයක් වාර්තා කරන අතරතුර ඇසින්දුටු සාක්ෂි " එසේ කියයි" යන ලෙස යෙදීම සුදුසු ය."
- මානව හිමිකම් නිරීක්ෂකයන් ප්‍රමාණවත් සාක්ෂිමත පදනම්ව ඉදිරිපත් කරන වාර්තාවක් නම් ආණ්ඩුව මතට සාධකවල බර පැටවේ. එවිට ආණ්ඩුව නීති කඩකිරිම ආමන්ත්‍රණය කිරිමට ක්‍රියාමර්ග හෝ චෝදනා ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරණු ඇත.




# මානව හිමිකම් කඩකිරීම් නිශ්චය කිරීමේ ප්‍රමිතීන් යොදාගැනීම

## අරමුණු

- මානව හිමිකම් උල්ලංඝනයන් නිරීක්ෂණය කිරීමේ දී ප්‍රමිතීන් යොදා ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම.
- මානව හිමිකම්වල ප්‍රමිතීන් යොදාගැනීම භාවිතා කිරීමට හුරුකිරීම.

.

## ක්‍රමවේදය

මානව හිමිකම් කඩවීම් නිරීක්ෂණය කිරීමට අදාළව මීට පෙර සැසිවාරවලදී යම් කරුණු සාකච්ඡා කරන්නට යෙදුනි. මානව හිමිකම් රීතීන් අනුගමනය කිරීම හෝ අදාළ කිරීම සහ නිරීක්ෂණය අතර සබඳතාවය කුමක් ද ?

- මානව හිමිකම් බැඳීම්වලට එකඟ වූ රාජ්‍යයන්ගේ මූලික මානව හිමිකම් ප්‍රමිති නිරීක්ෂණය කිරීම.
- ජාතික මට්ටමේ දී මෙම ප්‍රමිතීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අඩංගුවේ. ( මූලික අයිතිවාසිකම් මූලධර්ම හෝ විශේෂ නීති වශයෙන්)
- මෙම ප්‍රමිති බලාත්මක කිරීමට සියලුම ආණ්ඩුවලට බැඳිමක් තිබේ. මානව හිමිකම් ප්‍රමිතීන් ජාත්‍යන්තර මට්ටමේ දී විශ්ව මානව හිමිකම් ප්‍රඥාප්තියේ සහ මානව හිමිකම් ගිවිසුම්වල මූර්තිමත් වේ.

## අභ්‍යාස 1

සහභාගිවන්නන් කණ්ඩායම්වලට බෙදා, අත්පත්‍රිකා 4 විමර්ශනයකර, සහභාගිවන්නන්ට ආගම ඇදහීමේ නිදහසට ඇති අයිතියට අදාළව මානව හිමිකම් ප්‍රමිතීන් වලට අදාළ වූ අදහස් ඉදිරිපත් කිරිමක් කරන්නට අවස්ථාව සළසන්න.

## අභ්‍යාස 2

අත්පත්‍රිකා 5 න් සපයා ඇති ටර්ක්මෙනිස්තානයේ නඩු විභාගය සහ වධ බන්ධන පිලිබඳ ඒකාබද්ධ ප්‍රකාශනය සහ වධබන්ධන පිලිබඳව ද කරුණු මතුකර දැක්වීමට ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිති යොදාගෙන තිබෙන ආකාරය විමර්ශනය කරන්න යැයි පවසන්න.

## ඉගෙන ගන්නා මූලික කරුණු

- 8 වන පරිච්ඡේදයේ ටර්ක්මෙනිස්තානය, වධබන්ධනයන්ට එරෙහි එක්සත් ජාතින්ගේ ප්‍රඥාප්තිය සහ සිවිල් සහ දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර් ජාතික ප්‍රඥප්තියට සම්බන්ධ පර්ශවයක් බව සඳහන් ය. එබැවින් වධ බන්ධනයන්ට එරෙහිව පියවරගැනීමට ටර්ක්මෙනිස්තානය බැඳීසිටී.
- රජය අයිතීන් සහතික කිරීමට පියවර ගතයුතු බව සහ (ICCPR) හි 14 වගන්තියේ පොරොන්දු වී ඇති පරිදි සාධාරණ නඩු විභාගයකට ඇති අයිතිය 15 පරිච්ඡේදයේ සාකච්ඡා කරයි.
- ටර්ක්මෙනිස්තානය ඉදිරිපත්කර ඇති වාර්තාව පිළිබඳව වධබන්ධනයට එරෙහි එක්සත් ජාතින්ගේ කොමිටියේ නිරීක්ෂණයන් ඇතුළු සාකච්ඡාව 19 වෙනි පරිච්ඡේදයේ ඇත.
- අපරාධ මුල් බැසගැනීම, සහ නිදහස් නඩු විභාගයන්ට ඇති අයිතිය, වධ බන්ධන සහ සිරගෙවල්වල තත්ත්වය, හුදෙකලා රඳවා තැබීමේ භාවිතයන්ට අදාළවන ප්‍රමිති නිරීක්ෂණය කිරීමට මානව හිමිකම් සංවිධාන මෙම ජාත්‍යන්තර ප්‍රමිති ප්‍රවර්ධන රාමුව යොදාගෙන තිබේ.




# සම්මුඛ සාකච්ඡා තුළින් තොරතුරු එකතුකිරීම

## අරමුණු

- සම්මුඛ සාකච්ඡා තුළින් තොරතුරු රැස්කිරීමේ දී මූලික කරුණු විමසීම

## ක්‍රියාදාමය

1. සහභාගිකයින් යුගල දෙකක් හඳුණාගෙන ඔවුන්ට එකිනෙකාට නිරූපන අවස්ථා ලබාදීම ( අත්පත්‍රිකා 6) එක් එක් යුගල අනුකරණාත්මක සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීම. ඉතිරි සහභාගියන්ට සම්මුඛ සාකච්ඡාව නිරීක්ෂණය කර ක්‍රියාදාමයේ ඔවුන්ගේ ප්‍රතිචාරය සටහන් කරගැනීමට සැලැස්වීම.
2. සම්මුඛ සාකච්ඡාව නිමවීමෙන් පසුව සහ සම්මුඛ සාකච්ඡාවක් පවත්වන අතරතුර හා ඒ සඳහා සූදානම්වන අතර වැදගත් කරුනු විමර්ශනය කිරීමට සිතෙහි රඳවාගත යුතු ය.
3. **ඉගෙන ගතයුතු වැදගත් කරුණු**

සාක්ෂිකරුවන් සහ වින්දිතයින්ගෙන් තොරතුරු එකතුකිරීම සඳහා සම්මුඛ සාකච්ඡා පැවැත්විම ඉතාමත් පොදු ක්‍රමය වේ. සම්මුඛ සාකච්ඡා සඳහා සැළසුම සහ සූදානම අවශ්‍ය ය. දුර්වල අන්දමට පවත්වන සම්මුඛ සාකච්ඡාවක් සාක්ෂිකරුවන් හා වින්දිතයින් පිටස්තරයින් බවට පත්වෙනවා මෙන්ම එකතුකළ දත්තයන් හි ගුණාත්මක බවට එය බලපානු ලැබේ. සම්මුඛ සාකච්ඡාවට පෙර, සම්මුඛ සාකච්ඡාව අතරතුර, සම්මුඛ සාකච්ඡාවට පසුව යන ආදී වශයෙන් පියවර තුනක ක්‍රියාදමයක් ලෙස සම්මුඛ සාච්ඡාවක් ගැන කල්පනා කිරීම ඵලදායි වේ.

## පූර්ව සම්මුඛ සාකච්ඡාව

- සම්මුඛ සාකච්ඡාව පැවැත්වීම සඳහා සුදුසු කාල වේලාව, අවස්ථාව සහ කාල නියමය, ස්ථානය නිශ්චිත කිරිම. හැකිතරම් දුරට පුද්ගලයින් සම්මුඛ සාකච්ඡා සඳහා සම්බන්ධකර ගැනීම සහ සම්මුඛ සාකච්ඡාව නිරීක්ෂණය කරන්නන් හෝ බලාසිටින්නන් මත ඇතිකරණ කුතුහලය වළකාගැනීම, සම්මුඛ සාකච්ඡාව පවත්වන ස්ථානයේ ව්‍යාකුලත්වයන් ඉවත් කිරීම.
- සන්දර්භය සහ සාකච්ඡාවට භාජනයවන අය සිද්ධිය සමඟ සමීපවීම.

- සුදුසු ප්‍රශ්න පත්‍රයක් සකස් කිරීම සහ පරීක්ෂණයට භාජනය වී ඇති මානව හිමිකම් කඩවීම්වල මූලයන් තේරුම් ගැනීම. ප්‍රශ්න මාලාවක් ලිවීම (භාවිතයට නොගත්තත්), සම්මුඛ සාකච්ඡාවට භාජනය වන්නාගෙන් ලබාගන්නා අදාළ තොරතුරු සහතික කිරීම සහ නීති කඩකිරීමක මූලයන් නිශ්චය කරගැනීමට එය උදව්වේ.
- සිද්ධියට අදාළ සාධක සොයන්නෙකුට ඇයි? කුමක් ද? කවු ද? කවදා ද? කොහොදී ද? කෙසේ ද? යන සරල ප්‍රශ්න මාලාවක් පාවිච්චි කළහැකි ය. සවිස්තරාත්මක ප්‍රශ්න සූදානම් නොකර ගන්නේ නම් වාසිසහගත ය.

## සාකච්ඡාව අතරතුර

- සම්මුඛ සාකච්ඡාවට භාජනය වන අය සැහැල්ලුවෙන් සිටින්නේ ද යන්න සහතික කරගන්න. ඔහුගේ/ඇයගේ පොරොන්දුව පිළිබඳව ඔබගේ සැළකිලිමත් බව අදාල අය වෙතයොමු කරගැනීමට වාචිකව හා කායික භාෂාවෙන් ඔහු /ඇයගේ වගකීම ගැන ඔබ වෙතට සැළකිල්ල යොමුකර ගන්න.
- ඔබගේ සංවිධානය ඇතුළත්ව ඔබ ගැන හඳුන්වා දී, සාකච්ඡාවට සහභාගිවන්න. අවශ්‍ය නම් ඔබගේ පෞද්ගලික තොරතුරු සපයන්න.
- සම්මුඛ සාකච්ඡාවේ අරමුණ සහ ලබාගන්නා තොරතුරු සමග ඔබ කරන්නට සැළසුම්කරන දේ ගැන පැහැදිළිව විස්තර කර දෙන්න.
- සම්මුඛ සාකච්ඡාව කරන පුද්ගලයා ගේ නම අනාවරණය කිරීමට ඔබ අදහස් කරන්නේ නම් සහ තොරතුරු ප්‍රසිද්ධ කිරීමට යන්නේ නම් අනුමැතිය විමසන්න. ඔබ රෙකෝඩරයක් පාවිච්චි කිරීමට සැලසුම් කරන්නේ නම් අනුමැතිය ලබාගන්න.
- සම්මුඛ සාකච්ඡාව අතරතුර ඔබගේ අදහස ප්‍රකාශ නොකරන්න. සම්මුඛ සාකච්ඡාව අතරතුර විනිශ්චයන් හා පක්ෂපාතීත්වයෙන් වලකින්න.
- ඉවසීමෙන් සිටින්න. සැම වෙලේම සම්මුඛ සාකච්ඡාවට භාජනය වන්නාගෙන් තර්කානුකූල බවක් අපේක්ෂා නොකරන්න. පුරෝකථනය නොකළ හැකි පිලිතුරු ලබාගැනීමට විවෘත වන්න.
- සම්මුඛ සාකච්ඡාවට භාජනය වන්නා ගේ හැසිරීම නිරීක්ෂණය කිරීම සහ වාචික නොවන අදහස් හුවමාරුවට සංවේදී වන්න. හොඳ අසන්නෙකුගේ කලාව ප්‍රගුණ කරන්න. අණසකට යටත් ලෙස සම්මුඛ සාකච්ඡාව මෙහෙයවීමෙන් වළකින්න.
- සම්මුඛ සාකච්ඡාව කරන්නා පැමිණිල්ල මෙහෙයවන්නෙක් ලෙස ක්‍රියා නොකළ යුතුය. කලබලකාරී ලෙස ප්‍රශ්න කිරීමෙන් වලකින්න. අවුල් සහගත වචන භාවිතයෙන් වැළකී එදිනෙදා භාවිතාවෙන සමීප වචන පාවිච්චි කරන්න. හැඟීම්බර හානිකර වචන භාවිතයෙන් වළකින්න. වචන තෝරාගැනීමේ පරිස්සම අභ්‍යාස කරන්න.
- සාක්ෂිකරුට කලින්ම කටට පිළිතුර දී ප්‍රධාන ප්‍රශ්න ඇසීමෙන් වළකින්න. උදාහරණ ලෙස බන්ධනාගාර නිළධාරීහු ඔබට සැළකුවේ කෙසේ ද? ඇසීම සුදුසුය. ඔබට වධ දුන්නා ද? වැනි ප්‍රශ්න ඇසීමෙන් වළකින්න.. සමහර අවස්ථාවන් තුළ ආරක්ෂාවෙන් තොර සාක්ෂිකරු එය සමඟ එකඟ නැතිව පවා ඔහු හෝ ඇය නිතරම ප්‍රශ්නයකට සාකච්ඡාකරුට එකඟව "ඔව්" යැයි කිවහැකි ය. එම නිසා ඔව් හෝ නෑ කියන පිලිතුරු සඳහා වන ප්‍රශ්න ප්‍රමාණය අවම කරන්න.
- ඔහුට හෝ ඇයට ඕන විධියට ඔහුගේ හෝ ඇයගේ කථාන්තරය කියන්නට සාක්ෂිකරුට ඉඩ හරින්න. කථාන්තරය සම්පූර්ණයෙන්ම තමන්ගේ අතින් ගිලිහෙන්නට ඉඩනොදීමට වගබලා ගන්න. ඔහු හෝ ඇය එකඟ නොවනවා නම් ප්‍රධාන කථාවට ගෙන එන්නට සාක්ෂිකරුව

මෘදු ලෙස මෙහෙයවා ගන්නට සම්මුඛ ප්‍රශ්න පාවිච්චි කරන්න. දීර්ඝ විස්තර සමඟ සම්මුඛ සාකච්ඡාකරු ව්‍යාකූලත්වයට පත්වීමේ හැකියාව අවම කිරීම සහ වින්දිතයාට කථාව ව්‍යුහගත කරගැනීමට උපකාරවන බැවින් කාලනිර්ණ පිළිවෙලට කතාන්තරය සංෂිප්තව කරන ලෙස සාක්ෂිකරුගෙන් ඉල්ලා සිටින්න.

- අනිකුත් මූලාශ්‍ර මගින් සැපයූ තොරතුරු සනාථ කරගැනීම, හෝ අනිකුත් සාක්ෂිකරුවන් හෝ මගපෙන්වීම සඳහා සාකච්ඡාවට භාජනය වන්නා උපකාරකර ගැනීමට බලන්න. කෙසේ නමුත් අනිකුත් සාක්ෂිකරුවන්ගේ නම් සහ විස්තර සම්බන්ධ කිරීමෙන් වලකින්න. සම්මුඛ සාකච්ඡාවට භාජනය වන්නන් එක් එක්කෙනාගේ පෞද්ගලිකත්වයට ගරුකරන්න.
- පාරිතෝෂණ හෝ ප්‍රතිඵල පොරොන්දු නොවන්න. බොරු බලාපොරොත්තු නිර්මාණය නොකරන්න. විමර්ශනයට භාජනය වෙමින් පවතින අපරාධය සම්බන්ධයෙන් පවරාගත් වගකීම හැකි ආකාරයෙන් කරගෙන යන බව විස්තර කරන්න.
- සාක්ෂිකරුවන් සම්බන්ධකරගත් ආකාරය, සහ දේශපාලන හෝ අනිකුත් සම්බන්ධතාවයන්, වාර්ගික මූලයන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සාක්ෂිකරුවන්ගේ නම, වයස ඇතුළත් කිරීම, සැළකිය යුතු තොරතුරු, සම්මුඛ සාකච්ඡා කාලය, සම්මුඛ සාකච්ඡාවක පිහිටීම, සම්මුඛ සාකච්ඡාවේ දිනය සහ වේලාව වැනි සමහර මූලික තොරතුරු සටහන්කර මතක තබාගන්න.
- සමහර අවස්ථාවලදී භාෂා පරිවරිතකයෙකුගේ උපකාරය නොමැතිව සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට නොහැකිවන්නට පුළුවන. භාෂා පරිවර්තකයෙකු තැන්පත් පුද්ගලයෙකු වියයුතු සහ අදහස් හුවමාරුව තේරුම් කරන්නෙකු පමණක් වියයුතු වේ. සම්මුඛ සාකච්ඡාවේ අරමුණ විස්තර කිරිම සහ ඔහුගේ/ඇයගේ භූමිකාව පැහැදිළි කිරීමට උසස් මට්ටමකින් පරිවර්තක එය සංක්ෂිප්ත කිරීම වැදගත් ය. සම්මුඛ සාකච්ඡාව තුළට ඇතුල් වි ඔහු/ඇය ගේම ප්‍රශ්න ඇසුවොත් හෝ සාකච්ඡාවට භාජනය වන්නා සමඟ වාදයක පැටලෙන්නේ නම් තොරතුරු සොයන්නා මැදිහත්වී පරිවර්තක පරිවර්තකයෙකු ලෙස තබාගැනීම සහතික කරගත යුතු ය.
- විදුලිය විසන්ධිවීම යනාදි එබඳ අවහිරතාවයන් මැඩපවත්වා, අඛණ්ඩව සාකච්ඡාව කරගෙන යෑමේ සැලසුමක් තිබියයුතුය උපකරණ පාවිච්චියේ දී සිදුවන අමාරුකම් පෙර දැකිය යුතු ය.

## සම්මුඛ සාකච්ඡාවට පසු

- සියලුම කරුණු කාරණා ආවරණය වී තිබෙනවාද යන්න නැවත පරික්ෂාකර බැලීමට තොරතුරු සොයන්නා නිස්කලංක ස්ථානයක සිට සටහන් කියවිය යුතු ය. සාකච්ඡාවට බඳුන්වන්නා විසින් යෝජිත අනිකුත් සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් ඔහු හෝ ඇය විසින් සකස් කරගත යුතු ය. සාකච්ඡාවට බඳුන්වන්නා විසින් සඳහන් කළ, ප්‍රකාශයට පත්කර ඇති අනිකුත් ලිපි ද්‍රව්‍ය හෝ ලියවිලි පිළිබඳ වෙනම සටහනක් සකස් කරගන්න.
- තොරතුරු සොයන්නන් එක් අයෙකුට වැඩිය සම්බන්ධ වූවා නම් සහ ස්වාධීන ලෙස ඔවුන් සමඟ සම්මුඛ සාකච්ඡාකර ඇතිනම් ඔවුන් අතර මූලික හරස් පරික්ෂාවක් කළයුතු ය.
- සාක්ෂිකරුවන් සම්මුඛ සාකච්ඡාවට භාජනය වෙමින් සිටින අතර ඔවුන් මතුකරන දේ සහ ද්විත්ව පරික්ෂාව ලෙස හෝ තවදුරටත් පැහැදිළි කරගැනීමට අවශ්‍ය විවාදයකට මුල්වන සටහනක් සකස් කරන්න.
- සම්මුඛ සාකච්ඡාව අතරතුර සාක්ෂිකරුවෙක්, ස්ථානයක් හෝ වස්තුවක් පිලිබඳ සඳහන් කර තිබුණේ නම් තොරතුරු සොයන්නා සාක්ෂි තහවුරු කරගැනීම සඳහා එම ස්ථානය හෝ වස්තුව ගැන සොයා බලන්න. අවශ්‍යය නම් සිතියමක් හෝ සටහනක් ද සූදානම් කරන්න.

## සමහර අතිරේක කරුණු

- ***වින්දිතයින් සම්මුඛ සාකච්ඡාවට බඳුන්කිරීම:*** මානව හිමිකම් වින්දිතයින් සාමාන්‍යයෙන් හොඳම තොරතුරු මූලාශ්‍ර වේ. කෙසේ නමුත් ඔවුන්ගේ අත්දැකීම් බෙදාගැනීමට නියම මානසික තත්ත්වයකින් පසුනොවිය හැකිවීම සහ ඔවුන් කම්පන තත්ත්වයකට පත්වසිටිම ගැන තොරතුරු රැස් කිරීමේ දී සැළකිල්ලට ගැනීම අවශ්‍ය වේ. ඔවුන්ගේ කම්පනය වැඩි නොකිරීමට ප්‍රවේසම් වියයුතු ය. තව දුරටත් තොරතුරු ගැන ඔවුන් ව්‍යාකුල වියහැක. එයින් පසු ඔහු පැවසූ දේ ඉවත් නොකලයුතුය ඉවසිය යුතු ය.
- ***සැකයට පාත්‍රව ඇති වරදකරුවන් සහ අධිකාරීන් සමග සම්මුඛ සාකච්ඡා කිරීම:*** තොරතුරු සොයන්නා විමර්ශනයට භාජනය වී තිබෙන චෝදනාවන් සම්බන්ධයෙන් අධිකාරීන්ගේ මතය ලබාගතයුතු ය. ආණ්ඩුවේ ප්‍රකාශක හෝ සැකකරු සියලු චෝදනා ප්‍රතික්ෂේප කරන්නේ නම් සහ විශ්වාස කළ නොහැකි විස්තර සපයන්නේ නම් පවා තොරතුරු සොයන්නා ආචාර සම්පන්නව සිටිය යුතුය. තොරතුරු සොයන්නා එදිරිවාදිකම් ඇති නොකරගෙන නොගැලපිම් සොයා බැලිය යුතු ය. තොරතුරු සොයන්නා චෝදනාවකට එරෙහි දෙපාර්ශවයේම සාක්ෂි ලබාගැනීමට විවෘත මනසකින් යුතුව ඇහුම් කන් දියයුතු ය. අධිකාරීන් හෝ දන්නා චූදිතයින් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීමේ දි තැනට සුදුසු ප්‍රඥාව, සැලසුම සහ සූදානම අවශ්‍ය ය. එවැනි සම්මුඛ සාකච්ඡාවන් සඳහා සූදානම් කරන ක්‍රමයක් වන්නේ, හැකි භූමිකා අනාවරණය සහ සිදුවීමවල විස්තර සටහන පිළිබඳ සාකච්ඡා කිරීමට කල්පනා කිරීම ය.
- ***කාන්තා වින්දිතයින් සමග සම්මුඛ සාකච්ඡා කිරීම:*** තොරතුරු සොයන්නන්, විශේෂයෙන්ම පිරිමින්, වෙනස්කොට සැළකීමට භාජනයවන කාන්තාවන් ගැන දැනුවත් වියයුතු සහ එකම ආකාරයට මුහුණදෙන කාන්තා වින්දිතයින් එයින් වළකවා ගතයුතු ය. මක්නිසාද යත් ලිංගික හිංසනයේ වෙනත් ස්වරූපයන් හා ස්ත්‍රී දූෂණයට සම්බන්ධ සමාජ මතයන් ගැන අවබෝධයක් තොරතුරු සොයනනාට තිබිය යුතුය. අපහරණයට ලක්වූ එබඳු කාන්තාවක් නිරන්තරයෙන් උපදේශනයනට භාජනය වියයුතු හා සාක්ෂිය සහතික කිරිම සඳහා ඇයගේ අනුමැතිය ලබාග ැනීම සවිස්තරාත්මකව විස්තර කළයුතුය. එය ලිංගික අපරාධයට භාජනය වූ ස්ත්‍රී වින්දිත කාන්තාවන් සම්මුඛ සාකච්ඡාවට භාජනය වනවිට විශේෂයෙන් අත්‍යාවශ්‍ය වේ.
- ***ළමා වින්දිතයින් සමඟ සම්මුඛ සාකච්ඡා කිරීම:*** ළමුන්ගෙන් තොරතුරු එකතු කිරීමේ දි ක්‍රමික ක්‍රියාදාමයකින් සහ සියලුම තොරතුරු එක සැසියකින් ගොණුකළ නොහැකි ය. ළමයා මත අයුතු බලපෑමක් නොකිරීම සහ ළමයාගේ ලෝකය පිළිගැනීමට ඔබ සූදානම් විය යුතු ය.
- ***සරණාගතයින් සමග සම්මුඛ සාකච්ඡා කිරීම:*** සරණාගතයින් සමඟ සම්මුඛ සාකච්ඡාව කරන කාලය තුළ දී උන්හිටිතැන් අහිමිවීමේ ආතතියට සංවේදි වෙන්න. තමන්ගේ පවුලෙන් අපහරණය වීමේ හැකියාව සහ භෞතික සම්පත් නොමැතිව ඔවුන්ගේ නිවෙස්වලින් එළියට වැටීම පහසු දෙයක් නොවන බව අවබෝධකර ගන්න. සරණාගතයින් මුහුණදෙන අවිනිශ්චිත බව සහ ඔහු හෝ ඇයගේ ඉරණම ගැන, තොරතුරු සොයන්නෙක් අවධාරණය යොමු කළයුතු වේ.




# තොරතුරු පටිගතකිරිමේ මූලික කරුණු

## අරමුණු

- පටිගත කරන තොරතුරුවල මූලික දේ මත  පහසුකම් සැළසිමේ සාකච්ඡා.

## ක්‍රියාදාමය

පටිගත කිරීමෙන් එකතු කරන ලද තොරතුරුවල වැදගත්කම සාකච්ඡා කරන්න. අවධාරණය කරන කරුණු- නැවත ලබාගැනීමේ පහසුකම් ඇති ආකෘතියකින් තොරතුරු පටිගතකළ යුතු ය.

## ඉගෙනීමේ වැදගත් කරුණු

- සම්මුඛ සාකච්ඡා හෝ අනිකුත් ක්‍රම තුලින් තොරතුරු එකතු කළ වහාම එය නියම ලෙස පටිගත කළ යුතු ය. එසේ කිරීමෙන් එකතු කළ තොරතුරු අස්ථාන ගතනොවේ.
- පටිගත කිරිම ඇතැම්විට  ප්‍රි ටෙක්ස්ට්  ආකෘතිය තුළ කිරිම හෝ  ප්‍රමිතිගත ආකෘතියක් වෙන්නට පුළුවන.
- ප්‍රමිතිගත ආකෘතීන් තොරතුරු වල  ඒකරූපතාවය  සහතික කිරීමට උදව්වේ.  මෙලෙස තොරතුරු නැවත නොවෙනස්ව ලබාගැනීමේ පහසුව  සහ  ආකෘතිය හඳුනාගැනීමට උපකාරවේ. අත්පත්‍රිකා 7 සාම්පලයක් ඉදිරිපත්කර තිබේ.
- ප්‍රමිතිගත ආකෘතියක  අඩංගු වියයුතු  සවිස්තරාත්මක තොරතුරු.
  - ක්‍රියාව
  - වින්දිතයා
  - සම්බන්ධ චූදිතයා
  - තොරතුරු එකතු කිරිමට භාජනය වූ  පුද්ගලයා (වින්දිතයා  නොවන්නේ නම්)
  - සම්මුඛ සාකච්ඡාවට සහභාගිවන්නාගෙන් ලබාගෙන තිබෙන හැඳුණුම්පත් හෝ, උදාහරණ ලෙස  වෛද්‍ය වාර්තාවල  ඡායා පිටපත් යනාදිය.  භෞතික හෝ  වාර්තාගත සාක්ෂි.
  - තොරතුරු රැස්කළ පුද්ගලයා
  - එබඳු තොරතුරු රැස් කළ පසු කරන ලද සැලසුම/ ගන්නා ලද ක්‍රියාව පසු විපරම් කිරීම.
  - දත්ත කට්ටලය සම්පූර්ණ කිරීමට අවශ්‍යවන  අනිකුත් තොරතුරු

- තොරතුරු පටිගත කිරීමේ දී නිශ්චිත වචන මාලාවන් භාවිතා කළයුතු ය. පැමිණිලිකරුවන්ගේ තරාතිරම, ක්‍රියාකරුවන්ගේ තරාතිරම. දූෂණයේ ස්වභාවය වැනි දේ විස්තර කිරීමට ස්ථාවර නිශ්චිත වචන මාලාවක් පාවිච්චි කිරීම වැදගත් ය. නිශ්චිත වචන මාලාවක් යොදාගැනීම තොරතුරු කාර්යක්ෂම ලෙස නැවත ලබාගැනීමට උපකාර වේ. ,මරණ දණ්ඩනය, මරණ දඬුවම යන සමාන වචන උදාහරණ වේ. තොරතුරු නැවත ලබාගැනීම සහ ගබඩාකරන කාලය තුළ අවුලක් ඇති නොවීමට එය වෙනස් නොවී යොදාගැනීමට එක වචනයක් තෝරා ගැනීම යහපත් ය.
- සංවිධානයේ ස්වභාවය සිතේ තබාගනිමින් පටිගතකරන ක්‍රමය යොදාගත යුතු ය. උදාහරණ සඳහා නීති ආධාර සංවිධානයකට සෑමදාම බොහෝවිට වින්දිතයින්ගෙන් ලැබෙන්නාවූ පැමිණිළි. එක්සෙල් වගුවක් තුළ පැමිණිලි ෆෝරමයක වාර්තාකරන ලද තොරතුරු කාල වකවානුවට අනුව එකතු කිරීම ප්‍රයෝජනවත් විය හැකි ය. එවැනි කාලානුක්‍රමිකව සකස්කරග ැනීම හඳුනාගැනීමේ ආකාරය සහ දූෂණයේ ස්වභාවය බඳු විශේෂ ගුණාංග පරීක්ෂා කිරීමේ දි උපකාර වේ. අත්පත්‍රිකා 8න් ආදර්ශයක් සපයා තිබේ.

# තොරතුරු සෙවීමේ වාර්තාවක් ලිවීමේ මූලික අංග

## අරමුණු

- තොරතුරු වාර්තාවක් සකස් කිරීම සහ එහි මූලිකාංග සම්බන්ධ සාකච්ඡාවකට අදාළව පදනම සැකසීම

## ක්‍රියාදාමය

සහභාගිකයින්ට මානව හිමිකම් වාර්තාවක ඇතුළත් වියයුතු මූලික දේවල් ලැයිස්තු ගතකිරීමට යොමු කරවීම. යම් හිදැසක් ඇත්නම් පුරවන්න.

## පුහුණුවන මූලික කරුණු

පහත සඳහන් මූලික දේවල් තොරතුරු සෙවීමේ වාර්තාවක අඩංගුවිය යුතු ය.

- මූලික සංක්ෂිප්තය
- සංසිද්ධියේ සංදර්භය ඇතුලු පසුබිම සහ යොදාගත හැකි නීතිමය වැඩරාමුව
- දූත මෙහෙවරේ සාමාජිකයින්ගේ විස්තර ඇතුළත් විභාග කිරීමට නියමිත කාරණා. තොරතුරු සෙවීමේ දී යොදාගත් ක්‍රමවේදය.
- එකතු කළ තොරතුරු සහ මූලාශ්‍රවල විස්තර.
- දූෂණයේ ස්වභාවය ඇතුළත් නිරීක්ෂණයන්.
- අදාළ නීති සහ අනිකුත් ප්‍රමිතීන්, පසුබිම් ලේඛණ, අදාළ මාධ්‍ය ලිපි තීරු ප්‍රකාශණ ඇතුළු ඇමුණුම්.

## සමහර අතිරේක කරුණු

- භාෂාව ලුහුඬු හා පැහැදිළි වියයුතු ය.
- අතිශයොක්තිය සහ අපහසයන්ගෙන් වළකින්න
- අපක්ෂපාතිත්වය, හානිකර දේශපාලනිකව පොළඹවන වචන භාවිතයෙන් වළකින්න




# තොරතුරු සෙවීමේ කාර්යයක් සැළසුම් කිරිම සහ පවත්වාගෙන යෑම

## අරමුණු

- තොරතුරු සෙවීමේ කාර්යයක් සඳහා විභාග කිරිමට නියමිත කාරණා පිළිබඳ මූලික දේවල් විමර්ශනය කිරිමට
- තොරතුරු සෙවිමත් පුහුණු කිරීම

## ක්‍රියාදාමය

1 තොරතුරු සෙවීමේ කාර්ය සඳහා විභාග කිරිමට නියමිත කාරණා තුළ තිබිය යුතු මූලයන්ට අදාළව සහභාගිවන්නන් සමඟ බුද්ධි කලම්බනය

4 සහභාගිකයින් කණ්ඩායම් දෙකකට බෙදා, ඔවුන්ට අවස්ථාවක් ලබා දී තොරතුරු රැස්කිරීමක් සැළසුම් කිරීම.

## පුහුණුවන කරුණු

**අවම වශයෙන් විභාග කිරිමට නියමිත කරුණු අඩංගුවිය යුතු ය.**

- මාතෘකාව
- කාර්යයේ අරමුණ
- තොරතුරු සොයන කණ්ඩායමේ සංයුතිය
- තාවකාලික කාලසටහන
- කණ්ඩායමේ සාමාජිකයින්ගේ වගකීම් සහ භූමිකාව

## තොරතුරු සෙවීමේ කාර්යක, සැලසුමේ සටහන් කිරිමට මූලික කරුණු

- තොරතුරු සෙවීමේ කාර්යක් ගෙනයෑමට තීරණය කිරීම වෙත දේශිය සංවිධානයක් සම්බන්ධකර ගැනීම හෝ මූලික තොරතුරු සම්බන්ධතා ස්ථිර කරගැනිම.
- බැලූබැල්මට පිලිගතයුතු සේ හැඟෙන මානව හිමිකම් උල්ලංඝනයක් තිබෙනවා ද, නැති ද, යන්න තහවුරු කරගැනීම.
- විවාදයට ලක්ව ඇති කරුණු වල ස්වභාවය සහ සංදර්භය ගැන අවබෝධය ශක්තිමත් කිරීම. මාධ්‍ය වාර්තා වැනි පවතින සියලුම ලියවිලි එකතුකිරීම.
- තොරතුරු ඒකරාශි කිරිමේ කාර්යයේ අරමුණු හඳුණාගැනීම.
- සීමා මායිම් ඇතිකර ගැනීම අවශ්‍ය නොවන, තොරතුරු රැස්කිරීමේ කාර්යයේ අරමුණ තොරතුරු රැස්කිරීම පමණි.
- ස්වාදායකත්වයේ අරමුණ සඳහාත් තොරතුරු ඒකරාශි කිරිම සැලසුම් කළහැකි ය.
- තොරතුරු රැස්කිරිමේ දි මුහුණ දෙන්නට සිදුවියහැකි බාධක සහ සමාජ ගතිකයන් අවබෝධ කරගැනීම
- රැකවලුන් සමඟ ගණුදෙනු කිරිම සඳහා සැළසුමක් හදාගැනීම.
- තොරතුරු සොයන කණ්ඩායමේ සංයුතිය හඳුණාගැනීම, අරමුණුවල පදනම්වීම. අරමුණ පැමිණිලිකරුවෙකුට සම්බන්ධ තොරතුරු ඒකරාශි කිරිම නම් නීතිඥයින්, ක්‍රියාකාරීන් සහ සංවිධානයක කාර්ය මණ්ඩලයෙන් එය සමන්විත වියහැකි ය. කෙසේ නමුත් මාධ්‍ය සාකච්ඡාවක් සංවිධානය කිරීම හෝ ඒකරාශි කරන කණ්ඩායම ප්‍රකාශයක් නිකුත් කිරිමට අපේක්ෂා කිරිම සහ ඉහළ මට්ටමේ සංසිද්ධියක් මත තොරතුරු සංවිධානය කරන්නේ නම්, එවිට තොරතුරු රැස්කිරිමේ කණ්ඩායමේ විශේෂඥයින් හෝ ගෞරවයට පාත්‍රවන පුද්ගලයින් ඇතුළත්වීම යහපත් විය හැකි ය.
- සාක්ෂි ගොණුකිරිම සඳහා සැළසුමක් සකස් කරන්න.
- සැලසුම තුළ ප්‍රාදේශිය සම්බන්ධතා ඇතුළත් කරන්න.
- තොරතුරු ඒකරාශි කිරිම ගැන නිළධාරින්ට දැණුම් දෙන්න.
- සම්මුඛ සාකච්ඡාවට භාජනය වන මිනිසුන්ගෙන් ප්‍රකාශන එකතු කරගන්න. හැකියාවක් ඇතිනම් පැමිණීමේ අත්සන් ලේඛණයක් ගන්න.
- පොලිස් වාර්තාවල පිටපත් වැනි සියලුම අවශ්‍ය ලියවිලිවල පිටපත් ලබාගන්න.
- අන්තර් කාලීන වාර්තාවක් නිකුත් කිරිමට සැළසුම් කරන්න.
- අවසන් වාර්තාව නිකුත් කිරිම හා ප්‍රචාරය(නිකුත් කිරීම)කිරීමට සැළසුම්කරන්න.

# තොරතුරු සම්බන්ධ ලියකියවිලි

## අත්පත්‍රිකා 1: මානව හිමිකම් පිලිබඳ ජාත්‍යාන්තර පනත්

සියලුම තනි පුද්ගලයින් ඇතුළත් ජාත්‍යන්තර පනත් විසින් පිළිගෙන ඇති මානව හිමිකම්

1 වෙනස්කොට සැළකීමෙන් තොරව සමාන අයිතිය
2 ජීවිතයට ඇති අයිතිය
3 පුද්ගලයාගේ ආරක්ෂාව හා නිදහස
4 වහල්කමට එරෙහි ආරක්ෂාව
5 කෲර සහ අමානුෂිය දඬුවම්, වධහිංසනයට එරෙහි ආරක්ෂාව
6 නීතිය ඉදිරියේ පුද්ගලයෙකු ලෙස පිළිගැනීම
7 නීතිය ඉදිරියේ සමාන ආරක්ෂාව
8 අයිතීන් උල්ලංඝනය තුළ නීති ප්‍රතිකර්මවලට ඇති ප්‍රවේශය
9 හිතුවක්කාර අත්අඩංගුවට ගැනීම් හෝ රඳවා තබාගැනීමට එරෙහි ආරක්ෂාව
10 ස්වාධීන හා අපක්ෂපාති අධිකරණයක් ඉදිරියේ නඩු ඇසීම
11 නිර්දෝෂි බව පිළිබඳ බලාපොරොත්තුව
12 පශ්චාත් යථාර්ත නීතියට එරෙහි ආරක්ෂාව
13 පෞද්ගලිකත්වය, පවුල සහ නිවසේ ආරක්ෂාව
14 සංචරණය හා පදිංචිවීමේ නිදහස
15 වධ බන්ධනයෙන් නිදහස්වීමට, දේශපාලන රැකවරණ
16 ජාතිකත්වය
17 විවහා විමට හා පවුලක් ගොඩනගා ගැනීමට
18 ස්වකීය දේපොළ
19 හෘද සාක්ෂිය, ආගම සහ සිතීමේ නිදහස
20 ප්‍රකාශ කිරීමේ, මාධ්‍යය හා අදහස් දැරීමේ නිදහස
21 රැස්වීමේ සහ සමාගම් පැවැත්වීමේ නිදහස
22 දේශපාලනයට සම්බන්ධවීමේ
23 සමාජ ආරක්ෂාව
24 යහපත් කොන්දේසි යටතේ වැඩකිරිම
25 නිදහස් වෘත්තිය සමිති
26 විශ්‍රාම සුවය සහ විවේකය
27 ආහාර ඇඳුම් හා නිවාස
28 සෞඛ්‍ය ආරක්ෂාව සහ සමාජ සේවා
29 ළමන් සඳහා විශේෂ ආරක්ෂාව
30 අධ්‍යාපනය
31 සංස්කෘතික ජීවිතයට සම්බන්ධවීම
32 අයිතීන් ඉටුකර ගැනීමට, සමාජ සහ ජාත්‍යාන්තර නියමයන්ගේ අවශ්‍යතාව.
33 ස්වයංතීරණයට
34 බන්ධනාගාර ගතවීම හෝ රඳවාතබා ගන්නාවිට මානව සැලකීම
35 විදේශිකයන් බලහත්කාරයෙන් නෙරපීමට එරෙහි තහනම් කිරීම.
36 ජාතිවාදි හෝ ආගමික වෛරය පිළිබඳව උල්පන්දම් වලට එරෙහි ආරක්ෂාව
37 සුළුතර ජන කොටස් වල සංස්කෘතියේ ආරක්ෂාව

## අත්පත්‍රිකා 2: තොරතුරු රැස්කිරීමේ වැදගත්කම

## මානව හිමිකම් ආරක්ෂා කිරිම: ආරක්ෂාවේ පළමු මායිම

## ජොනතන් කුටැබ්

"මානව හිමිකම් පිළිබඳ දැණුම්වත්වීම හා එම අයිතීන් ගේ ආරක්ෂාවට උපකාරවන ජාත්‍යන්තර වටාපිටාව, අවම වශයෙන් පරමාදර්ශයක් ලෙස, පරිසරයක් නිර්මාණය කිරීම නොයෙකුත් ආකාරයකින් මානවහිමිකම් වෙනුවෙන් ඵලදායි ලෙස වැඩකිරීමට සහ වැඩකල හැකි පරිසරයක් නිර්මාණය කිරීමට ඇත්ත වශයෙන්ම පෙර සහ නිශ්චිත ලෙස පසුගිය සියවසේ මුල්භාගයේ දී සිතාගැනීමට පවා නොහැකිය. .............

මානව හිමිකම් කඩකරන්නෙකු ලෙස සිටින්නේ වී නමුත් අපේක්ෂා කිරීමට නොහැකි වූවත්, ආඥාදායක හා දුෂ්ට පාලනයන් කෙසේ වෙතත් මෙහි ගෞරවයේ හදවත සියලු පාලන කල්ලි හා සියලු ආණ්ඩු මෙය පිළිගැනීම ය.....

මෙහි තේරුම වන්නේ, ජාත්‍යන්තර ප්‍රජාවේ ප්‍රතික්‍රියාවන් සඳහා සැළකිල්ලට භාජනය වීමෙන් තොරව පීඩිතයින් ඉදිරිපත් කරන තොරතුරුවලට ප්‍රවේශවිම සහ තොරතුරු පාලනය කළයුතුවිම සහ මානව හිමිකම් කඩකරන්නට අවශ්‍යකරන රහසිගත බව වේ....

අනික් අතට අපි, මානව හිමිකම් ආරක්ෂා කිරිම සඳහා පෙනී සිටිමට සූදානම් අය තොරතුරු ලේඛණ ගතකිරීම් වලින් ඉගෙනගත යුතු ය. මානව හිමිකම් සඳහා සටනක් කිරීමේ දි අපගේ ඉතාම බලසම්පන්න සහ ඉතාමත් ඵලදායි එකම ආයුධය මානව හිමිකම් කඩකිරීම්වල දී ඉතිරි වන සවිස්තර තොරතුරු බෙදාහැරීම සහ ලේඛණ ගත කිරීමය. අපගේ විමර්ශනයන්ට ආශීර්වාද සහ මානව හිමිකම් කඩකිරීම වැළක්වීම සඳහා අපිට ආර්ථික සම්පත් නැත. අපගේ කටයුතු පිළියෙල කිරිමට ආණ්ඩුව, රාජ්‍යයේ නිළධාරි තන්ත්‍රය අපිට නැත. අපගේ බැඳීම ඉටුකිරීමට හමුදා සහ ආයුධ අපිට නැත.

මානව අයිතීන් ආරක්ෂා කිරිමේ ඵලදායි ප්‍රථම පෙරමුණ වෙන්නට, අපි ගොණුකරන තොරතුරු ගුණාත්මක වියයුතු බව අවධාරණය කළයුතු ය. අපගේ තොරතුරු සත්‍යය, නිවැරදි සහ සවිස්තරාත්මක වියයුතුය.

ප්‍රවෘත්ති ඒජන්සි හා මාධ්‍යයට ද අපගේ හතුරන්ටද සෘජු ප්‍රවේශයන් සහ විශාල සම්පත් තිබෙන බව අප අමතක නොකළ යුතු ය. අවම වශයෙන් නිරන්තරයෙන්ම සෑම සිදුවීමකම අධිකාරීන්ගේ කියවීම ලබාදීමට එම ආයතනවලට බලකරනු ඇත. ඒ අනුව ගත්කළ මානව හිමිකම් ආරක්ෂා කිරිම සඳහා අප යොදාගන්නා ලේඛණගත කිරිම් ඵලදායි වන්නේ නිවැරදි, සවිස්තරාත්මක හා විශ්වාසදායක නම් පමණි. පුළුල් කිරිමට තරම් ප්‍රමාණවත්, ඉහළ ගුණාත්මක බවක් නැති අපගේ තොරතුරු, අපගේ සම්පූර්ණ උත්සහායට හානි සහ එම සාධකය ගෙනහැර දක්වා, ඌනතාවය නිශ්චිතව ගෙනහැර දැක්වීමට අධිකාරියට හැකියාව ඇත.

දෙවනුව අප එක්රැස් කළ තොරතුරු බෙදාහැරීමේ හැරීමේ ඵලදායි මාධ්‍යයන් සොයාගත යුතු ය. කෙසේ නමුත් විශ්වාස කටයුතු, නිවැරදි, වෙන අය පාවිච්චි නොකළ අප මතම අප පදනම් විය යුතුවේ.

මානව හිමිකම් කඩකරන්නන් මත ඵලදායි ලෙස බලපෑමක් සහ පීඩනයක් ගෙන යාමට සමත් ප්‍රේක්ෂකයින් ප්‍රවේසම් සහගත ලෙස ඉලක්කකරමින් අපේ තොරතුරු පළල් ලෙස පතුරුවා හැරිය යුතුය. සුවිශේෂ සිද්ධීන් ලෙස පුද්ගලික ඉල්ලීම් පමණක් නොව ඔවුන්ගෙන්ම මානව අයිතිවාසිකම් වාර්තා ලබාගෙන කියවිය යුතු ය. තර්ක සහ ප්‍රතිපත්ති ප්‍රකාශනයක් සහ පරිසමාප්තියට පැමිණීමට හැකිවන දත්ත තොරතුරු සහ සංඛ්‍යාන අධ්‍යයනයක් ද කළ යුතු ය. අප කරන්නේ සුවිශේෂ ගමක් තුළ සිදුවූ සුවිශේෂ දුෂ්ඨ අපරාධයකට එය නැවත සිදුවීමේ හැකියාවට තිත තැබීමට අවශ්‍යතාවය ප්‍රකාශකරන්නට නොවේ. එකම තර්කය වන්නේ පළල්ව පැතිරී තිබෙන නිශ්චිත භාවිතයක් රෙජීමය හෝ රාජ්‍යය මත පිඩනයේ බර පැටවීමට රාජ්‍යයේ ප්‍රතිපත්ති සම්බන්ධකර එම භාවිතයට තිත තැබීමට ය. නැතිනම් අපගේ උත්සහාය ආරක්ෂාවේ ඵලදායි ප්‍රථම මායිමට වඩා ප්‍රමාද වූ ගුණවාචකයක් විය හැකි ය.

එය පමණක් ප්‍රමාණවත් නොවන නිවැරදි හා සවිස්තර තොරතුරු බෙදාහැරීම හැරීම සහ ලේඛණගත කිරීම් ඔවුන් ඵලදායි ලෙස යොදාගැනීම සහ මානව හිමිකම් සංවිධානවල පැවැත්ම ගැන මා ප්‍රවේශම් වියයුතු ය. එය මානව හිමිකම් ආරක්ෂාවේ එකම ආරක්ෂක මායිම වේ. ඔවුන්ගේ මානව හිමිකම් කඩකිරීම් නැවැත්වීමට පීඩකයින් මත දැනෙන පීඩනයක් එල්ල කිරීමට අනිකුත් රටවල හෝ රට ඇතුලත සංවිධාන හෝ සිවිල් කණ්ඩායම් විසින් ඵලදායි ක්‍රියාවන් එවිට ගතයුතු වේ. එනමුත් ආරක්ෂාවේ ප්‍රථම මායිමක් අවශ්‍ය ය.

## අත්පත්‍රිකා 3: තොරතුරු මූලාශ්‍ර හඳුනාගැනීම

## පොලීසිය විසින් පහරදෙන ලද විරෝධතාකරු සඳහා අධිකාරීන් යුක්තිය සහතික කළ යුතු ය.

## 2019 මැයි 28. 00.01 (UTC)

පසුගිය මාසයේ පොලීසිය විසින් මෘගලෙස පහරදෙන ලද 22 හැවිරිදි විරෝධතාකරු, රම්සි යෙට්ටොව්ගේ මරණය, ස්වාධින, අපක්ෂපාති සහ ඵලදායිව විමර්ශනය කිරීම ඇල්ජීරියානු අධිකාරය සහතික කළයුතු බව ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ජාත්‍යන්තරය කියා සිටී. ඇසින් දුටු සාක්ෂිකරුවන් තිදෙනෙකුගේ ප්‍රතිඥාව ඇතුළත්ව සංවිධානය සාක්ෂි ගොණුකර ඇත. පොලීසිය බැටන් පොලුවලින් පහරදීමෙන් පසු සිදු වූ තුවාල වලින් ලද ප්‍රථලයෙන් අප්‍රියෙල් 19වෙනිදා රම්සි මියගිය බව වෛද්‍යවරයෙක්, නීතිඥයින් දෙදෙනෙක්, පවුලේ සාමාජිකයින් දෙදෙනෙක් හා ස්වෙච්ඡා ප්‍රථමාධාරකරුවෙක්, යෝජනා කරති.

ඇම්නෙස්ටි ජාත්‍යාන්තරයට තිබෙන තොරතුරුවලට අනුව 2019 අප්‍රියෙල් 12වෙනි දින මධ්‍යම ඇල්ජීරියාවේ පැවති ආණ්ඩු විරෝධි විරෝධතාවය කඳුළු ගෑස් සහ ජල ප්‍රහාර උපයෝගි කරගනිමින් ආරක්ෂක හමුදාව විසින් එය විසුරුවා හැරීමෙන් පසුව එයට සහභාගිවි වී ආපසු පැමිණෙමින් සිටියදි පොලීසිය විසින් රම්සි යටෝව්ට හිසට පහරදී ඇත.

පොලිසිය විසින් රම්සි යට්ටෝව්ගේ හිසට මෘග ලෙස පහර දුන් බව දැඩිලෙස යෝජනා කරන ඇසින් දුටු සාක්ෂිකරුවන්ට පෙනෙන ආකාරයට එම තුවාල හේතුවෙන් ඔහුගේ මරණය සිදුවී ඇත. මානව හිමිකම් කඩකිරිම සඳහා වගවීමට ආරක්ෂක හමුදාවේ සාමාජිකයින් අයත් නොවීමේ (Impunity) බියජනක අතීත වාර්තාවක් ඇල්ජීරියානු අධිකාරියට තිබෙන හෙයින් රම්සිගේ මරණයට තේරුමක් ඇති විමර්ශනයක් සහතික කිරිමට ඔවුන්ට අපහසු බව ඇම්නෙස්ටි ජාත්‍යන්තරයේ උතුරු අප්‍රිකානු අධ්‍යක්ෂ සහ මැදපෙර දිග සහකාර අධ්‍යක්ෂ මැග්ඩලිනා මුග්රාබි කියයි.

ඔහුගේ මරණයේ හේතුසාධක ගැන විමර්ශනයක් කිරීමට නියෝග කරන ඇල්ජීරියානු පැමිණිලි පාර්ශවය, මෘග පහර කෑමට ලක්වූ රම්සිගේ මරණය හේතුව තීරණය නොකළ මරණයක් ලෙස තීරණය වූ පොලිස් වාර්තාවක පිටපතක් ඇම්නෙස්ටි ජාත්‍යන්තරය නිරීක්ෂණය කළේ ය.

රම්සිගේ මරණයට විනිශ්චයක් දෙසට තැබූ එකම පියවර වන්නේ විමර්ශනයකට නියෝග කිරීමය. විමර්ශනය යන අතර සම්බන්ධ පොලිස් නිලධාරීන්ගේ වැඩ තහනම් කිරීම හා ස්වාධීන අපක්ෂපාතී විමර්ශනයක් අපේක්ෂා කිරීම ඉතා අපහසුය. කිසිම ප්‍රතිවිපාකයකට මුහුණ නොදී ඔවුන්ට අපරාධවලට සම්බන්ධවීමට හැකි, නීතියට ඉහලින් ක්‍රියාත්මකවීමට ඔවුන්ව නිදහස්කර පණිවිඩ යැවීම සහ පොලිසිය දිරිගැන්වීම පමණයි රම්සිගේ මරණය පිටුපස ඇති අපරාධය අල්ලා ගැනීම අසාර්ථක වීමට එකම හේතුව.

අප්‍රේල් 12වෙනිදා දිවා කාලයේ විරෝධතාවයකට සහභාගිවීමෙන් අනතුරුව ආසන්න වශයෙන් මිතුරන් පස්දෙදෙකු සමඟ රම්සි ඇල්ජීරියාවේ බෞගරා (බ්ලිඩා) නගරයට යමින් සිටිය හ. රියදුරු වැරදි දිසාවෙන් වීදියක පහලට රිය පැදවීමට උත්සහ කිරීමෙන් පසුව ඔවුන් ගමන් කළ ට්‍රක් රථය පොලීසිය නැවැත් විය. පොලිසිය ඔවුන්ට පහරදෙන විට කණ්ඩායමේ සමහරු බේරී පලාගිය අතර අනික් අයට පහර දුන් හ. පොලීසිය විසින් පහරදුන් බව ඔහු ලේ තැවරුනු ජැකට්ටු සමඟ බිමවැතිරී සිටි ඔහුව හමුවූ ප්‍රථමාධාර ස්වෙච්චා සේවකයෙකුට සිහිමුර්ජා විමට ප්‍රථම රම්සි පවසා තිබේ.

ස්වෙච්ඡා සේවකයාට අනුව ඔහුගේ නාසය තැලී පොඩි වී තිබුණි. ලේ නොගලන ඇස් බැමයට සෙන්ටිමීටරයක ප්‍රමාණයේ නොගැඹුරු තුවාලයක් ඔහුට සිදු වී තිබුණි. ප්‍රථමාධාර සේවකයා ගිලන් රථයකට කථාකරන ලෙස පොලිසියට පවසා ඇත. පසුව විනාඩි 30ක් ඇතුළත ඔහුව අභ්‍යන්තර ලේ ගැලීම නිසා හිසේ ශල්‍යකර්මයකට භාජනය වි ඔහු සිටින මුස්තාපා බාචා රෝහලට ගෙනගොස් තිබේ. නැවත සිහිය නොලද රම්සි අප්‍රේයෙල් 19 මියගියේ ය.

https:www.amnesty.org/en/latest/news/2019/05/algeria-authorities-must-ensure-justice-for-protester-beaten-by-police/

## පත්‍රිකා 4: යම් ඇදහීමක හෝ ආගමික නිදහස ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතින් ගැන කෙටි සංක්ෂිප්තයක්.

**ආගමේ නිදහසට ඇති අයිතිය සහතික කරමින් මානව හිමිකම් ප්‍රමිතීන් පැතිමාන පහක් යටතේ විභාග කළ හැකි ය.**

1 යම් ඇදහීමක් හෝ ආගමේ නිදහස

අ. යම් ඇදහීමක් හෝ ආගම අත්හැරීම හෝ වෙනස් කිරීම, අනුගතවීමට ඇති නිදහස

ආ ආගමික බලහත්කරයේ නිදහස

ඇ. අයෙකුගේ ඇදහීමක් හෝ ආගම ප්‍රකාශයට පත්කිරිමට ඇති නිදහස

- i වන්දනා මාන කිරීමේ නිදහස
- ii වන්දනාකරන ස්ථානය
- iii ආගමික සංකේත
- iv විවේක දිනවල හා නිවාඩු දිනවල ප්‍රතිපත්ති පිරිම, පූජකයින්ට ආරාධනා කිරිම
- v ආගම ඉගැන්විම හා ද්‍රව්‍ය බෙදාදීම
- vi තමන්ගේ දරුවන්ට ආගමික හා සදාචාර අධ්‍යපනය සහතික කිරිමට දෙමාපියන්ට ඇති අයිතිය.
- vii ආගමික කාරණා සම්බන්ධයෙන් පුද්ගලයින් සහ ප්‍රජාව සමග අදහස් හුවමාරුකර ගැනීම.
- viii මානුෂිය සහ පුණ්‍යකටයුතු පවත්වා ගැනීම හා ස්ථාපිත කිරිම.
- ix ලියාපදිංචිය
- x සවිඥාණික විරෝධය

2 වෙනස්කොට සැලකීම

අ. ආගම් අතර වෙනස් කොට සැළකීම/යම් ඇදහීම් හා ආගමික පදනම මත වෙනස්කොට සැලකීම

ආ. රාජ්‍යයේ ආගම

3 පීඩාවට පත් කණ්ඩායම්

අ. කාන්තාවන්

ආ ඔවුන්ගේ නිදහසෙන් පුද්ගලයින් ඉවත් කිරිම

ඇ. සරණාගතයින්

ඈ. ළමුන්

ඉ. සුළුතරයන්

ඊ. සංක්‍රමණික සේවකයින්

- අනිකුත් අයිතීන් සමග අන්තර් සම්බන්ධය
  - අ. ජීවිතයට ඇති අයිතිය, නිදහසට ඇති අයිතිය
  - ආ. අමානුෂික ලෙස හෝ පහත්කොට සැළකිම - දඬුවම්දීම සහ වධබන්ධනය - සාප කිරීම තහනම් කිරීම
  - ඇ. ආගම් නොරිස්සිම හා අන්තවාදය, ආගමික ගැටුම්වලට සම්බන්ධ ප්‍රශ්න ඇතුළත් ප්‍රකාශනයේ නිදහස
- හරස් වාදකරුණු
  - අ. නමට හෝ තත්ත්වයට හානිකිරිම
  - ආ. සිමාවන්
  - ඇ. ව්‍යවස්ථාදායක වාද කරුණු
  - ඉ. විශ්වාස හෝ ආගමික නිදහස ආරක්ෂා කරන්නවුන්

(ප්‍රමිතීන් /පිටු/ ආගමික නිදහස/වාදකරුනු ඉංග්‍රිසි/https://www.ohchr.org/EN/Issues/FreedomReligion/pages/Standards'aspx) වෙබ් පිටුවෙන් බාගත හැකි ය.

පුහුණුවට අදාළ වන ජාත්‍යන්තර ප්‍රඥප්ති

UDHR - මානව හිමිකම් විශ්ව ප්‍රකාශනය

ICCPR - සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය

ICESCR - ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය

ICERD - සකලාකාර වර්ගවාදයට එරෙහි ජාත්‍යන්තර ප්‍රඥප්තිය

CEDAW - කාන්තා ප්‍රඥප්තිය

CRC - ළමා අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය

ICMRW - සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය

# සාරාංශ ලෙස මෙම පැතිකඩ එකිනෙක මේ ලියවිල්ලෙන් විභාග කෙරේ.

| 1. ඇදහීම හෝ ආගමික නිදහස | | |
|---|---|---|
| a | යම් ඇදහීමක් හෝ ආගමක් ප්‍රතික්ෂේප කිරීම හෝ වෙනස් කිරීම, වැළඳ ගැනීමේ නිදහස | **එක්සත් ජාතීන්ගේ මානව හිමිකම පිලිබඳ විශ්ව ප්‍රකාශණය (UDHR)**<br>ආගම සහ හෘදසාක්ෂිය, සිතිමේ නිදහසට සියල්ලන්ට අයිතිය ඇත. විශ්වාසය හෝ මේ අයිතිය ඔහුගේ ආගම වෙනස් කිරීමට ද නිදහස ඇතුළත් ය.<br>**සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR)**<br>වගන්ති 18 (1) සියල්ලන්ට ආගමට සහ හෘද සාක්ෂියට, සිතීමේ නිදහසට අයිතිය තිබේ. විශ්වාසය කුමක් නමුත් ඔහුගේ තේරීම හෝ ආගමක් වැලඳ ගැනීමට ඇති නිදහස මේ අයිතියට ඇතුළත් ය.<br>**1981 මහා මණ්ඩලයේ ප්‍රකාශනය**<br>වගන්ති 1 (1)<br>සියල්ලන්ට ආගම සහ හෘද සාක්ෂිය, සිතිමේ නිදහසට අයිතිය ඇත. විශ්වාස කුමක් වුවත් එය තෝරාගැනීම හෝ ආගමක් වැලඳගැනීමට ඇති නිදහස මේ අයිතියට ඇතුළත් ය.-<br>**මානව හිමිකම් කමිටුව ප්‍රධාන ප්‍රකාශය 22**<br>ප්‍රකාශනයේ 18 වන වගන්තිය- 3 වැනි ඡේදය<br>කවර හෝ ආගමක් හෝ විශ්වාසයක් තිබීම හෝ වැලඳගැනීම කිසිසේත් සීමා නොකරයි. නැතහොත් ආගමක් හෝ විශ්වාසයක් තෝරා ගැනීමේ නිදහස සීමා නොකරයි- විශ්වාසයක් තෝරාගැනීම නොහොත් ආගමක් තිබිම හෝ පිළිගැනීමට ඇති නිදහස හෝ හෘදසාක්ෂිය හා චින්තනයේ නිදහස කෙරෙහි කවර හෝ සීමාවන් නැත.<br>5 වැනි ඡේදය- යම් ඇදහීමක් හෝ ආගමක් පිළිගැනීමට ඇති නිදහස හෝ ඇදහීම හෝ ආගමක් තෝරාගැනිමට නිදහස හිමිවෙන බව කොමිටිය නිරීක්ෂණය කරයි. යමෙකුගේ ඇදහීම හෝ ආගම අත්නොහැරීමට ඇති අයිතිය වගේම අදේවවාදය පිළිගැනීමට හෝ යමෙකු පවතින ආගම හා ඇදහීම වෙනත් ආගමකට මාරුවීමට ඇති අයිතිය ඇතුළත් වේ. |
| b | බලහත්කාරයෙන් නිදහස්වීම | මානව හිමිකම් විශ්ව ප්‍රකාශනය **(UDHR)**<br>ආගමට සහ හෘදසාක්ෂියට. සිතිමේ නිදහසට සියල්ලන්ට අයිතිය ඇත. පිලිපැදීම හා වන්දනය, භාවිතය යම් ඇදහීමක් ඉගැන්වීම හෝ ඔහුගේ ආගම ප්‍රකාශයට පත්කිරිමට, පෞද්ගලිකව සහ පොදුවේ සහ අනිකුත් ප්‍රජාව සමග හෝ තනියම යන දෙකෙන් එකක් මේ නිදහසට ඇතුළත් ය. |

| | | |
|---|---|---|
| | | **සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR)**<br>ව්‍යවස්ථාවේ 18 (2) වගන්තිය- යම් පුද්ගලයෙක්ට ඇදහීමක්, ආගමක් පිළිගැනීමට ඇති ඔහුගේ නිදහස යටපත් කරන්නට කිසිවෙක් බලපෑම් නොකළ යුතු ය.<br>**1981 මහා මණ්ඩලයේ ප්‍රකාශය 18**<br>ව්‍යවස්ථාවේ 1 (2) යම් පුද්ගලයෙක්ට ඇදහීමක් හෝ ආගමක් පිළිගැනීමට හෝ කෙනෙකුගේ නිදහසට හානිකර බලහත්කාරකමට යටත් කරන්නට කිසිවෙකුට නොහැකිය.<br>**මානව හිමිකම් කමිටුවේ විස්තර ප්‍රකාශය 22**<br>පරිච්ඡේදය 5- ව්‍යවස්ථාවේ 18 (2) යම් පුද්ගලයෙක් ඇදහීමක් හෝ ආගමක් පිළිගැනීමට ඇති නිදහස බලහත්කාරයෙන් යටපත් කරන බාධකයන්,<br>ඔවුන්ගේ ආගම නොහොත් විශ්වාසයන් වෙනස් කිරිමට, ඔවුන්ගේ ආගමික විශ්වාසයන් හා රැස්වීමට, ඇදහිල්ලක් ඇති පුද්ගලයන් හෝ ඇදහිලි විශ්වාස නොකිරීමට ඇති අයිතියට එරෙහිව කායික බලය හෝ දණ්ඩන බලය යෙදීමේ තර්ජනයන් පාවිච්චි කිරීම එම බාධකයනට ඇතුළත් ය. මේ හා සමාන ප්‍රතිපත්තීන් හෝ භාවිතයන් සමාන අපේක්ෂාවන් නොහොත් ප්‍රතිඵලයන් එබඳු ය. උදාහරණ ලෙස අධ්‍යාපනයට, සෞඛ්‍ය ආරක්ෂාවට, රැකියාවට ඇති අයිතිය ව්‍යවස්ථාවේ 25 වෙනි වගන්තියෙන් සහතික කෙරේ. ප්‍රතිඥාවේ අනිකුත් වගන්තිවල එයට සමානව ඇතුළත් ය.<br>18.2 ආගමික නොවන ස්වභාවයේ සියලු විශ්වාසයන් ඇති අය සමාන ආරක්ෂාව භුක්ති විඳිති. |
| c | **සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR)** | **යමෙකුගේ ආගම හෝ ඇදහිලි ප්‍රකාශ කිරීමට ඇති අයිතිය.**<br>වගන්තිය 18 (1) හෘදසාක්ෂිය සහ ආගම, චින්තනයේ නිදහසට සියල්ලන්ට අයිතිය තිබිය යුතු ය. භාවිතය සහ ඉගැන්වීම, පිළිපැදීම, විශ්වාසය වන්දනය කිරිම හෝ ඔහුගේ ආගම ප්‍රකාශ කිරීමට පෞද්ගලික ලෙස හෝ පොදුවේ අනිකුත් අය සමඟ ප්‍රජාවතුළ යන දෙකම මෙම නිදහසට ඇතුළත් ය.<br>විවිධ ඇදහිලි සහ විශ්වාසයන් ප්‍රකාශ කිරිමට ඇති නිදහස යටපත් විය හැකි එකම සීමාව වන්නේ මහජන ආරක්ෂාවට ඇති අවශ්‍යතාවය, සාමය, සෞඛ්‍යය, සදාචාරය හෝ මූලික අයිතිවාසිකම් සහ අන්‍යයන්ගේ නිදහස ආරක්ෂා කිරීමට නීතිය මගින් කෙරෙන සීමාව පමණි. |

| | | |
|---|---|---|
| | | **1988 එක්සත් ජාතීන්ගේ මහාසභා රැස්වීමේ ප්‍රකාශනය**<br><br>වගනතිය 1 (1) හෘදසාක්ෂිය හා ආගම, චින්තනයේ නිදහසට අයිතිය සියල්ලන්ටම තිබිය යුතු ය.භාවිතය සහ ඉගැන්වීම, පිලිපැදීම, විශ්වාසය වන්දනය කිරිම හෝ ඔහුගේ ආගම ප්‍රකාශ කිරීමට පෞද්ගලික ලෙස හෝ පොදුවේ අනිකුත් අය සමඟ ප්‍රජාවතුළ යන දෙකම මෙම නිදහසට ඇතුළත් ය.<br><br>වගන්තිය1 (3) කෙනෙකුගේ ආගම හෝ විශ්වාසයන් ප්‍රකාශ කිරිමට ඇති නිදහස යටපත් විය හැකි එකම සීමාව ලෙස නීතිය මගින් සීමා කිරිම සහ මහජන ආරක්ෂාවට ඇති අවශ්‍යතාවය, සාමය, සෞඛ්‍යය, සදාචාරය හෝ මූලික අයිතිවාසිකම් සහ අන්‍යයන්ගේ නිදහස වේ.<br><br>**මානව අයිතිවාසිකම් කමිටුවේ ප්‍රධාන ප්‍රකාශන 22**<br><br>4 වැනි ඡේදය- වන්දනයේ විශ්වාසය, පිලිපැදීම, භාවිතය, ඉගැන්වීම සහ ආගම ප්‍රකාශ කිරීමට ඇති අයිතියට පළල් පරාසයක ක්‍රියාවන් ආවරණය වේ. වන්දනාව යන සංකල්පය, වැඳුම්පිදුම් සහ විශ්වාසයට සෘජු හැගීම් ප්‍රකාශනයක් දෙන ක්‍රියා දක්වා පුළුල් ය. එමෙන්ම එබඳු ක්‍රියාවන්ට විවිධ භාවිතයන් වෙන්කළ නොහැකි ලෙස සම්බන්ධ ය. විවේක දිනවල හා නිවාඩු දිනවල ප්‍රතිපත්ති පිළිපැදීම සහ සංකේත ප්‍රදර්ශනය, වතාවත් පිරිම, වන්දනා කිරීමේ ස්ථාන ගොඩනැගිම ද එයට ඇතුළත් ය. විශ්වාසය හෝ ආගම ඇදහීම සහ පිලිවෙත් පිරීමේ ක්‍රියාවන් පමණක් නොව මෙයට ආහාර පාලන වත්පිලිවෙත් බඳු සිරිත් විරිත්, විශේෂ ඇඳුම් ඇඳිම හෝ හිසවැසිම, ජීවිතයේ නිශ්චිත අවස්ථාවන් සමඟසම්බන්ධ වත්පිළිවෙත් වලට සහභාගිවීම, කණ්ඩායමක් විසින් සුවිශේෂ භාෂාවක් භාවිතා කිරිම සහ එයට ඇතුළත් වේ. එයට අමතරව ඔවුන්ගේ මුලික කටයුතු කරන ආගමික කණ්ඩායම් විසින් පවත්වනු ලබන වෙන්කළ නොහැකි ක්‍රියාවන් ඇතුළත් විශ්වාසයන් ද අයත් ය. එමෙන්ම ප්‍රකාශන හෝ ආගමික පොතපත සකස් කිරීමට, ඔවුන්ගේ ආගමික නායකයින්, පූජකයින්, සහ ගුරුවරු තෝරාගැනීමේ නිදහස, ආගමික පාසැල් හා අධ්‍යාපනික ආයතන ස්ථාපිත කිරිමට ඇති නිදහස ද මෙයට අයත් ය. |

| | | |
|---|---|---|
| **c.i** | **වන්දනා මාන කිරිමේ නිදහස** | මහාසභාවේ ප්‍රකාශනය 1981<br>වගන්තිය 6 (අ) ආගම. හෘද සාක්ෂියට ඇති අයිතිය, සිතිමට ඇති නිදහස හෝ යම් ඇදහිල්ලක් හෝ විශ්වාසයක් දැරීමට ඇති නිදහස, "විශ්වාසය හෝ ආගමක් සමග සම්බන්ධ වී රැස්වීම හෝ වන්දනා කිරිමට"<br>වගන්තිය 6 (සී) නිදහස ඇතුලු විශ්වාසය නොහොත් ආගම, හෘද සාක්ෂිය, චින්තනයේ නිදහසට ඇති අයිතිය. "ඇදහිලි ක්‍රම හෝ ආගමක චාරිත්‍ර වාරිත්‍ර හෝ විධි වලට සම්බන්ධ අවශ්‍ය ආයිත්තම් හෝ ද්‍රව්‍ය පාවිච්චි කිරීමට හා ලබාගැනීමට"<br>**මානව හිමිකම් කොමිටියේ ප්‍රධාන ප්‍රකාශන 22**<br>4වෙනි වාක්‍ය ඛණ්ඩය- විශ්වාසයට සෘජු හැඟීම් දනවන චාරිත්‍රානුකූල වතාවත් දක්වා වන්දනාව යන සංකල්පය පුළුල් ය. අරමුණු සහ වතාවත් භාවිතය වැනි ක්‍රියා ඇතුළත් ය. |
| **c.ii** | **පූජනීය ස්ථාන** | **1981 මහා මණ්ඩලයේ ප්‍රකාශනය 1981**<br>වගන්තිය 6 (A) විශ්වාසය ඇතුළු නිදහස හෝ ආගම, හෘද සාක්ෂිය, සිතීමේ නිදහස.<br>" මෙම අරමුණ සඳහා ස්ථාන ස්ථාපිත කිරිම හා නඩත්තු කිරිමට සහ විශ්වාසය හෝ ආගමක් සමග සම්බන්ධවී රැස්විමට හෝ වන්දනා කිරිමට නිදහස."<br>**මානව හිමිකම් කමිටුවේ ප්‍රධන ප්‍රකාශය 22**<br>1 වෙනි ඡේදය- පූජනීය ස්ථාන ගොඩනැගීම දක්වා වන්දනාවේ සංකල්පය පුළුල් වේ. |
| **c.iii** | **ආගමික සංකේත** | **මහා මණ්ඩලයෙ ප්‍රකාශනය 1981**<br>වගන්තිය 6 (C) විශ්වාසය ඇතුළු නිදහස හෝ ආගමේ, හෘදසාක්ෂියේ, චින්තනයේ නිදහසට ඇති අයිතිය " විශ්වාසය හෝ ආගමක චාරිත්‍රවාරිත්‍ර හෝ විධි වලට සම්බන්ධ අවශ්‍ය ආයිත්තම් හෝ ද්‍රව්‍ය පාවිච්චි කිරීමට හා ලබාගැනීම දක්වා පුළුල් ය.<br>**මානව හිමිකම් කමිටුවේ ප්‍රධාන ප්‍රකාශය 22**<br>4වෙනි ඡේදය- වන්දනා කිරිම යන සංකල්පය, සංකේත ප්‍රදර්ශනය දක්වා පුළුල්වේ.<br>4වෙනි ඡේදය- "ආගම ඇදහිම සහ ප්‍රතිපදාව හෝ විශ්වාසයට සම්ප්‍රදායානුකූල ක්‍රියාපමණක් නොව චාරිත්‍ර වාරිත්‍ර වැනි හිස වැසීම හෝ නිශ්චිත ඇඳුම් ඇඳීම ද මෙයට ඇතුළත් වේ." |

| | | |
|---|---|---|
| **c.iv** | **විවේක හා නිවාඩු දිනවල ආගම් පිළිපැදීම** | **මහා මණ්ඩලයේ නියමයන් 1981**<br>වගන්ති 6 (h) ආගම හෝ විශ්වාසය ඇතුළු නිදහස, හෘදසාක්ෂිය, චින්තනයට ඇති නිදහස, " යමෙකුගේ ආගම හෝ විශ්වාසය ගැන ඇති ප්‍රත්‍යක්ෂ අවබෝධය සමඟ අනුකූලවන උත්සව නිවාඩු දින සැමරුම් සහ ආගම පිළිපැදීමට ඇති අයිතිය."<br>**මානව හිමිකම කොමිටියේ ප්‍රධාන ප්‍රකාශය 22**<br>4 පරිච්ඡේදයඃ වන්දනයේ සංකල්පය (..) නිවාඩු දිනවල සහ විවේක දිනවල ආගම පිළිපැදීම දක්වා දිර්ග වේ." |
| **c.v** | **පූජකයින් පත්කිරීම** | **මහා මණ්ඩලයේ නියමයන් 1981**<br>වගන්තිය 6 (g) නිදහස ඇතුළු විශ්වාසය හෝ ආගම, හෘදසාක්ෂිය, චින්තනයට ඇති අයිතිය " අදාළ පත්කිරීම් නායකයින් විසින් නම්කිරීම හෝ තේරීම, පුහුණු කිරීම"<br>**මානව හිමිකම් කොමිටියේ ප්‍රධාන ප්‍රකාශය 22**<br>4 පරිච්ඡේදයඃ " අමතරව ගුරුවරු සහ පූජකයින්, ඔවුන්ගේ ආගමික නායකයින් තෝරා ගැනීමට ඇති නිදහස වැනි ඔවුන්ගේ මූලික කටයුතු පිළිබඳ ආගමික කණ්ඩායම් විසින් ආගමේ හෝ විශ්වාසයේ ඇතුළත වෙන්කළ නොහැකි ක්‍රියාවන් භාවිතය හා ඉගැන්වීම" |
| **c.vi** | | **ලේඛන බෙදාහැරීම සහ ඉගැන්වීම (ආගමික ප්‍රචාර ක්‍රියා ඇතුලු)**<br>**1981 මහා මණ්ඩලයේ ප්‍රකාශය**<br>වගන්ති 6(d)ඃ ආගම හෝ විශ්වායසන්ගේ නිදහස ඇතුළත් හෘදසාක්ෂිය, චින්තනයට ඇති නිදහස ඇතුළත් " අදාළ ප්‍රකාශන බෙදාහැරීමේ කලාපය ඇතුළත් සහ වාද කරුණු ලිවීම"<br>වගන්ති 6(e)ඃ ආගම හෝ විශ්වාස ඇතුළත් නිදහස, හෘදසාක්ෂිය, චින්තනයේ නිදහසට ඇති අයිතිය "ඔවුන්ගේ අරමුණු සඳහා විශ්වාසකරන සුදුසු ස්ථාන, ආගමක් ඉගැන්වීමට"<br>**මානව හිමිකම් කොමිටියේ ප්‍රධාන ප්‍රකාශය 22**<br>4 ඡේදයඃ අමතරව ප්‍රකාශන හෝ ආගමික අභ්‍යාස පොත් සකස්කිරීමට හා බෙදාහැරීමට ඇති නිදහස(...) ඔවුන්ගේ මූලික කටයුතු ආගමික කණ්ඩායම් විසින් ඉගැන්වීම සහ අභ්‍යාස කිරීම" |

| | | |
|---|---|---|
| **c.vii** | ඔවුන්ගේ ළමුන්, ආගම සහ සදාචාරමය අධ්‍යාපනය සහතික කිරීමට දෙමාපියන්ට ඇති අයිතිය. | **සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR)**<br><br>18 (4) වගන්තියඃ ඔවුන් සමඟම අනුකුලවන්නා වූ ඔවුන්ගේ ළමුන්ගේ ආගම සහ සදාචාරමය අධ්‍යාපනය සහතික කිරීමට නිත්‍යානුකූල භාරකරුවන්ට අදාළ වනවිට සහ රාජ්‍යයන්ගේ පාර්ශවයන් වර්තමාන ප්‍රඥාප්තියට අනුව දෙමාපියන්ගේ නිදහසට ගරු කළයුතුවේ.<br><br>**ළමා අයිතිවාසිකම් සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (CRC)**<br><br>14 වෙනි වගන්තිය (2)-ළමයාගේ සකස්වීමේ පරිමාව සමඟ එකඟත්වය ඇති චාරිත්‍රයක් ඔහුගේ හෝ ඇයගේ අයිතිය භාවිතා කිරිමට, මග පෙන්වීමට නිත්‍යානුකූල භාරකරුවන්ට අදාළවන විට සහ දෙමාපියන්ගේ අයිතීන්ට හා කාර්‍යයන්ට රාජ්‍යය පාර්ශවයන් ගරුකළ යුතු ය.(....) ඔහු හෝ ඇයගේ උත්පත්තියෙන්ම වියහැකි ශිෂ්ඨාචාරමය වශයෙන් වෙනස් රටක භාෂාව හා ජාතික අගයන් සඳහා ඔහුගේම හෝ ඇයගේම සංස්කෘතික අනන්‍යයතාවයට, දරුවන්ගේ දෙමාපියන්ට ගරු කිරීම දියුණු කිරීම"<br><br>**සමාජ, ආර්ථික හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICESCR)**<br><br>13(3) වගන්තිය- ඔවුන්ගේම විශ්වාසය සමඟ අනුකුලවන ආගමික හා ඔවුන්ගේ ළමුන්ගේ සදාචාර අධ්‍යාපනය සහතික කිරීම (....)නිත්‍යානුකූල භාරකරුවන්ට අදාළ වනවිට සහ දෙමාපියන්ගේ නිදහසට ගරුකළයුතු බවට වූ වත්මන් ප්‍රඥාප්තිය රාජ්‍යයන්ගේ පාර්ශවයන් පිළිගනී.<br><br>**සංක්‍රමණික සේවක ප්‍රඥප්තිය (Migrant Workers Convention)**<br><br>වගන්තිය 12 (4)ඔවුන්ගේම විශ්වාසය සමඟ අනුකුලවන ආගමික හා ඔවුන්ගේ ළමුන්ගේ සදාචාර අධ්‍යාපනය සහතික කිරීම නිත්‍යානුකූල භාරකරුවන්ට අදාළවන විට සහ අවම වශයෙන් දෙමපියන්ගෙන් එක් අයෙක් සංක්‍රමණික සේවකයෙක් වනවිට දෙමාපියන්ගේ නිදහසට ගරුකළයුතු බවට වූ වත්මන් ප්‍රඥාප්තිය රාජ්‍යයන්ගේ පාර්ශවයන් පිළිගනී.<br><br>1981 මහා මණ්ඩලයේ ප්‍රකාශනය<br><br>5 වන වගන්තිය<br><br>1 ඔවුන්ගේ ආගම හෝ විශ්වාසය සහ සදාචාරමය අධ්‍යාපනය සිතේ දරාගැනීමෙන් දරුවන් ඇතිදැඩි වියයුතුය යන විශ්වාස අනුව පවුල තුළ දරුවන්ගේ ජීවිතය සංවිධානය කිරීමට දෙමාපියන්ට හෝ |

| | | |
|---|---|---|
| | | 2 ළමා පැවැත්මේ මාර්ගෝපදේශන ප්‍රතිපත්ති පිළිබඳව වඩාත්ම යහපත, ඔහුගේ දෙමාපියන්ගේ හෝ නිත්‍යානුකුල භාරකරුවන් විශ්වාස කරන කැමැත්ත හෝ ආගමට එරෙහි අධ්‍යාපනය ලැබීමට බල නොකිරීම සහ ඇතැම් විට නිත්‍යානුකුල භාරකරුවන් ලෙස හෝ ඔහුන්ගේ දෙමාපියන්ගේ කැමැත්ත සමඟ එයට අනුව විශ්වාසය හෝ ආගම පිළිබඳ අධ්‍යාපනයට ඇති ප්‍රවේශය සෑම ළමයාම භුක්ති විඳියි.<br>3. නිත්‍යානුකූල භාරකරුවන්ගේ හෝ ඔහුගේ දෙමාපියන්ගේ යන දෙපාර්ශවයෙන්ම රැකවරණය නොමැති ළමයෙක් සම්බන්ධ අවස්ථාවල දී,ළමා පැවැත්මේ මාර්ගෝපදේශන ප්‍රතිපත්ති පිළිබඳව වඩාත්ම යහපත්, විශ්වාසය හෝ ආගම පිලිබඳ කාරණයේ දී ඔවුන්ගේ කැමැත්ත කිසියම් ආකාරයකට වෙනත් සාධක තුළින් තහවුරු කළ කැමැත්ත භාරගතයුතු ය. |
| **c.viii** | **ජාතික හා ජාත්‍යන්තර මට්ටම්වල දී ආගමික කාරණා මත ප්‍රජාවන් සහ පුද්ගලයින් සමඟ අදහස් හුවමාරුව.** | මහා මණ්ඩලයේ ප්‍රකාශනය 1981<br>ව්‍යවස්ථාව 6 (i) ජාතික හා ජාත්‍යාන්තර මට්ටමේ දී ආගම හා විශ්වාසය පිළිබඳ පෞද්ගලික සහ ප්‍රජාකටයුතු සමඟ අදහස් හුවමාරු කිරීම පවත්වාගෙන යෑමේ නිදහසට, ආගම හෝ විශ්වාසයට , හෘද සාක්ෂියට, චින්තනයේ නිදහසට ඇති අයිතියට ඇතුළත් ය. |
| **c.ix** | **පුණ්‍ය ආයතන සහ මානුෂීය ආයතන සහ සමාජ සංවිධාන පිහිටුවීම, පවත්වාගෙන යෑම හා අරමුදල් ලබාගැනිම.** | මහා මණ්ඩලයේ ප්‍රකාශනය 1981<br>වගන්තිය 6 (b) "අදාළ පුණ්‍ය හෝ මානුෂිය සංවිධාන පිහිටුවීම සහ නඩත්තු කිරීම" ආගමට හෝ විශ්වාසයට, හෘද සාක්ෂියට, චින්තනයේ නිදහසට ඇති අයිතියට ඇතුළත් ය.<br>වගන්තිය 6 (f) "ස්වෙච්ඡාවෙන් ලබාදෙන මුදල් සහ ආයතන හා පුද්ගලයින් ගේ ආධාර සමාජ සංවිධානවලට ලබාගැනීමේ නිදහසට"ආගම හෝ විශ්වාසයට, හෘද සාක්ෂියට, චින්තනයේ නිදහසට ඇති අයිතියට ඇතුළත් ය. |

| | | |
|---|---|---|
| **c.x** | ලියාපදිංචිය | **මානවහිමිකම් කොමිසමේ යෝජනා 2005 / පරිච්ඡේදය 40/ 4 (C) සහ මානවහිමිකම් කවුන්සිලයේ යෝජනා පරිච්ඡේදය 6/37( 12 (ඉ) සහ 12 (h)**<br><br>උනන්දු කරවීම - "පෞද්ගලිකව හෝ ප්‍රසිද්ධියේ සහ අන් අය සමග ප්‍රජාව තුළ හෝ තනියම, ඔවුන්ගේ ආගම හා විශ්වාසය ප්‍රකාශ කිරීමට ඇති අයිතිය සහතිකක කිරීමේ අදහසින් පවතින භාවිත නියමයන් විමසීම සැමවිටම අදාළ වේ.<br><br>උනන්දුකරවීම, "මානුෂිය නැත්නම් පුන්‍යාධාර, ආගමික ආයතන පිහිටුවීම හා නඩත්තු කිරීමට කණ්ඩායම්වල සියළු පුද්ගලයින් සහ සාමාජිකයින් සඳහා නිදහස ජාත්‍යාන්තර මානවහිමිකම් නීතිය සමග අනුකූලවන සහ අදාළ ජාතික ව්‍යවස්ථාදායකය අනුව සම්පූර්ණයෙන් ගරුකිරීමට සහ ආරක්ෂා කිරිමට සහතික කෙරේ." |
| **c.xi** | හෘදසාක්ෂියට එරෙහිවීම | **මානවහිමිකම් ප්‍රධාන කමිටුව 22**<br><br>**11 පරිච්ඡේදය**<br><br>බොහෝ පුද්ගලයින් වගන්ති අංක 18 යටතේ තමන්ට ලැබී ඇති නිදහසෙන් උත්පත්තිය ලබන එබඳු අයිතියක පදනම මත හමුදාවේ සේවය කිරීම ප්‍රතික්ෂේප කිරිමට (හෘදසාක්ෂියට විරුද්ධව) ඇති අයිතිය ගැන පැමිණිළිකර තිබේ. එයට ප්‍රතිචාර වශයෙන් නිර්ව්‍යාජ ලෙෂ මිලිටරි සේවා ක්‍රියාකාරකම් තහනම් කරඇති අනිකුත් විශ්වාසයන් හෝ ආගම් අදහන්නවුන් අනිවර්යෙන් මිලිටරි සේවාවේ යෙදීම නීතියෙන් ඉවත්කර විකල්ප ජාතික සේවයට අනුයුක්තකර ඇත. ප්‍රඥාප්තිය පැහැදිළි ලෙස හෘද සාක්ෂීයේ විරෝධයට අදාළ නොවන නමුත් වගන්ති අංක18න් එවැනි අයිතියක් මතුවන බව කමිටුවේ විශ්වාසයයි. එබැවින් අයෙකුගේ ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරීමේ අයිතියට සහ හෘද සාක්ෂියේ නිදහස සමග අවශ්‍යයෙන්ම කළයුතුය යන්න බලහත්කාරය දරුණු ලෙස ගැටීමට පුළුවන. නීතියෙන් හා භාවිතයෙන් මෙම අයිතිය පිළිගන්නා විට ඔවුන්ගේ සුවිශේෂ වූ විශ්වාසයේ ස්වභාවයේ පදනම මත හෘදසාක්ෂියට විරුද්ධ වන්නන් අතර වෙනසක් ඇති නොවේ. ඒ වගේම මිලිටරි සේවාව ක්‍රියාත්මක කිරීමට ඔවුන් අසමත්වීම හේතුකොටගෙන හෘදසාක්ෂියට එරෙහි වන්නන්ට එරෙහිව වෙනස්කොට සැළකීමක් වෙන්නේ නැත. ජාතික සේවාවේ පරිමාව හා ස්වභාවය මත සහ 18වෙනි වගන්තිය යටතේ ඔවුන්ගේ අයිතිවාසිකම්වල පදනම මත හමුදාසේවයෙන් පුද්ගලින් ඉවත්කර තබන කොන්දේසි වාර්තා කිරිමට කමිටුව රාජ්‍ය පාර්ශවයට ආරාධනා කරයි. |

| 2 වෙනස්කොට සැළකීම | | |
|---|---|---|
| 2. A | ඉවසීම/අන්තර් ආගමික වෙනස්කොට සැළකීම/ විශ්වාසය හෝ ආගමික පදනම මත වෙන්කොට සැලකීම | **සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR)**<br>වගන්තිය 2 (1) එබඳු, කිසිම ආකාරයක වෙනසකින් තොරව, වත්මන් ප්‍රඥාප්තියෙන් අයිතිවාසිකම් පිළිගෙන තිබෙන්නා වූ අයිතිවාසිකම් එහි අධිකරණ බල ප්‍රදේශයට යටත් සහ එහි භූමිප්‍රදේශය තුළ සියලුම පුද්ගලයින්ට සහතික කිරිමට සහ ගරුකිරිමට එක් එක් රාජ්‍ය පාර්ශවයන් පිළීගනී. (....) ආගම (...)<br>වගන්තිය 5 (1):"වර්තමාන ප්‍රඥප්තිය තුළ සපයා දී තිබෙනවාට වඩා ඔවුන්ගේ සීමාවන් පුළුල් කිරිමට හෝ මෙහි සඳහන් පිළිගත් නිදහස සහ යම් අයිතිවාසිකම් කඩා බිඳදැමීම අරමුණුකරගත් කිසියම් කාර්යක හෝ කිසියම් පුද්ගලයෙකුට, කණ්ඩායමකට හෝ රාජ්‍යයකට සම්බන්ධවීම සඳහා වර්තමාන ප්‍රඥාප්තිය තුළ අර්ථකථනය කළ නොහැකි ය."<br>වගන්තිය 26:"කිසිම වෙනස්කොට සැළකීමකින් තොරව නීතියේ සමාන ආරක්ෂාවේ හිමිකම ලබාදීම සහ නීතිය ඉදිරියේ සියළුදෙනා සමාන ය. එබඳු ඕනෑම තත්ත්වයක් මත වෙනස්කොට සැළකීමට එරෙහි ඵලදායි ආරක්ෂාව සහ සියලු පුද්ගලයින්ගේ සමානව<br>මෙම ගරුකිරීම තුළ වෙනස් කොටසැලකිම තහනම් වේ."<br>27 වගන්තිය : "වාර්ගික, ආගමික හෝ භාෂාමය සුළුතරයන් සිටින රාජ්‍යයන් තුළතමන්ගේම භාෂාව පාවිච්චි කිරීමට හෝ තමන්ගේම ඇදහීම සහ ප්‍රකාශ කිරීමට සහ තමන්ගේම වූ සංස්කෘතිය තම කණ්ඩායමේ අන්‍යයන් සමඟ භුක්ති විඳීමට එබඳු සුළුතරයට අයිති පුද්ගලයින්ට හිමි අයිතිය ප්‍රතික්ෂේප නොකළ යුතු ය."<br>**සකළ ආකාර වෙන්කොට සැළකීමට එරෙහි ප්‍රඥප්තිය (ICERD)**<br>5 වගන්ති : (....)"නීතිය ඉදිරියේ සමානත්වයට, වාර්ගික ප්‍රභවය හෝ ජාතිය හෝ වර්ගය වර්ණය ලෙස වෙනස් කමක් නැතිව සියල්ලන්ගේ අයිතියට, වගකීමට සහ සියලු වර්ගයේ වාර්ගික වෙනස්කම් තහනම් කිරීමට හා මුලිනුපුටා දැමීමට රාජ්‍ය පාර්ශවයට වගකීම පැවරේ. පහත සඳහන් අයිතීන් සැළකිය යුතු වේ. (...) (ඩී) අනිකුත් සිවිල් අයිතිවාසිකම්, විශේෂයෙන්ම (...)VII හෘදසාක්ෂිය හා ආගම, සිතීමේ නිදහසට ඇති අයිතිය."<br>**ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICESCR)**<br>1 වගන්ති :"වත්මන් ප්‍රඥාප්තිය ප්‍රකාශයට පත්කර ඇති, රාජ්‍ය පාර්ශවයන් පිළිගෙන තිබෙන අයිතිවාසිකම් (...) ආගම (....) එබඳු ඕනෑම වර්ගයේ වෙනස් ලෙස සැළකීමකින් තොරව වත්මන් ප්‍රඥාප්තිය තුළ අභ්‍යාස කෙරේ." |

| | | |
|---|---|---|
| | **ඉදිරියට**<br><br>**ඉවසීම/අන්තර් ආගමික වෙනස්කොට සැලකීම/ විශ්වාසය හෝ ආගමික පදනම මත වෙන්කොට සැලකීම** | **ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (CRC)**<br><br>30 වගන්තිය :"වාර්ගික, ආගමික හෝ භාෂාමය සුළුතරයන් හෝ ආදිවාසි ප්‍රභවයක් ඇති පුද්ගලයින් සිටින රාජ්‍යයන් තුළ තමන්ගේම භාෂාව පාවිච්චි කිරීමට හෝ තමන්ගේම ඇදහීම සහ ප්‍රකාශ කිරීමට සහ තමන්ගේම වූ සංස්කෘතිය තම කණ්ඩායමේ අන්‍යයන් සමඟ භුකති විදිමට එබඳු සුළුතරයට හෝ ආදිවාසින්ට අයිති පුද්ගලයින්ට හිමි අයිතිය ප්‍රතික්ෂේප නොකළ යුතු ය."<br><br>**මහා මණ්ඩලයේ ප්‍රකාශනය 1981**<br><br>වගන්තිය. 2(1): "අනිකුත් විශ්වාසයන් හා ආගමේ හේතුව මත පුද්ගල හෝ පුද්ගල කණ්ඩායම් කුමණ හෝ රාජ්‍ය ආයතනයක් විසින් කිසිම අයෙක් වෙනස්කොට සැළකීමට යටත් නොවේ."<br><br>වගන්තිය.3:"එක්සත් ජාතින්ගේ අධිකාරි පත්‍රයේ මූලධර්ම වලින් ප්‍රතික්ෂේප කිරීමක් සහ මානව ගරුත්වයට අවඥාවක් අඩංගු විශ්වාස සංස්ථාපනයන් හෝ ආගමේ පදනම මත මනුෂ්‍ය වර්ගයා අතර වෙනස්කම් සහ ජාතීන් අතර මිත්‍රත්වය සහ සාමකාමී සම්බන්ධකම්වලට බාධාවක් ලෙස සහ මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තියේ ප්‍රකාශයට පත්කර ඇති මූලික නිදහස මානව හිමිකම් කඩකිරීම වරදක් බව තීන්දු කරයි. තව ද, ජාතීන් අතර මිත්‍රශීලි සාමකාමී සම්බන්ධතාවයන්ට බාධකයක් ලෙස සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රඥාප්තියේ මූලික අයිතිවාසිකම් ප්‍රකාශනයේ මානව හිමිකම් උල්ලංඝනයේ වරදක් බව තීරණය කරයි"<br><br>වගන්තිය. 4 (1):"සමාජ හා සංසකෘතික ජීවිතය, දේශපාලන, ආර්ථික සියලු සිවිල් ක්ෂේත්‍රයන් හී මූලික නිදහස සහ මානව හිමිකම් භුක්ති විඳීම සහ විශ්වාස පිළිගැනීම හෝ ආගම හේතු කොටගෙන වෙනස්කම් වැළකීමට හා මුලිනුපුටා දැමීමට සියලුම රාජ්‍යයන් ඵලදායි පියවරයන් ගතයුතු ය."<br><br>වගන්තිය. 4 (2):" ආගම හෝ අනිකුත් විශ්වාසයන් පිළිබඳ මේ කාරණයේ විෂය මත නොයිවසීමට එරෙහි සටන් වැදීමට අදාළවන්නා වූ සියලුම ක්‍රියාමාර්ගයන් ගැනීමට එවැනි ඕනෑම වෙනස් කොටසැළකීම් තහනම් කිරීමට අවශ්‍ය තැන්වල දී නීති පැනවීමට හෝ අවලංගු කිරීමට සියලු රාජ්‍යයන් උත්සහ කරනු ඇත.<br><br>**මානව හිමිකම කමිටුවෙ මහ සභාවේ ප්‍රකාශය 22**<br><br>2 ඡේදය: "එමනිසා ඉතා ප්‍රභල ආගමික ප්‍රජාවකගේ කොටසක් මත එදිරිවාදි යටපත් කිරීමක් වියහැකි සුළුතර ආගමික නියෝජනය හෝ ඒවා මෑතක ස්ථාපිතවූ බවට සාධක ඇතුළුව කිසියම් හේතුවක් නිසා ඕනෑම ආගමක් හෝ විශ්වාසයකට එරෙහි වෙනස්කොට සැලකෙන යම් |

| | | |
|---|---|---|
| 2. b. | රාජ්‍ය ආගම | **මානව හිමිකම් කොමිටියේ ප්‍රධාන ප්‍රකාශය 22**<br>9 වෙනි ඡේදය: "එහි ජනගහනයේ බහුතර අනුගාමිකයින් සමන්විත හෝ පරම්පරාගත හෝ නිල ලෙස එය ස්ථාපිතව් තිබෙන හෝ රාජ්‍ය ආගමක් ලෙස ආගමක් පිළිගෙන තිබෙන සාධකය, ප්‍රඥාප්තිය යටතේ 18 සහ 27 වගන්තිවල ඇතුළත් අයිතිවාසිකම් භුක්ති විඳිමට හානිකර ප්‍රතිඵලයක් නොවනවා මෙන්ම ආගම් පිළිනොගන්නා අයට සහ අනිකුත් ආගම්වල භක්තිකයින්ට එරෙහි වෙනස් කොට සැළකීමක් සිදු නොවන්නේ ය.<br>26. වගන්තිය යටතේ සමාන ආරකෂාවේ පිලිගැනීම සහ ආගම හෝ විශ්වාසය මත වෙනස්කොට සැළකීමේ තහනම සමඟ අනුකූල නොවී තිබෙන, අනිකුත් භක්තීන් ඇදහීම මත විශේෂ බාධාවන් පැමිණවිම හෝ ඔවුන්ට ආර්ථික වරප්‍රසාද ලබාදීම හෝ බලවත් ආගමේ සාමාජිකයින්ට ආණ්ඩුවේ සේවාවන් සඳහා යෝග්‍යතාවයට අවහිරවන ලෙස විශේෂයෙන්ම, දෙවනුවට සඳහන් කළ වෙනස්කොට සැලකීමට එරෙහි නිශ්චිත පියවරයන් ඇතුළත් වේ.<br>එම කණ්ඩායම් දෙසට ඍජු වධ බන්ධනයන් හෝ ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට එරෙහිව 18 සහ 27 යන වගන්ති වලින් පිළිග නු ලැබූ අයිතිවාසිකම් අභ්‍යාස කිරිමට අනිකුත් ආගමික කණ්ඩායම්වල සුළුතර ආගමිකයින්ගේ අයිතිවාසිකම් කඩකිරීමට එරෙහිව සංස්ථාපිත වැදගත් ආරක්ෂාවන් ප්‍රඥාපතියේ 20 වගන්තියේ 2වෙනි පරිච්ඡේදය මගින් පියවර ගැන සළකා තිබේ.<br>වෙනස්කොට සැලකීමෙන් ඔවුන්ගේ බැතිමතුන් ආරක්ෂා කිරිමට සහ බාධාවන්ගෙන් තොරව විශ්වාසයන් සහ සියලු ආගම් ඇදහීම ආරක්ෂා කිරිමට රාජ්‍ය පාර්ශවයන් විසින් තම සැලකිල්ල යොමුකර ගෙන ඇති පියවරයන් දැනුම්දීමට කමිටුව බලාපොරෙත්තු වේ. සමාන ලෙස, රාජ්‍ය පාර්ශවයන් විසින් ක්‍රියාත්මක කරතිබෙන 27වෙනි වගන්තිය යටතේ සුළුතර ආගමිකයින්ගේ අයිතියට ගරුකිරීමට සමාන තොරතුරු රාජ්‍ය පාර්ශවයන් විසින් ක්‍රියාවට නගා තිබෙන ආගම සහ විශ්වාසයට, චින්තනට, හෘදසාක්ෂියේ නිදහසට ඇති අයිතිය පුළුල් කිරීම තක්සේරු කිරිමට 27 වෙනි වගන්තිය යටතේ සුළු ජාතින්ගේ අයිතින් සඳහා ගරු කිරීමට අදාළ තොරතුරු කොමිටියට අවශ්‍ය කෙරේ. භක්තියෙන් තොර නිසා දඬුවම් කිරීමට නීතිවිද්‍යාව හා ඔවුන්ගේ නීතියෙන් සළසන භාවිතයනට සම්බන්ධ ඔවුන්ගේ තොරතුරු වාර්තා රාජ්‍ය පාර්ශවයන් ඔවුන්ගේ වාර්තාවල ඇතුළත් කළ යුතු වේ.<br>4 වෙනි ඡේදය- පාලක පක්ෂය යනාදියේ ව්‍යවස්ථා, ආඥාපනත්, ප්‍රකාශන නිල දෘෂ්ඨිවාද ලෙස විශ්වාස සමූහයක් ලෙස සළකන්නේ නම් හෝ සත්‍ය භාවිතය තුළ එයට විරුද්ධ වන අය හෝ දෘෂ්ඨිවාදය පිළිනොග න්න පුද්ගලයින්ට එරෙහිව ප්‍රඥාප්තියෙන් පිළිගෙන ඇති අනිකුත් අයිතිවාසිකම් යටතේ ඉඩක් නැත. එමෙන්ම 18වෙනි වගන්තිය යටතේ එය නිදහසට අවහිරවන ප්‍රතිඵලයක් නොවිය යුතු ය. |

| 3 පීඩාවට පත්වියහැකි කණ්ඩායම් | | |
|---|---|---|
| 3. ඈ. | කාන්තාවන් | **සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR)**<br>5 වගන්තිය (1):"වර්තමාන ප්‍රඥාප්තියෙන් සළසනවාට වඩා ඔවුනගේ සීමාවන් වඩා පුළුල් කරන්නට හෝ එයින් පිළිගෙන තිබෙන නිදහස සහ යම්කිසි අයිති වාසිකමක් කඩාදැමීමෙහි ඉලක්කගත යම් ක්‍රියා හෝ ක්‍රියාවකට සම්බන්ධවීමට කිසියම් රාජ්‍යයකට, කණ්ඩායමකට හෝ පුද්ගලයෙකුට කිසියම් අයිතියක් ඇති බවට ඇඟවෙන පරිදි අර්ථ නිරූපනය කිරීමේ හැකියාවක් වර්තමාන ප්‍රඥාප්තියේ නැත."<br>වගන්තිය 18. (3): "යම් අයෙකුගේ විශ්වාසය හෝ ආගම ප්‍රකාශ කිරිමේ එකම සීමාවන් විය හැකිවන්නේ අන්‍යයන්ගේ නිදහස, මූලික අයිතිවාසිකම්, සදාචාරය, සෞඛ්‍ය, සාමය සහ මහජන ආරක්ෂාව රැකගැනීමට නීතියේ අවශ්‍යතාවය මගින් පනවන සිමාවන් ය.<br>**කාන්තා ප්‍රඥප්තිය. (CEDAW)**<br>වගන්තිය2: "අවසානයේ පිළිගෙන තිබෙන සහ කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කොට සැළකීම මුලිනුපුටා දමන ප්‍රතිපත්තියක් ප්‍රමාදයකින් තොරව සහ සියලුම අදාළ ක්‍රමයන් මගින් කරගෙන යැමට එකඟවෙන අතරම රාජ්‍ය පාර්ශවයන් කාන්තාවන්ට එරෙහි සියලුව ආකාරයේ වෙනස්කොට සැලකීම් සදොස් බව ප්‍රකාශ කරයි.<br>(a) මෙම මූලධර්ම පිළිබඳ ප්‍රයෝගික නිරූපනය , අනිකුත් අදාළ ක්‍රියාවන් නීතිය මගින් සහතික කිරිමට සහ තවම අනිකුත් අදාල ව්‍යවස්ථාමය නීතිගත කිරීම් කරනැතිනම් හෝ ඔවුනගේ ජාතික ව්‍යස්ථාවේ පිරිමින්ගේ හා කාන්තාවන්ගේ සමානත්මතාවයේ මූල ධර්ම ඇතුළත් කිරිමට;<br>(b)කාන්තාවන්ට එරෙහි සියලු වෙනස් කොට සැළකීම තහනම් කිරීම, අදාළ අවස්ථාවන් හී දි දඬුවම් පැමිණවීම ඇතුළත් අනිකුත් පියවර සහ අදාළ ව්‍යවසථාකුලව පිලිගැනීමට;<br>(c) වෙනස්කොට සැළකීමේ ඕනෑම ක්‍රියාවන්ට එරෙහිව කාන්තාවන් පිලිබඳ අනිකුත් ඵලදායි ආකාරක ආයතන සහ සුදුසු ජාතික විනිශ්චය සභා තුළින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහතික කිරීමට සහ පිරිමි සමඟ සමාන පදනමක් මත කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කරන නීති ස්ථාපිත කිරිමට;<br>(d) මෙම බැඳීම සමඟ අනුකූලත්වයකින් ආයතන ක්‍රියා කිරිම සහ රජයේ අධිකාරිය සහතික කිරිමට සහ කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැලකිමේ ක්‍රියාවන් හෝ එයට එම ක්‍රියාවන්ට සම්බන්ධවිමමෙන් වැළැක්වීමට;<br>e)කිසියම් ව්‍යාපාරයක්, සංවිධානක්, පුද්ගලයෙක් විසින් කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැළකීමට එරෙහි අදාළ |

| | | |
|---|---|---|
| | | e) කාන්තාවන්ට එරෙහි වෙනස්කම් කිරීමෙන් යුක්ත චාරිත්‍ර සහ ක්‍රියාවන් ඇතුළත් රෙගුලාසි පවතින නීති රීති අහෝසි කිරීම හෝ වෙනස් කිරීමට ව්‍යවස්ථාදායකය ඇතුළත් සියලු අදාළ පියවර ගැනීමට;<br><br>උ)කාන්තාවන්ට එරෙහි වෙනස් කොට සැළකීම ඇතුළත් සියලු ජාතික දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීමට;<br><br>වගන්තිය. 3ඃ "පුරුෂයින් සමඟ සමානාත්මතාවයේ පදනමක් මත මූලික නිදහස හා මානව හිමිකම් භුක්ති විඳීම සහ ඒවා පාවිච්චි කිරීමේ අරමුණ සඳහා පූර්ණ අභිවෘද්ධිය හා සංවර්ධනය සහතික කිරීමට සියලු අදාළ පියවරයන් ව්‍යවස්ථාවට ඇතුල් කිරීම, විශේෂයෙන් දේශපාලන, සමාජ, ආර්ථික. සහ සියලු සංස්කෘතික ක්ෂේත්‍රයන් හි රාජ්‍ය පාර්ශවයන් පියවර ගනී."<br><br>**ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ප්‍රඥප්තිය (ICESCR)**<br><br>වගන්තිය 2 (2)ඃ"උපත හෝ අනිකුත් තත්ත්වයන්, දේපොළ, ජාතික හෝ සමාජ මූලය, දේශපාලන හෝ වෙනත් අදහස්, ආගම, භාෂාව, ලිංගිකත්වය යන ඕනෑම වර්ගයක පාට වර්ග ලෙස කිසිම වෙනස්කොට සැළකීමකින් තොරව භාවිතයේ යෙදීමට වර්තමාන ප්‍රඥාප්තියෙන් ප්‍රකාශයට පත්කර ඇති අයිතිවාසිකම් සහතික කිරීමට රාජ්‍ය පාර්ශවයන් බැඳී සිටී."<br><br>**මානව හිමිකම් කමිටුවේ පොදු ප්‍රකාශය 28**<br><br>.ඡේදය 13ඃ"ප්‍රසිද්ධියේ කාන්තාවන් අඳින ඇඳුම් පිලිබඳව යම්කිසි විශේෂ රෙගුලාසි සම්බන්ධ තොරතුරු රාජ්‍යයන්ගේ පාර්ශවයෙන් ඉදිරිපත්කළ යුතු ය. උදාහරණයක් ලෙසින් ව්‍යවස්ථාව 26 සහතික වූ අයිතීන් ගණනාවක් උල්ලඝනයක් විය හැකි එබඳු රෙගුලාසි කොමිටිය අවධාරණය කරයි. එවැනි රෙගුලාසි වලංගු කිරීමේ අදහසින් ශාරීරික දඬුවම් පනවන්නේ නම්, 9වෙනි වගන්තියේ අත්අඩංගුවට ගැනීමෙන් දඬුවම් කිරීමේ නියමය සමඟ අන්‍යයන්ගේ කැමැත්තට එකඟවීමට අසමත්වන විට 12වෙනි වගන්තියේ එවැනි බලහත්කාරයකට යැම් ඒම් නිදහස යටත් වන්නේ නම් 17වෙනි වගන්තියේ නීති විරෝධී මැදිහත්වීම් හෝ බලහත්කාරයෙන් තොරව සියලු පුද්ගලයින්ට පෞද්ගලිකත්වයට ඇති අයිතිය, 18 සහ 19 වෙනි වගන්තියේ ඇඳිමේ නියමයන්ට කාන්තව යටත්වන විට ඔවුන්ගේ ස්ව ප්‍රකාශනයේ අයිතිය හෝ ඔවුන්ගේ ආගම සමඟ තබාගැනීමට නොහැකිය. සහ අවසාන වශයෙන් 27 වෙනි වගන්තියේ සංස්කෘතිය සමඟ ඇඳුමේ අවශ්‍යතාවය ගැටෙන විට තමන්ගෙ අයිතිය කාන්තාවන්ට ඉල්ලා සිටින්නට පුළුවන." |

| | | |
|---|---|---|
| | | 19 වැනිඡේදයඃ-"විවහාකත්වය හෝ ලිංගිකත්ව හේතුව මගින් නිරන්තරයෙන් අඩු ලුහුඬුකමට භාජනයවන කාන්තවන් සඳහා සුවිශේෂ අයිතීන් ඇතිව නීතිය ඉදිරියේ පුද්ගලයෙක් ලෙස සෑම තැනකදීම සියලු දෙනාගේ අයිතිවාසිකම් 16වැනි වගන්තිය යටතේ පිලිගෙන තිබේ. කිසියම් අනිකුත් වෙනස් හේතුන් හෝ විවහාක තත්ත්වයේ පදනම මත අනිකුත් සිවිල් අයිතිවාසිකම් භාවිතා කිරිමට බාධාවන් නොතිබියයුතු වේ. කොන්ත්‍රාත්වලට ඇතුලුවීම, තමන්ගේ දේපොළට කාන්තාවන්ගේ හැකියාව මෙම අයිතියෙන් අදහස් කරයි. ඔහුගේ පවුලට, මියගිය සැමියාගේ, දේපොළ සමඟ ද්‍රව්‍යයන් ලෙස කාන්තාවන්ට නොසැළකියයුතු බවද මෙයින් අදහස් කරයි. එවැනි සැළකිල්ලකට ඉඩදෙන ක්‍රියාවන් හෝ නීති මුලිණුපුටා දැම්මට පියවර ගැනීම සහ පූර්ණ නිත්‍යානුකූළ පුද්ගලයෙකු ලෙස ක්‍රියාකාරිවීමෙන් හෝ පීඩාවන්ගෙන් කාන්තාවන් වළක්වාගැනිමේ ක්‍රියාවන් හෝ නීතියේ ඒ පිලිබඳ තොරතුරු රාජ්‍යය සැපයිය යුතු ය.<br><br>**21වෙනි ඡේදය** වෙනස්කොට සැළකිමකින් තොරව සහ සමාන නියමයන් මත පුරුෂ හා කාන්තා යන දෙපාර්ශවය සඳහා නීතිය අභ්‍යස කිරිමෙන් ආරක්ෂා කිරිම සහතිකකර, යමෙකුගේ ආගම හෝ විශ්වාසය ප්‍රකාශ කිරිමට සහ විශ්වාසය හෝ ආගම වෙනස් කිරිමට නිදහස ඇතුළු යමෙකුගේ විශ්වාසය හෝ ආගමක් පිලිගැනීමේ නිදහස සහ හෘද සාක්ෂියේ, චින්තනයේ නිදහස සහතික කිරීමට රාජ්‍ය පාර්ශවයන් පියවර ගතයුතුය. පියවරුන්, ස්වාමි පුරුෂයින්, සහෝදරයින් හෝ අනකුත් අයගේ මැදිහත්විම මගින් හෝ තෙවන පාර්ශවයන්ගෙන් අවශ්‍ය කරන අවසරය මගින් බාධා නොකළ යුතු සහ ප්‍රඥාපතියෙන් ඒවාට ලබාදි ඇති බලයට වඩා අනිකුත් බාධාවන්ට යටත් නොකළ යුතු බව 18වෙනි වගන්තියෙන් මේ නිදහස ආකරක්ෂාකර තිබේ. ආගමේ සහ හෘදසාක්ෂිය, චින්තනයේ නිදහසට සම්බන්ධ වෙනත් ලියවිලි මගින් කාන්තාවන්ට එරෙහි වෙනස්කොට සැළකීම සාධාරණය කිරිමට 18වෙනි වගන්තියෙන් කියවෙන්නේ නැත. එමනිසා වෙනස්කොට සැලකිමට එරෙහි ඔවුන්ගේ අයිතිය ආරක්ෂා කිරීමට සහ කාන්තාවන්ගේ එම නිදහසට ගරුකිරිමේ බාධාවන් වැළැක්විම සහ මුලින් උපුටා දැම්ම යන දෙකම ගැනීමට අදහස් කරන හෝ ඔවුන් ගෙන තිබෙන්නා වූ පියවර පෙන්වා දීම සහ ආගම හා හෘද සාක්ෂිය, ඔවුන්ගේ චින්තනයේ නිදහස සම්බන්ධවන බැවින් කාන්තාවන්ගේ තත්ත්වයන් මත රාජ්‍ය පාර්ශවය තොරතුරු සැපයිය යුතු ය." |

| | | |
|---|---|---|
| | **ඔවුන්ගේ නිදහසින් පුද්ගලයින් ඉවත්කිරිම** | **මානව හිමිකම් කමිටුවේ පොදු ප්‍රකාශනය 22.**<br>ඡේදය. 8: මේ වනවිටත් නිශ්චිත යුක්ති යුක්ත බලහත්කාරයට යටත් පුද්ගලයින්, උදාහරණයක ලෙස සිරකරුවන්, බලහත්කාරයේ විශේෂ ස්වභාවය සමග අනුරූපඔහුන්ගේ ආගම හෝ විශ්වාසයන් භුක්ති විඳිමේ අයිතිය ක්‍රියාත්මක වේ. විශේෂ අවස්ථාවන්හී දි ඔවුන්ගේ ඉල්ලිම සහ නීතියේ කාරණයක් ලෙස යන දෙකම 18.3 වගන්තිය යටතේ වන සිමාවන්ගේ බලපෑම සහ පූර්ණ පරාසය මත වූ තොරතුරු රාජ්‍ය පාර්ශවයන් වාර්තා කලයුතුවේ.<br>**මානව හිමිකම් කමිටුවේ පොදු ප්‍රකාශනය 22**<br>**සිරකරුවන්ට සැලකීම සඳහා ප්‍රමිතිගත අවම පාලනය**<br>පාලනය 41<br>"(1) එකම ආගමේ සිරකරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඇතුළත් ආයතනයක් නම්, සුදුසුකම් ලත් නියෝජිතයෙකු පත්කිරීම අනුමත කෙරේ. කොන්දෙසි සහගත අවසරය සහ එය සිරකරුවන් සමූහය සාධාරණය කරන්නේ නම් පූර්ණකාලීන පදනමෙන් එය සුදානම් කළ යුතු ය.<br>"(2) . 1 යටතේ පත්කළ හෝ අනුමතකළ සුදුසුකම් ලත් නියෝජිතයාට නියම වෙලාවන් හී ඔහුගේ ආගමේ සිරකරුවන්ට පෞද්ගලිකව අධ්‍යාමික මගපෙන්වීමට යැම සහ නිතිපතා ආගමික සේවාව පැවැත්වීමට ඉඩලබාදිය යුතු ය.<br>3) කිසියම් ආගමක සුදුසුකම් ලත් නියෝජිතයෙකුට සිරකරුවෙකු ලඟට ප්‍රවේශවීම ප්‍රතික්ෂේප නොකෙරේ. අනික් අතට කිසියම් ආගමික නියෝජිතයෙකුගේ පැමිණිමට කිසියම් සිරකරුවෙක් එරෙහි වන්නේ නම් ඔහුගේ ආකල්පයට සම්පූර්ණයෙන් ගරු කෙරේ.<br>42. පාලනය: ක්‍රියාත්මක කළහැකි ලෙස ඔහුගේ මනාප උපදෙස් සහ ආගමික ප්‍රතිපදා පොතපත ඔහුගේ සන්තකයේ තබාගැනීම සහ ආයතනයෙන් සපයන සේවාවන් වලට සහභාගිවීම මගින් ඔහුගේ ආගමික ජීවිතයේ අවශ්‍යතාවයන් තෘප්තිමත් කිරිම ට සියලු සිරකරුවන්ට ඉඩ ලබාදෙනු ඇත. |
| 3.c | සරණාගතයින් | **සරණාගතයින්ගේ තත්වයට සම්බන්ධ සම්මතය**<br>2 වගන්තිය :"ඔවුන්ගේ දරුවන්ගේ ආගමික අධ්‍යාපනය සම්බන්ධයෙන්නිදහස, ඔවුන්ගේ ආගමික භාවිතයට ඇති නිදහසට ගරුකිරිම සමග ඔවුන්ගේ ජාතියට අනුකූලවු අවම වශයෙන් සතුටුදායක ලෙස ඔවුන්ගේ භූමිය තුළදී සැළකීම සරණාගතයින්ට ගිවිසුමට බැඳුණු රාජ්‍ය ලබාදියයුතු ය. |

| | | |
|---|---|---|
| | | වගන්තිය.33: දේශපාලන අදහස් හෝ සුවිශේෂ සමාජ කණ්ඩායමකගේ සාමාජිකත්වයක්, ජාතිකත්වයක් ඔහුගේ ආගමේ වර්ගයේ හේතුව මත නිදහස තර්ජනයට ලක්වීම හෝ ඔහුගේ ජීවිතය රැඳී ඇති භූමි ප්‍රදේශයේ අද්දරට කිසියම් හෝ කුමන කරුණක් නිසා හෝ ගිවිසුම් ගත රට සරණාගතයෙකු නෙරපීම හෝ නැවත යැවීම නොකළ යුතු ය. |
| **3.**(d) | ළමුන් | **ළමා අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (CRC)**<br>වගන්ති 14(1) ආගම සහ හෘදසාක්ෂිය, චින්තනයේ නිදහසට ළමුන්ට ඇති අයිතිවාසිකමට රාජ්‍යය පාර්ශවයෝ ගරු කරති.<br>වගන්තිය 14.(2)ළමයාගේ දරාගැනිමේ ප්‍රමාණය සමඟ සමන්විත ආකාරයකින් ඔහුගේ හෝ ඇයගේ අයිතිවාසිකම් භාවිතා කරමින් ළමයාට මඟපෙන්වීමක් ලබාදීමට නිත්‍යානුකූල භාරකරුවන් අදාළවන විට සහ දෙමාපියන්ගේ කාර්යයන්ට සහ අයිතිවාසිකම් වලට රාජ්‍ය පාර්ශවයන් ගරුකරයි. (...) (සි) ඔහුගේ හෝ ඇයගේම වෙනස් සභ්‍යත්වයන් සඳහා, සහ ඔහු හෝ ඇය උත්පත්තිය ලැබූ රටට ළමයි ජීවත්වන රටේ ඇගයුම්, ජාතික ඇගයුම් සහ භාෂාවට ඔහුගේ හෝ ඇගේම සංස්කෘතික අනන්‍යතාවයට, ළමයාගේ දෙමාපියන්ට ගරුකිරීමේ සංවර්ධනයට ගරුකරයි."<br>වගන්තිය.30: ආදිවාසි සම්භවයක් පවතින පුද්ලයින් හෝ භාෂාමය, ආගමික හෝ වාර්ගික සුළුතරයන් සිටින්නා වූ රටවල, එබඳු සුළුතරයකට අයිති ළමයෙකු හෝ ඔහුගේ හෝ ඇයගේ භාෂාව භාවිතා කිරිමට හෝ ඔහුගේ හෝ ඇයගේ ආගම ප්‍රකාශ කිරීම හා අභ්‍යස කිරීමට, ඔහුගේ හෝ ඇයගේ කණ්ඩායමේ සාමාජිකයින් සමඟ ඔහුගේ හෝ ඇයගේ ආගම ප්‍රකාශ කිරීම හා අභ්‍යස කිරිමට, ඇති අයිතිය ප්‍රතික්ෂේප නොකරයි.<br>**1981 මහා මණ්ඩලයේ ප්‍රකාශනය**<br>වගන්තිය 5.(3)"ආගම හෝ අන්‍යයන්ගේ විශ්වාසයේ නිදහස සඳහා ගරුකිරීම, සාමය හා විශ්වීය මිත්‍රත්වය, ජනතාව අතර මිත්‍රත්වය, ඉවසීම අධ්‍යාත්මියක අවබෝධයෙන් ඔහු හැදී වැඩෙයි. ආගමේ හෝ විශ්වාසයේ පසුබිම මත ඕනෑම වර්ගයක වෙනස් කොට සැලකීමෙන් ළමයා ආරක්ෂා කරයි. ඔහුගේ සහායකයා<br>පූර්ණ සිහි කල්පනාවෙන් ඔහුගේ ශක්තියට හා නිපුනතාවයනට සේවයට කළයුතු ය."<br>වගන්තිය5. (5) ඔහුගේ පූර්ණ සංවර්ධනයට හෝ ඔහුගේ ශාරිරික හෝ මානසික සෞඛ්‍යයට හානි නොවිය යුතුව ඇතිදැඩි වන ළමයයෙක් ආගම හෝ විශ්වාසයක් අභ්‍යස කරයි.- උපුටා ගැනීම ව්‍යවස්ථාව 1. (3) පරිච්ඡේදය, වර්තමාන ප්‍රකාශනය. |

| | | |
|---|---|---|
| 3. (e) | සුළුතරය ප්‍රජාවන් | **සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR)**<br>වගන්තිය. 27:වාර්ගික, ආගමික හෝ භාෂාමය සුළුතරය සිටින එම රාජ්‍යයන් හි එවැනි සුළුතරයට අයත් පුද්ගලයින්,ඔවුන්ගේ කණ්ඩායමේ අනිකුත් සාමාජිකයින් සමඟ ප්‍රජාවේස්වකීය භාෂාව පාවිච්චිකිරීමට හෝ ස්වකීය ආගම ඇදහීමට සහ ප්‍රකාශ කිරීමට, ඔවුන්ගේ ස්වකීය සංස්කෘතිය භක්ති විඳිමට ඇති අයිතිය ප්‍රතික්ෂේප නොකරයි.<br>**ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (CRC)**<br>වතන්තිය. 30: වාර්ගික, ආගමික හෝ භාෂාමය සුළුතරය හෝ ආදිවාසි සම්භවයක් ඇති පුදගලයින් සිටින එම රාජ්‍යයන් හි, එවැනි සුළුතරයට අයිති පුද්ගලයින් ඔවුන්ගේ කණ්ඩායමේ අනිකුත් සාමාජිකයින් සමඟ ස්වකීය භාෂාව පාවිච්චි කිරීමට හෝ ස්වකීය ආගම ඇදහිමට සහ ප්‍රකාශ කිරීමට, ඔවුන්ගේ ස්වකීය සංස්කෘතිය භක්ති විඳීමට ඇති අයිතිය ප්‍රතික්ෂේප නොකරයි. |
| 3. (f) | සංක්‍රමණික ශ්‍රමිකයින් | **සියලුම සංක්‍රමණික ශ්‍රමිකයින් හා ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාවේ ජාත්‍යන්තර ප්‍රඥප්තිය.**<br>වගන්ති 12. (1): ආගම, හෘදසාක්ෂිය හා චින්තනයේ නිදහසට ඇති අයිතිය සංක්‍රමණික ශ්‍රමිකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ට හිමිවේ. ඉගෙනීම සහ ක්‍රියාවේ යෙදීමට, ප්‍රතිපත්ති පිළිපැදීමට, විශ්වාසය වන්දනා කිරිම හෝ ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව ඔවුන්ගේ ආගම ප්‍රකාශකිරිමට සහ අනික් ප්‍රජාව හෝ පෞද්ගලික යන දෙකින් එකක් සහ ඔවුන්ගේ කැමති විශ්වාසය මත ආගමකට සකස්විම හෝ ආගමක් තිබීමට නිදහසට මෙම අයිතින් ඇතුළත් වේ.<br>වගන්ති 12.(2): ඔවුන් තෝරාගන්නා විශ්වාසය හෝ ආගමක් තිබිම හෝ තෝරාගැනීමට ඇති නිදහසට හානි පැමිණවීමට සංක්‍රමණික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් යටත් නොකරයි.<br>වගන්ති 12.(4): ඔවුන්ගේ ස්වකීය විශ්වාසය සමඟ අනුකුල, ඔවුන්ගේ ළමයින්ගේ ආගමික සහ සදාචාර අධ්‍යාපනය ලබාදීමට නිත්‍යානුකුල භරකරුවන්, අදාළවනවිට සහ අවම වශයෙන් සංක්‍රමණිය ශ්‍රමිකයින්ගෙන් එක් අයෙකුට, දෙමාපියන්ගේ නිදහසට රාජ්‍ය පාර්ශවයන් වර්තමාන ප්‍රඥප්තියෙන් බැඳී සිටී. |

| 4 අනිකුත් මානව හිමිකම් සමග විශ්වාසය හෝ ආගමේ නිදහස පිළිබඳ තිරස් ඡේදනය | | |
|---|---|---|
| 4. (g) | **ජීවිතයට ඇති අයිතිය හා නිදහසට ඇති අයිතිය.** | **සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය. (ICCPR)**<br>වගන්තිය. 6:<br>1, සියලුම මානව වර්ගයාට ජීවිතයට ඇති අයිතිය තිබේ.<br>මෙම අයිතිය නීතියෙන් ආරක්ෂා කරයි. ඔහුගේ ජීවිතය හිතුවක්කාරි ලෙස අහිමිකිරිමට කිසිවෙකුට නොහැකි ය.<br>2. මරණ දඬුවම අහෝසි නොකර ඇති රටවල සමූල ඝාතනයේ අපරාධ වැළැක්වීම හා දඬුවම් කිරිම කෙරෙහි සම්මුතියට සහ වර්තමාන ප්‍රඥාප්තියේ නියමයන්ට එරෙහි නැති සහ අපරාධය පිළිබඳ බලය පවරා ඇති අවස්ථාවන් හි නීතිය ක්‍රියාත්මක කිරිම සමග ඉතාමත් දරුණු ගනයේ අපරාධ සඳහා පමණක් මරණ දඬුවම ක්‍රියාත්මක කිරීමට පුලුවන. මෙම දඬුවම ක්‍රියාමක කළහැකි එකම ක්‍රමය වන්නේ සුදුසු උසාවියකින් දෙන ලද අවසාන තීරණයකට අනුව ය.<br>ව්‍යවස්ථාව 9. (1): පුද්ගල නිදහස සහ ආරක්ෂාවට සියලු දෙනාටම අයිතියක් ඇත.<br>හිතුවක්කාරව රඳවා තබාගැනීම හෝ අත්අඩංගුවට ගැනීමට කිසිවෙකු යටත් නොවේ. නීතියෙන් ස්ථාපිත කරන බැවින් එබඳු පටිපාටියක් සමග අනුකුලවීම හා එවැනි තත්ත්වයක් හැරුණු විට කෙනෙකුගේ නිදහස කිසිවෙකුට අහිමි කළ නොහැකිය.<br>**මානව හිමිකම් යෝජනා 2005/40(පරිච්ඡේදය 4 (F) කොමිසම සහ මානව හිමිකම කවුන්සිලය 6/37 ( පරිච්ඡේදය 9(I)**<br>මේ අයිතිවාසිකම් කඩකිරීමේ වරදකරුවන් යුක්තිය ඉදිරියට ගෙන ඒම සහ(...)හිතුවක්කාරි ලෙස රඳවා තබාගැනීමටය හෝ වධ බන්ධනයට යටත් කිරීමට (...)පුද්ගලයෙකුගේ ආරක්ෂාව හෝ නිදහස, ජීවිතයට ඇති අයිතිය ඔවුන්ගේ අධිකරණ බලප්‍රදේශය තුළ පැහැර ගැනීමට කිසිවෙකුට නොහැකි ය. |
| 4.(b) | **අවමන් සහගත සැළකිලි හෝ දඬුවම් හෝ අමානුෂික අනිකුත් දුෂ්ඨ බධ බන්ධන තහනම** | **සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය. (ICCPR)**<br>වගන්තිය 7: අවමන්සහගත සැළකිලි හෝ දඬුවම් හෝ අමානුෂික දුෂ්ට හෝ වධබන්ධනවලට කිසිවෙකු යටත් නොවේ.<br>**වධ බන්ධනයන්ට එරෙහි සම්මුතිය.**<br>වගන්තිය. 1:කාල අවකාශයක අනික් පුද්ගලයින්ගේ ක්‍රියාවන් හෝ ආණ්ඩුවේ රාජකාරියක් මත අයත් කරගැනීම හෝ අනුමැතිය සමග හෝ පෙලඹවීමේ නොකැමති විඳ ගැනීමක් හෝ එවැනි වේදනාවකට පත්වන විට ඕනෑම වර්ගයේ වෙනස්කොට සැළකීම මත පදනම් වූ කිසියම් හේතුවකට(...) |

| | | |
|---|---|---|
| | | සම්බන්ධවූ බවට සැකකිරිම හෝ තෙවැනි පාර්ශවයක පුද්ගල සම්බන්ධතාවය හෝ ඔහුගේ ක්‍රියාවක් සඳහා ඔහුට දඬුවම් කිරීම (....)ලෙස එබඳු අරමුණු සඳහා පුද්ගලයෙකු මත චේතනාන්විතව නොකැමති ශාරිරික හා මානසික යන දෙකම විඳිම හෝ දැඩි වේදනාකාරි යම් ක්‍රියාවක් බධ බන්ධනය යන්න අදහස් කිරීම මෙම සම්මුතියේ අරමුණ වේ. ආනුෂාංගික නිත්‍යානුකූල දඬුවම් හෝ ස්වභාවයෙන් මතුවන්නාවු වේදනාවන් වේදනාවට ඇතුළත් නොවේ.<br><br>වගන්තිය 16: 1වෙනි වගන්තියෙන් පැහැදිළි කළ ලෙස ප්‍රමාණයක් නැති වධ බන්ධන දඬුවම් හෝ අවමන් සහගත සැළකිලි හෝ අමානුෂික, අනිකුත් දුෂ්ඨ ක්‍රියාවන් එහි අධිකරණ බල ප්‍රදේශයේ ඕනෑම තැනක වැළැක්වීමට ඒ රාජ්‍ය පාර්ශවය බැඳිසිටී. |
| 4.(c) | **අන්තවාදය සහ ආගමික නොරිස්සීම, ආගමික ගැටුමට සම්බන්ධ ප්‍රශ්න ඇතුළත් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස.** | **සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR)**<br><br>වගන්තිය 19:<br><br>1, සියලු දෙනාට බාධාවකින් තොරව අදහස් දැරීමට අයිතියක් ඇත.<br><br>සියලු දෙනාට ප්‍රකාශනයේ නිදහසට අයිතියක් ඇත. ඔහුගේ කැමැත්ත පරිදි කිසියම් මාධ්‍යයක් තුළින් හෝ කලා ආකෘතියකින් මුද්‍රිත හෝ වාචික, ලිවීම යන දෙකින් එකකින්, දේශසීමා අදාළ නොවන, ඕනෑම වර්ගයක අදහසක් සහ තොරතුරු ලබාගැනීම හා බෙදා හැරිම, තොරතුරු සෙවීමේ නිදහස මේ අයිතියට ඇතුළත් ය.<br><br>20 වගන්තිය<br><br>1. යුද්ධ සඳහා යම් ප්‍රචාරණයන් නීතිය මගින් තහනම් කරයි.<br><br>2. කිසියම් වෛරය, ප්‍රචණ්ඩත්වය, වෙනස් කොට සැළකීමට සංස්ථාපිතව උල්පන්දම් දෙන ආගමික වෛරය හෝ ජාතිවාදි, ජාතික උපදේශනයන් නීතිය මගින තහනම් කෙරේ.<br><br>**මානව හිමිකම කමිටුවේ පොදු ප්‍රකාශනය 22**<br><br>පරිච්ඡේදය. 7. වෛරී හෝ ප්‍රචණ්ඩ, වෙනස් කොට සැළකීමට උල්පන්දම් දෙන සංස්ථාපිත ආගමික වෛරය හෝ ජාතිවාදි උපදේශන හෝ ආගම හෝ 10වෙනි වගන්තියට අනුව විශ්වාසයේ ප්‍රතිඵලයක් ලෙස යුද්ධය සඳහා ප්‍රචාරණය ප්‍රකාශයට පත්කිරීමට නොහැකිය. 11(19) න් එවැනි ක්‍රියා තහනම් කිරීමට නීති පැනවීමට රාජ්‍ය පාර්ශවයන් බැඳි සිටි. |

| 5 එකිනෙක සමග මුහුවන විෂය කරුණු | | |
|---|---|---|
| 5. (g) | අවඥාගෙනදෙන ක්‍රියා | **සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR)**<br>4.1 වගන්තිය :ජාතික ආරක්ෂාවට සහ පැවැත්මට තර්ජනයක් ඇති බවට නිලවශයෙන් ප්‍රකාශයට පත්කරන,මහජන හදිසි අවස්ථාවලදී රාජ්‍ය පාර්ශවයන් වර්තමාන ප්‍රඥාප්තියට අනුව සමාජ මූලය, හෝ ආගම, භාෂාව, ලිංගිකත්වය, පාට, ජාතිය යන කාරණය මත වෙනස් කොට සැලකීමට සම්බන්ධ නොවීම සහ ජාත්‍යාන්තර නීතිය යටතේ ඔවුන්ගේ අනිකුත් බැඳීම් සමග අසීමාන්තික නොවන මිනුම්, තත්ත්වයේ බරපතල හදිසි උවමනාවන් මගින් දැඩිලෙස අවශ්‍ය පුලුල් කිරීම්වලට වර්තමාන ප්‍රඥාප්තිය යටතේ ඔවුන්ගේ බැඳීම් වලින් හානිය අඩුකරන පියවරයන් ගනු ලැබිය හැකි ය.<br>4(2) ව්‍යවස්ථාව අවමකිරීම් නැත(...)මෙම නියමය 18යටතේ තිබිය හැකිය. |
| 5.(b) | සීමා | **සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR)**<br>වගන්තිය 18 ((3)යම් අයෙකුගේ විශ්වාසය හෝ ආගමික නිදහස යටපත්විය හැකි එකම සීමාව වන්නේ අන්‍යයන්ගේ නිදහස සහ මූලික අයිතිවාසිකම් හෝ සදාචාර හෝ සෞඛ්‍ය පාලනය, මහජනආරක්ෂාව රැකගැනීමට අවශ්‍යතාවය තිබීම සහ නීතිය මගින් විස්තරකර තිබෙන සිමාවන් තුළ පමණි.<br>**ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය. (CRC)**<br>වගනතිය. 14 (3):යම් අයෙකුගේ විශ්වාසය හෝ ආගමික නිදහස යටපත්විය හැකි එකම සීමාව වන්නේ අන්‍යයන්ගේ නිදහස සහ මූලික අයිතිවාසිකම් හෝ සදාචාර හෝ සෞඛ්‍ය පාලනය, මහජන ආරක්ෂාව රැකගැනීමට අවශ්‍යතාවය තිබීම සහ නීතිය මගින් විස්තරකර තිබෙන සිමාවන් තුළ පමණි.<br>**සංක්‍රමණික ශ්‍රමික ප්‍රඥප්තිය (Migrant Workers Convention)**<br>වගන්තිය.12 (3) යම් අයෙකුගේ විශ්වාසය හෝ ආගමික නිදහස යටපත් වියහැකි එකම සීමාව වන්නේ අන්‍යයන්ගේ නිදහස සහ මූලික අයිතිවාසිකම් හෝ සදාචාර හෝ සෞඛ්‍ය පාලනය, මහජන ආරක්ෂාව රැකගැනීමට අවශ්‍යතාවය තිබීම සහ නීතිය මගින් විස්තරකර තිබෙන සිමාවන් තුළ පමණි.<br>**මානව හිමිකම් කමිටුවේ ප්‍රධාන ප්‍රකාශය 22**<br>18.3 වගන්තියේ 8වෙනි ඡේදය- විශ්වාස හෝ ආගම ප්‍රකාශ කිරිමට බාධාවන් පැමිණවිමට අවසර ලැබෙන්නේ අන්‍යයන්ගේ නිදහස සහ මූලික අයිතින් හෝ සෞඛ්‍යන් හෝ සදාචාරය, පාලනය, මහජන ආරක්ෂාව රැකගැනිමට තිබෙන අවශ්‍යවය මත නීතිය මගින් සීමාවෙන විස්තරකර තිබෙනවා නම් පමණි. |

| | | |
|---|---|---|
| | | බලහත්කාරයෙන් තොරව විශ්වාසය හෝ ආගමක් තිබීම හෝ පිළිගැනීමට සහ ආගම හා සාදාචාර අධ්‍යාපනය ලබාදීමට භාරකරුවන් සහ දෙමාපියන්ගේ නිදහස සහ විශ්වාසය හෝ ආගමක් තිබීම හෝ පිළිගැනීමට බාධා කළ නොහැකිය.<br>2, 3 සහ 26 වන වගන්ති වලින් සියලු තත්ත්වයන් තුළ පැහැදිළි කර තිබෙන ගුණාත්මක සහ වෙනස් කොට නො සැලකීමට ඇති අයිතිය ආරක්ෂා කිරිම ඇතුළුව ප්‍රඥාප්තිය යටතේ පිලිගෙන ඇති අයිතීන් ආරක්ෂා කිරිමට අවශ්‍ය ඉඩකඩ ඇති සීමා වගන්තිවල පරාසය රාජ්‍ය පාර්ශවය අර්ථ කථනය කරමින් ඉදිරියට ගෙනයායුතු ය.<br>18වෙනි වගන්තියේ වගකීමට බැඳුණු වගන්ති අවලංගු කරන ආකාරයෙන් යොදා නොගතයුතු සහ බලගන්වන සීමාවන් නීතියෙන් ස්ථාපිත කළයුතු ය.<br>උදාහරණයක් ලෙසින් ජාතික ආරක්ෂාව, ප්‍රඥාප්තියෙන් ආරක්ෂාකර ඇති අනිකුත් අයිතිවාසිකම් වලට ඒවා බාධාවන ලෙස ඉඩකඩ ලැබෙන්නේ නම් පවා සුවිශේෂ කාරණා නොමැතිව බාධාවන්වලට ඉඩ නොලැබේ. දැඩි ලෙස අර්ථ කථනයකර ඇති 3වන පරිච්ඡේදයේ 18වෙනි වගන්තිය කෙරෙහි කමිටුව අවධානය යොමුකරයි.<br>ඒවා ප්‍රකාශයට පත්කර ඇති විශේෂ අවශ්‍යතාවයට අදාලව හා සෘජු සම්බන්ධතාවය තිබියයුතු සහ සීමාවන් එය නියමකර තිබෙන අරමුණු සඳහා පමණක් උපයෝගි වේ.<br>වෙනස්කොට සැළකෙන ආකාරයකින් හෝ ඒවා වෙනසකොට සැළකීමේ අරමුණු සඳහා බාධාවන් නියම නොකෙරේ.<br>ආගමික සහ දාර්ශනික බොහෝ සමාජ සම්ප්‍රදායන්ගෙන් ලද සදාචාර මූලාරම්භයන්ගේ සංකල්ප නික්ෂණය කරන කමිටුව, ඒ නිසා වෙන්, සදාචාරයන් ආරක්ෂා කිරීම සඳහා විශ්වාසය හෝ ආගමක් ප්‍රකාශයට පත්කිරිමට ඇති නිදහසේ සිමාවන් අනිකුත් සියල්ල බැහැරකර එක සම්ප්‍රදායකින් හටගත් මූල ධර්මයන් මත පදනම් නොකළ යුතුය. |
| 5.(c) | ව්‍යවස්ථාදායක වාදකරුණු | **සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය (ICCPR)**<br>වගන්තිය 2 (2)ඃඅනිකුත් පියවරයන් සහ පවතින ව්‍යවස්ථාව සඳහා මේ වනවිටත් සපයා නැති වර්තමාන ප්‍රඥාප්තියට බැඳිසිටින එක් එක් රාජ්‍යයන් වර්තමාන ප්‍රඥාප්තියේ පිළිගෙන තිබෙන අයිතිවාසිකම් වලට ප්‍රතිඵල ගෙනදීමට අවශ්‍ය වියහැකි වන අනිකුත් පියවරයන් හෝ එවැනි නීති හදාගැනීමට, වර්තමාන ප්‍රඥාපතියේ නියමයන් සමඟ සහ එහි ව්‍යවස්ථාමය නියමයන් සමඟ අනුකුල අවශ්‍ය පියවරයන් ගැනීම. |

| | | |
|---|---|---|
| | | **ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය. (ICESCR)**<br>වගන්තිය. 2 (1): ව්‍යවස්ථා නියමයන්ගේ විශේෂයෙන් සකස්කර ගැනීම ඇතුළත් සියලුම අදාළ මාධ්‍යයන් මගින් වර්තමාන ප්‍රඥාප්තියේ පිළිගෙන තිබෙන අයිතිවාසිකම් සම්පූර්ණයෙන් යථාර්තවත් කරන නොනැවතී සාධනය කරගැනීමට දැක්මක් සමඟ එහි ලබාගතහැකි උපරිම සම්පත්, විශේෂයෙන්ම ආරථික හා තාක්ෂණික, ජාත්‍යන්තර උපකාර සහ සහයෝගය තුළින් පෞද්ගලිකව වර්තමාන ප්‍රඥාප්තියට බැඳිසිටින ඒ ඒ රාජ්‍යයන් පියවර ගනු ලබයි.<br>**කාන්තා ප්‍රඥප්තිය. (CEDAW)**<br>වගන්තිය .3.පුරුෂයින් සමඟ සමාන පදනමක් මත මූලික අයිති වාසිකම් සහ මානව හිමිකම් භුක්ති විඳිම සහ එවා භාවිතා කිරීම සහතිකවීමේ අරමුණ සඳහා කාන්තාවන්ගේ අභිවෘද්ධිය හා පූර්ණ සංවර්ධනය සහතික කිරීමට නීති සම්පාදනය ඇතුළත්, සියලු අදාළ කටයුතු සියලුම ක්ෂේත්‍රයන් හී විශේෂයෙන්ම දේශපාලන. සමාජ, ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රයේ පියවර රාජ්‍ය පාර්ශවයන් ගනු ලැබේ.<br>**මහා මණ්ඩලයේ වාර්තාව 1981**<br>වගන්තිය 4 (2). ඕනෑම එවැනි වෙනස්කොට සැලකීම තහනම් කිරිමට ව්‍යවස්ථාවේ අවශ්‍යතැන් හී අවලංගු කිරිමට, පැනවීමට සියලු උත්සහයන් සියලු රාජ්‍යයන් ගනු ඇත.<br>වගන්තිය 5: භාවිතයේ නිදහස සහ එවැනි අයිතිවාසිකම් ඔහුටම ප්‍රයෝජනය ගැනීමට හැකිවන ආකාරකින් ජාතික ව්‍යවස්ථාදායකයෙන් ප්‍රධානයකර ඇති වර්තමාන නිවේදනයේ අයිතිවාසිකම් සහ නිදහස ප්‍රකාශයට පත්වේ. |
| 5.(d) | ආගමික නිදහස ඇදැහිලි සඳහා වූ අයිතීන් ආරක්ෂා කිරීම සහ රාජ්‍ය නොවන සංවිධාන | **5 වැනි පරිච්ඡේදය 64/ 164 මහාමණ්ඩලයේ යෝජනාව සහ 17වෙනිපරිච්ඡේදයේ 2005/40 මානවහිමිකම කොමිසමේ යෝජනාව**<br>විශ්වාසය හෝ ආගම මත පදනම් වූ සියලු වර්ගයේ වෙනස්කම් මුලිණුපුටා දැමීමේ ප්‍රකාශනය ක්‍රියාත්මක කිරිමට දිරිගැනවිමට විශ්වාසය හා ආගම මත පදනම් වු සමූහයන් සහ රාජ්‍යනොවන සංවිධානවල උත්සහාය අඛණ්ඩව කරගෙන යෑම දැරිගැන්වීම් සතුටින් භාරගනී. තව ද හිංසාව සහ වෙනස්කොට සැළකීම, ආගම් ඉවසීමේ කැපීපෙනෙන සිද්ධීන් සහ විශ්වාසයේ හෝ ආගමේ නිදහස ඉහල නන්වන ඔවුන්ගේ වැඩ දිරිමත්කරයි. |

# අත්පත්‍රිකා 5.ජාත්‍යනර මානව හිමිකම් ප්‍රමිතීන් උපයෝග කරගැනීම

## ටර්මෙනිස්ථාන් වධබන්ධන සහ නඩු තීන්දු ගැන රාජ්‍ය නොවන සංවිධානවල ඒකාබද්ධ නිවේදනය

1 ටර්ක්මෙනිස්ථානයේ මිනිසුන් 18 දෙනෙකුගේ අමානුෂිය කොන්දේසි යටතේ සිරගත කිරීම සහ අසාධාරණ ලෙස නඩු විභාගකරමින් දඬුවම් නියම කිරිම, වධබන්ධනය, අත්අඩංගුවට ගැනිම පිලිබඳ විශ්වාස කළහැකි වාර්තා හියුමන්රයිට් වොච් සහ ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට ඉදිරිපත්කර තිබේ. ඔවුන්ට එරෙහි සාක්ෂි හෝ මිනිසුන්ට කරන චෝදනා සම්බන්ධ සුවිශේෂි ක්‍රියාවන් කිසිවක් නැති බව නඩු තීන්දුවේ සාරාංශයකින් විදහා දැක්වීම සහ පැය දෙකක නඩු විභාගයක් අවසන්කර වසර 12 සිට 25 දක්වා දඬුවම් හිමිකර දී ඇත.

2 මානව හිමිකම් සඳහා වූ විකල්ප ටර්ක්මෙනිස්ථාන් මාධ්‍යය සංසදය , ඇම්නෙස්ටි ඉන්ටර් නැෂනල්,හියුමන් රයිට් වොච්,මානව හිමිකම් සඳහා ජාත්‍යාන්තර සහයෝගීතාවය, නොර්වෙජියානු හෙල්සිංකි කොමිටිය සහ ටර්ක්මන් ප්‍රාරාම්භනය, දඬුවම නිෂ්ප්‍රභා කිරිම සහ මිනිසුන් 18දෙනා වහාම නිදහස් කිරිමට බලධාරීන්ට ඉල්ලීමක් ඉදිරිපත් කළ හ. නීතිඥයින් හා ඔවුන්ගේ ආදරණියන්ගෙන් හුදෙකලා කිරීම හෝ අනිකුත් පහත් සැළකිලි හෝ තවදුරටත් කිසිවෙකු වධ බන්ධනයන්ට ලක් නොකිරිමට අධිකාරින් සහතික වියයුතුවීම. යුරෝපීය සහයෝගිතාවය සහ ආරක්ෂාව සඳහා සංවිධානය, සහ එක්සත් ජාතින්ගේ මානව හිමිකම් ඒජන්සිය, එක්සත් ජනපද ආණ්ඩුව, එහි සාමාජික රාජයයන්, යුරෝපීය යූනියන් එක ඇතුළත් ටර්මෙනිස්ථානයේ ජාත්‍යාන්තර කොටස්කරුවන් ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරිම හා 18 දෙනා නිදහස කර කිරීමට පොළඹවා ගැනිමට ටර්ක්මන් අධිකාරිය සමග මැදිහත් වියයුතුය.

3 ටර්ක්මෙනිස්ථාන් ආණ්ඩුව වසර ගණනක් තිස්සේ මානව හිමිකම් නියාමකයින් විසින් ජාත්‍යාන්තර නිරික්ෂණය කරනවාට රට වසා තැබුවේ ය. නමුත් වසර ගණනාවක් පුරාවට එහි මර්ධන ප්‍රතිපත්ති සහ දිගු නිර්දය වාර්තා සහ ආණ්ඩුවේ දූෂණයන් ගැන කතා කරන ජනතාවට එරෙහි ප්‍රචණ්ඩ පලිගැනිම් ලේඛණගත වී තිබේ. ඇම්නෙස්ටි ඉන්ටර් නැෂනල් සහ හියුමන් රයිට් වොච් යන සංවිධාන සිද්ධියට සමීප මිනිසුන් කිහිප දෙනෙකු සමඟ කථාකර ඇති නමුත් මිනිසුන් 18 දෙනාගේ අත්අඩංගුවට ගැනීම හා සළකන ආකාරය ගැන බොහෝ විස්තර සනාථ කරගෙන තිබුණේ නැත. කෙසේ නමුත් විරුද්ධ පාර්ශවයේ අධිකාරි සැකකරුවන් අසාධාරණ නඩු විභාග වධ බන්ධනවල ස්වභාවය පුද්ගලයින් විසින්කරන ලද ලේඛණයකින් තොරතුරු ලැබුණි. ශරිරිකව හානි කිරීම නැතිනම් ඔවුන්ට බොහෝවිට නිරන්තරයෙන් පහරදෙන බව සහ සාධාරණ නඩු විභාගයක් ප්‍රතික්ෂේප කිරිම සහ 18 දෙනාටම ඔවුන් කැමති නීති උපදේශකයෙකුට හමුවීමේ අවස්ථාව ලබාදිම ප්‍රතික්ෂේප කිරිම පිලිබඳ විශ්වාස කිරීමට හේතු තිබේ.

## හුදෙකලා සිර අඩස්සියේ රඳවාගැනීම සහ වධබන්ධන

4 හිස්මට්, ෆෙතුල්අ ගෝලාන් සහ ගෝලීය ඉස්ලාම් ව්‍යාපාරය, සමඟ කලින් සම්බන්ධව තිබුණු බව විශ්වාස කරන ජාත්‍යාන්තර ටර්ක්මන් තුර්කි විශ්වවිද්‍යාලයේ හෝ ටර්ක්මන් තුර්කි පාසැලට සම්බන්ධ 2016කට අධික සැකකරුවන් අතරින් සැප්තැම්බර් සහ ඔක්තෝබර් යන මාස දෙකතුළ මිනිසුන් 100කට වඩා රඳවාගෙන ඇති බව මාධ්‍ය වාර්තා කියති.

වරදකරුවන් 18 දෙනාගෙන් 16ක්ම තුර්කි විශ්වවිද්‍යාලයට ගිය හෝ ගුරුවරුන් වශයෙන් සිටිය හෝ හිස්මට් සහ ගෝලාන් සමග සම්බන්ධයක් තිබුණු බවට විශ්වාස කරන පාසැල් කාර්ය මණ්ඩලයේ අයවලුන් වේ. ඉතිරි දෙදෙනාගෙන් එක් අයෙක් පැසැලේ උදව්කරුවෙක් හා හිස්මට් ආයතනයට අනුකූලතාවය දක්වන පාසලක ඉගෙනගත් අයෙකි.

5 අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ අපරාධ සංවිධානය කරන සන්නද්ධ ඒකකයට සම්බන්ධ 6 වෙනි දෙපාර්තමේන්තු විසින් ඔවුන් රඳවා තිබේ. මේ රැඳවියන්ගෙන් බොහෝ දෙනා පසුව නිදහස්කළ අතර මෙම 18දෙනා නඩු විභාගය පැවැත්වීමට පෙර අහල් පලාතේ හස්ල්යහ් හි රැඳවුම් මධ්‍යස්ථානයක, 2017 පෙබරවාරි මාස යේ ඔවුන්ගේ නඩු විභාගය දක්වා රඳවා ඇත.

6 පූර්ව නඩු විභාග කාලයේ අමානුෂිය කොන්දේසි සහ වධබන්ධනයන් තුළ තබා ගෙනසිටි 18 දෙනාට ඇති චෝදනා හියුමන රයිට් වොච් සහ ඇම්නෙස්ටි ඉන්ටර් නැෂනල් ආයතනයට ලැබුණි. ඒ මිනිසුන් නිරන්තරයෙන් පහර කෑමට ලක්වීම සහ දීර්ග කාලයක තිස්සේ කළුවර කාරමර තුළ නිරුවත්ව රඳවා තිබුණු බවට තොරතුරු ඉදිරිපත් කෙරේ. මේ කාලයේ දී ම වධබන්ධනවල ප්‍රතිඵලයක් ලෙස මිය යන්නට ඇති මිනිසුන් 19දෙනෙකු රඳවා තිබී ඇති නමුත් එය තහවුරු කරගැනීමට නොහැකි විය.

7 හුදෙකලා සිර අඩස්සියේ නින්දිත ලෙස රඳවාගෙන සිටි මේ 18 දෙනා පිළිබඳ, ඔවුන්ව අත්අඩංගුවේ තබාගෙන සිටින හේතුව සහ ඔවුන් තබාගෙන සිට තැන පිළිබඳව ඔවුන්ගේ ඥාතීන්ට නිලමාර්ග තුළින් තොරතුරු ලබාගැනීමට හැකිවූයේ නැත. අවසානයේදී අවම වශයෙන් ඇතැම් මිනිසුන්ගේ ඥාතීන්ට නිල නොලත් මූලාශ්‍රයන් තුළින් ඔවුන් සිටින තැන දැනගනනට ලැබුන නමුත් ඔවුන් බැලිමට නොහැකි විය.

8 ටර්ක්මෙනිස්ථානය, සිවිල් හා දේශාපලන අයිතීන් පිළිබඳ ජාත්‍යයන්තර සම්මුතියේ (ICCPR) සහ වධබන්ධනයන්ට එරෙහි එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තිය යන වධබන්ධන තහනම් සංවිධාන දෙකට ඇතුළත් පාර්ශවකරුවෙකි. "ඔවුන්ගේ නිදහස අහිමි කළ සියලු පුද්ගලයෝ මානව පුද්ගලයින්ගේ නිසග අභිමානයට අගෞරව කිරිම සමග මනුෂ්‍යත්වයට තර්ජනය කරයි.

## සාධාරණ නඩු විභාග කඩකිරීම්

9 පෙබරවාරි 8 පැවැත්වූ 18 දෙනාගේ නඩු විභාගය පෙනෙන ආකාරයට ජාත්‍යාන්තර ප්‍රමිතීන්ගෙන් බොහෝ පහළ ය.

10 නඩුව අසා තිබෙන්නේ යස්ල්යක් හි පූර්ව-නඩු විභාග රැඳවුම් කඳවුරේ දී ය. පෙනෙන හැටියට මුළු කණ්ඩායම නියෝජනය කිරීමට නීතිඥයින් හතර දෙනෙක් පමණ ආණ්ඩුවෙන් පත්කර තිබේ. තීන්දුව කියවීම ඇතුළත්ව නඩු විභාගය පැය දෙකෙන් අවසන් වී ඇති බව ලැබුණු තොරතුරු මත පදනම් වේ. ඔවුන්ගේ සේවාදායකයින් නිදහසට තර්ක කිරීම හෝ යම්කිසි සාක්ෂි ඉදිරිපත් කිරිමට ඔවුනට හැකිවූයේ ද හෝ නිදහසට කරුණු සූදානම් කරගැනීමේ පහසුකම් සහ වේලාව මිනිසුගේ නීතිඥයින්ට තිබුනේද නැතිද යන්න නොදනී. විවෘත නොවූ නඩු විභාගයට සහභාගිවීමට පවුලේ සාමාජිකයින්ට අවසර නොලැබුණි.

2 Fergana News, " Turkmen authorities persecute businessmen,teachers for Gulen link", 24 November 216, http://enews.ferganannews.com/news.php?id=3185&mode=snews(accessed29 March2017);Nick Ashdown,"Turkmenistn Cracking Down on |Gulen Followers",Eurasianet'8 December 2016,//www.eurasianet.org/node/81611(accesaed29March 2017).

11 විධිමත් සාක්ෂි ඉදිරිපත් කිරිමට ආණ්ඩුවට උවමනාවක් තිබුණා නම් ටර්මන් නීතිය යටතේ කතින් කොනින් ඇසෙන සාක්ෂි වළක්වා ගැනීමට පියවර ගැන්මට සිටින ආණ්ඩුවට හැකියාව තිබුණි.

12 අභියාචනයක් සූදානම් කිරීමට විත්තිකරුවන්ට සපයන ලද නඩුතීන්දුවේ සාරංශයක් සංවිධාන පරික්ෂා කළ හ. විත්තිකරුවන්ට එරෙහිව ඉදිරිපත් කළ සාක්ෂි පිළිබඳව හෝ චෝදනා ලෙස ක්‍රියාවට නැගූ වරෙන්තු ක්‍රියාවට නැගූ විත්තිකරුවන් ගේ සුවිශේෂ ක්‍රියා ගැන තොරතුරු සපයා නැත. ඔවුන් හෙළිනොකල හේතුන් අධිකාරිය විධිමත්කර තිබූ නිසා, පෙනෙන විදියට සම්පූර්ණ නඩු තීන්දුවක් ලබාගැනීමට විත්තිකරුවන්ගේ පවුලවලට හැකිවී නැත.

13 මිනිසුන් අටදෙනෙකුට 177 පනතේ 3වෙනි කොටස (වාර්ගික හෝ ආගම් වෛරය,සමාජය පෙළඹවීම) සහ 275වෙනි පනතේ 2වෙනි කොටස ( ඔවුන්ගේ ක්‍රියාවන්ට සම්බන්ධවීම හෝ අනිකුත් අපරාධ ව්‍යුහයන් හෝ අපරාධ සහයෝගයන්, සංවිධානාත්මක කණ්ඩායමක් නිර්මාණය කිරීම)සහ 275වෙනි පනතේ 2වෙනි කොටස ( අපරාධ ව්‍යුහයක මූල්‍ය කටයුතු) අපරාධ සංග්‍රහයේ සහනව දෙනෙකුට චෝදනාගොණුකර තිබුනේ 177/ 3 වෙනි කොටස, 275 වෙනි පනතේ 3 වෙනි කොටස සහ 275 වෙනි පනත යටතේ ය . එක් අයෙකුට 136වෙනි පනතේ 3වෙනිකොටස ( සුළුතර අයෙකුට එරෙහි ලිංගික චෝදනා) 177 පනතේ වෙනි කොටස හා 275වෙනි පනතේ 2වෙනි කොටස යටතේ චෝදනා ගොණුකල බව නඩු තීන්දුවේ සාරාංශ ලියවිල්ලෙන් කියයි.

14 මිනිසුන් 18 දෙනා දඬුවම්වලට එරෙහිව අභියාචනා කලහ. උපරිමාධිකරණය නඩු තීන්දුව තහවුරුකර දඬුවම් කළේ ය.

15 සියලු දෙනා ප්‍රසිද්ධ හා සාධාරණ නඩු විභාගයකට ඇති හිමිකම්කම ICCPR ආර් හා 14(1) වගන්තියේ සලසා තිබේ. මාධ්‍ය සහ ජනතාව ඉවත් කිරීමට හැකිවන එකම අවසථාව වන්නේ නිර්ණයන් පටුකළ රෙගුලාසි පැනවූ අවස්ථාවල දී පමණි. මෙම අයිතිය සහතික කිරිමට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානයකින් ප්‍රමානවත් පහසුකම් සැළසීම සහ මහජනතාවට සහ පාර්ශවයන්ට නඩුව අසන ස්ථානය හා වේලාව ගැන අධිකරණය තොරතුරු සැපයිය යුතුය. ජාතික ආරක්ෂාව පිලිබඳ, සංස්ථාපනය කළ දේ නිර්ණය කිරිමට රාජ්‍යයන්ට බාධා නොකළ අභිමතයන නැත. එහෙත් ජාතික ආරක්ෂාව ඇතුළත්ව, අපරාධ නඩුවක් ඇසිම බාධාවක් වියහැකි සුවිශේෂ පටුනිර්න අවස්ථාවන් ගණනාවක් තිබේ. ජාතික ආරක්ෂාවේ තත්ත්වයන් මත ප්‍රසිද්ධ නඩු විභාගයකට ඇති අයිතියට බාධකයන් තිබිය යුත්තේ දැඩි අවශ්‍යතාවයක දී පමණ බව ප්‍රති ත්‍රස්තවාදී සහ මානව හිමිකම් සම්බන්ධ එක්සත් ජාතින්ගේ විශේෂ නියෝජිතයා නැවත නැවත කියා තිබේ. සාධාරණත්වය සහතික කිරිමට නිරික්ෂණය හෝ විමසීම සඳහා ප්‍රමාණවත් යාන්ත්‍රණයකින් එක්ව යායුතු ය.

## දේපොළ රාජසන්තක කිරිම හා බන්ධනාගාර දඬුවම්

16 මිනිසුන් 18 දෙනාගෙන් 9 දෙනෙකක් වසර 25 බන්ධනාගාර ගත කළේ ය. ප්‍රථම පස් වසරක් වැසූ බණ්ධනාගාරයක සහ ඉතිරි කාලය දැඩි රෙජීමේන්තු බන්ධනාගාර කොලනියක ඉතිරි 9 දෙනා රැඳවීමට නියෝග කළේ ය.

3 UN General Assembly "Report of the special Repporture on the promotion nd protection of Human rights and Fundamental freedoms while countering terrorism", A/63/223,UN general Assembly, New York, 2008,para.30.

17 ඔවුන් සහ ඔවුන්ගේ පවුල්වල දෙපොළ රාජ සන්තක කිරිමට අධිකරණය අණකළේ ය. ඔවුන් බොහෝ දෙනාට තරුණ ළමුන් සිටින, ඔවුන්ගේ පවුලේ අනිකුත් සාමාජිකයින්ට අයිති ගේ දොරබඩු සහ පෞද්ගලික ආයිතම් අයිතිය ඇතුළත් ය.

## ටර්මෙනිස්තානයේ අයිතිවාසිකම් කඩකිරිම්

18 ජාත්‍යාන්තර නිරික්ෂණයට රට වසා තිබෙන සාධකය සහ රට අභ්‍යන්තරයෙන් තොරතුරුවලට ප්‍රවේශවීමේ අපහසුතාවයන් නිසා ටර්ක්මෙනිස්ථානයේ මානව හිමිකම් කඩ කිරීමේ ඇත්ත ප්‍රමාණය ඔප්පු කිරීමට ඉතා අපහසු ය. හියුමන් රයිට් වොච් සහ ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ආයතන ඇතුළු මානව හිමිකම් සංවිධාන මගින් බැලීමට යෑම වගේම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ විවිධ නියෝතයින් බැලීමට කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාරය දැක්විමට ටර්ක්මෙනිස්ථානය අසමත්වීම හෝ ප්‍රතික්ෂේප කිරීම ය. කෙසේ නමුත් බරපතල සහ සාමාන්‍ය වූ මානව හිමිකම් කඩවීමේ පරිසරයක් තුළ ටර්ක්මෙනි ස්ථානයේ ජනතාව ජීවත්වන බවට සහතික කළහැකි සිද්ධින් ඇඟවීම්කර ඇත.

## වධබන්ධන සහ බන්ධනාගාරවල තත්ත්වය

19 2016 දී වධබන්ධනයන්ට එරෙහිව ටර්ක්මෙනිස්ථානයෙන් එක්සත්ජාතින්ගේ කමිටුවට කළ වාර්තා සහ එහි නිරික්ෂණයන් ඇතුළත් ව කමිටුව තම සැළකිල්ල මෙසේ සටහන් කළේ ය."පූර්ව නඩු විභාග රඳවාගැනීමේ අතරතුර දී ප්‍රධාන ලෙෂ පාපොච්චාරණ බලෙන් ගැනිමේ අදහසින් සහ විශේෂයෙන් සිරභාරයට ගන්නා අවස්ථාවලදී බරපතල පහරදීම් ඇතුළු පුද්ගලයින්ගේ නිදහස පැහැර ගැනීම, පැතිරුනු වධ බන්ධන සහ අසතුටුදායක සැළකීම් පිළිබඳ චෝදනා ඇතුළත් වේ. එමෙන්ම (එදා මෙදා තුර මියගියා වෙන්නට පුළුවන් මිනිසුන් 19දෙනා) මිනිසුන් 18දෙනාට කරන ලද ඒවා ඇතුළත් වධබන්ධන චෝදනා වලට කඩිනම් ලෙස අපක්ෂපාති විමර්ශනයන් ආරම්භ කිරීම සහතික කිරිමට අධිකාරිය උනන්දු කිරීම සහ වධ බන්ධන සහ එම වගකීම හා වගවීම දරාගැනීමේ වාර්තා විමර්ශනය කිරීමට ආණ්ඩුවේ අසමත්කමත් කොමිටි වාර්තාවේ සටහන් වී ඇත.

20 තොරතුරු ලබාගැනිම දැඩිලෙස පාලනය කර තිබියදීත් නීතිය බලගන්වන නිළධාරීන් විසින් වධ බන්ධන සහ අනිකුත් පහත් සැළකිලි පිළිබඳ විශ්වාස කළහැකි වාර්තා ලබාගැනීම හියුමන් රයිට් වොච් සහ ඇම්නෙස්ටි ඉන්ටර් නැෂනල් ආයතනය අඛණ්ඩව කටයුතුකළේ ය. කෑම සහ ජලය නොදීම සහ අධික සිතලට නිරාවරණය කිරීම, ප්ලාස්ටික් බටවලට වතුරපුරවා පහරදීම, හෝ පොලුවලින් පහරදීම, බලහත්කාරී ලෙස මානසික රෝගින් පාලනය කිරිමට දෙන ඖෂධ ලබාදීම, ලිංගික අපරාධ, ප්ලාස්ටික් මල්ලක් හෝ ගැස්මුහුණු ආවරණයක් දමා වාතය සැපයීම කපාහැරිම සමඟ සිහි මූර්ජාව යොදාගැනීම, විදුලි කම්පන, නියපොතු අස්සට ඉඳිකටු ඇතුල් කිරිම, ඇතුළත් අනිකුත් පහත් සැළකිලි සහ වධ බන්ධන පිලිබඳ වාර්තාවක් 2013 දී ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ආයතනය විසින් ලේඛනගත කරන ලදි.

---

4 UN Committee Aganst Torture, "Concluding observations on the second periodic report of Turkmenistan", CAT/C/TKM/CO/2,UN Committee Against Toture, Geneva,2017,para.7.

5 Committee Aginst Toture,"Concluding observations on the Second periodic report of Turkmenistan", CAT/C/TK/CO/2,UN Committee Against Toture, Geneva,2017,para.8.

ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලබන සිරකරුවන් සහ සිරකරුවන් අතර ලිංගික දූෂණයට බලකිරීම, සිරකරුවෙකුට බලහතකාරයෙන් බෙහෙත් පෙති ගිල්ලවා ඔහුගේ ඥාතීන්ට තර්ජනය කරවීම ඇතුලු අනිකුත් පහත් සැළකිලි හා වධ බන්ධන වාර්තා ද ඇතුළත් කරන ලදි. සාමාන්‍යයෙන් මිනිසුන් නොවලහා කථා කිරීමෙන් වළකින්නේ කවුරුත් දන්නා පරිදි ප්‍රතිවිපාක සහ අනියම් විපාක පිළිබඳ භීතිය නිසාවෙනි.

21 2016 තුළ නිදහස ලැබූ සිරකරුවන් ටර්කිස්ථාන් ප්‍රවෘත්තිවලට විකල්පජ යුරෝපයේ පදනම් වූ ප්‍රවෘත්ති වේදිකාවකට වධ බන්ධන, අනිකුත් පහත් සැළකිලි සහ බන්ධනයට රඳවා ගැනීම් තුළ එකතුවන සැළකිලි සහ අසතුටුදායක බන්ධනාගාර කොන්දෙසි වාර්තා කළහ. මේ සිද්ධීන් තුළ සිරකරුවන්ට පහර දෙන බන්ධනාගාර නිළධාරීහු ඔවුනට, තද රශ්මියේ දීර්ග වේලාවක් තිස්සේ පිටත සිටගෙන සිටිමට බලකරන බව කියති. බන්ධනාගාර නිළධාරිහු සිරකරුවන්ගෙන් බලහත්කාරයෙන් කඩාවඩා ගැනිම ද කරති. ප්‍රමාණයට වඩා සිරකරුවන් රඳවා තැබීම, සිරකරුවන්ට ප්‍රමාණවත්ව ආහාර පාන සහ නෑම සහ වැසිකිළි පහසුකම් සපයා නැත. සමහර සිරකරුවන් බිම හෝ මිදුලෙ නිදාගෙන තිබේ. සිරකරුවන් අතර ක්ෂය රෝගය ඉතා ඉහළ සහ අදාළ ප්‍රතිකාර ඉක්මනින් අවශ්‍ය වී තිබුණි.

"සියදිවි නසාගැනීම් සහ මානසික සෞඛ්‍ය ගැටලු තුළින් ඇතිවූ ප්‍රතිඵල, සහ සිරගත හුදෙකලාවේ පුද්ගලයින් රඳවා තැබීම සඳහා පාලනය අඩුකිරීම" අවධාරණය කර වධ බන්ධනයන්ට එරෙහිව නිරික්ෂණ වාර්තාව අවසන් කරමින් කොමිටිය එසේ ප්‍රකාශ කළේ ය.

## ගමන් කිරීමේ නිදහස සහ සමාගම් පැවැත්වීමේ, සාමකාමීව රැස්වීමේ ප්‍රකාශණයට ඇති නිදහසේ අයිතිය.

22 ටර්මන් අධිකාරිය පිටවහලේ සහ රට ඇතුළේ යන දෙක තුළ ටර්මන් මානව හිමිකම් ක්‍රියාකාරින්ට සහ මාධ්‍යවේදින් යන දෙගොල්ලන්ටම හිරිහැරි කරයි. සැබෑ නිදහස් ජනමාධ්‍යයක් රටේ නැත සහ පුලුල් මාධ්‍ය වාරණය යථාර්තයකි. බලධාරීන් ජංගම දුරකථන වේදිකාව සහ සමාජ මාධ්‍ය වෙබ් පිටු නිරන්තරයෙන් අවහිර කිරීම සහ අන්තර් ජාලයට ඇතුල් විම බාධා කිරීම සහ දැඩිලෙස පාලනය හා නියාමනය සහ ජනතාව විදේශ මාධ්‍යය බෙදා හැරීම්වලට දායකත්වය දීමෙන් වැළැක්වීමට ජනතාවට බාධාකර ඇත. අධිකාරිය මානව හිමිකම් ආරක්ෂකයින් සහ ස්වාධින මාධ්‍යවේදීන් බියගැන්වීම සහ හිරි හැර කරයි. ස්වාධින සංවිධානවලට සහ අනිකුත් එකතුන්ට නිදහසේ ක්‍රියාත්මකවීමට නොහැකිය. අධිකාරිය වේලාවට වන්දි හෝ වෙනත්දේ ප්‍රමාණවත්ව සැපයීමෙන් තොරව ඔවුන්ගේ ගෙවල් වලින් නිරන්තරයෙන් මිනිසුන් ඉවත් කිරිම සහ විදේශ සංචාරය කිරිම ජනතාවට අවහිරකර ඇත.

## ජාත්‍යන්තර ටර්ක්මන් තුර්කි විශ්ව විද්‍යාල සහ ටර්ක්මන් තුර්කි පාසැල්

23 මිනිසුන් 18 දෙනාම උපාධිධාරින්, හිටපු ගුරුවරු හෝ නැතිනම් ටර්ක්මන්- තුර්කි- පාසැල් වලට හෝ ජාත්‍යන්තර ටර්ක්මන්- තුර්කි විශ්ව විද්‍යාලයට සම්බන්ධවූවෝ වෙති. මේ පාසැල් මුලින්ම ගොඩනගා තිබෙන්නේ හිස්මට්, ගෝලීය ඉස්ලාම් ව්‍යාපාරයට හා ෆෙතුල්ආහ් ගොවුලන්ට පෙර සම්බන්ධ වී තිබුණු පදනම් විසිනි.

6 Amnesty International, ***Turkmenistan: An'Era of Happiness' or more of the same repression?,*** EUR 61/005/2013, Amnesty International, London, 2013,pp24-25

7 Alternative Turkmenistan News,"Turkmenistan: on the dismal conditions for prisoners in the prison colony in the town of Tedzhen) 24 August 2016, https://habartm.org/archives/5557(acsessed 2 May 2017).

8 committee Against Toture, " Concluding observations on the second periodic report of Turkmenistan", CAT/C/TKM/CO/2,UN Committee Against Toture, Geneva, 2017, para.23

24 1993 ට පෙර සිට මධ්‍යම ආසියාවේ පුරාම හිස්මට් සමඟ සම්බන්ධතාවයක් තිබෙන බවට විශ්වාස කළ පාසැල් ක්‍රියාත්මක විය. කලාපයේ බොහෝ පාක්ෂිකයින් ව්‍යාපාරයේ සිටිති. ප්‍රථම පාසැල විවෘකළේ 1993දී ය. 2011 වනවිට බොහොමයක් වසාදැමුවේ ය. ජාත්‍යන්තර ටර්ක්මන්- තුර්ක විශ්වවිද්‍යාලය1993 දී ආරම්භ කර 1994 ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම පැමිණිය හ. ජනාධිපති ගාබැන්ගුවෙල් බර්ඩි මුකාහා මෙඩොව් 2016 අගෝස්තු මාසයේ දි විශ්වවිද්‍යාලය වසාදැම්මට නියෝග කළේ ය. ටර්ක්මන් -තුර්කි පාසැල්වල හෝ ටර්ක්මන් -තුර්කි ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයේ හිටපු උපාධිධාරීන්ට අයත් බොහෝ ව්‍යාපාර බලහත්කාරයෙන් වසා දැමුවේ ය. මේවාට සිරගතකර සිටි මිනිසුන 18දෙනාගෙන් සමහර අයගේ ව්‍යාපාර ඇතුළත් ය. තුර්කියේ බලහත්කාරයෙන් හිස්මත් වැසිමත් සමඟ සම්බන්ධ බව සිතු අනික් සංවිධාන සහ පුන්‍ය ආයතන, පාසැල් සහ 2016 ජූලි මාසයේ දි තුර්කියේ සිද්ධ වූ අසාර්ථක කුමන්ත්‍රණය මෙහෙයවීම පිලිබඳව තුර්කි අධිකාරිය විසින් ගුවලන්ට චෝදනා කරති. කුමන්ත්‍රණ උත්සහයට ඔහු වගකිව යුතු බවට වන චෝදනාව ගුවලන් ප්‍රතික්ෂේප කරයි.

9 Nick Ashdown "Turkmenistan Cracking Down on Gulen Followers", Eurasianet, 8 December 2016, http://www.eurasianet.org/node/81611 *(accessed 29 March 2017.*

10 *Ozodagon information Agency, "In Ashgabat the InternationalAgency, "Turmen-Turkish University was clised"), 10 August 2016, http://catoday.org/centrasia/28461-v-ashhabade-zakryli-mezhdunarodnyy-tu... (accesed 5 April 2017).*

11 *See: Radio Azatlyk, ("Ashgabat: Supermarket belonging to arrested businessman open under a new name"), 31 March 2017, http://rus.azathabar.com/a/28402348.html (accessed 5 April 2017; Radio Azatlyk,("In Ashgabat the "Turkish Clinic" was clised"), 4 April 2017 , http://rus. azathabar.com/a/28410250.html (accessed 5 April 2017); redio Azatlyk, (" Yimpas" hasin the end paid the price for links to Gulen"), 27 December 2016, http://rus.azathabar.com/a/28199807.html (accessed 5 April 2017).*

# අත්පත්‍රිකා 6 - සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීම

## දර්ශන සටහන 1

ඔබ, පහර දීමට ලක්වූ බව කියන කාන්තාවක් සමග සම්මුඛව සාකච්ඡා කිරීම. ඇයගේ ආගමික අනන්‍යතාවය නිසා ඇයට පහරදුන් බව වින්දිත තැනැත්තිය හා ඇයගේ ප්‍රජාව සිද්ධියට සම්බන්ධය.

ඇයගේ ආරක්ෂාව පිලිබඳ බිය නිසා පවුලෙන් වෙන් වේ. ප්‍රදේශයේ තොරතුරක් හරහා ඇයගේ සිද්ධිය පිළිබඳව ඔබ දැන ගනියි. වින්දිත තැනැත්තිය ගැන ඔබට කිසියම් හැඳිනීමක් නැත.

ඇය ඔබව හමුවීමට එකඟ වෙයි.

චෝදනාව සම්බන්ධ තොරතුරු ස්ථාපිත කිරිමට සමමුඛ සාකච්ඡාව

## දර්ශන සටහන 2

ජාතිවාදී පහරදීමක් අතරතුර සිදුවී ඇති දරුණු අපයෝජනයන් ගැන සාක්ෂි තිබුණ පුද්ගලයෙකුට සමීපවීමට ඔබට ඉඩ ලැබේ.

විශ්වාස කටයුතු සම්බන්ධතාවයක් හරහා ඔහුට සමීපවීමට ඔබට ඉඩ ලැබී තිබේ.

මිත්‍රශීලී ඔහු ඉදිරිපත්වන සුලු ය. කෙසේ නමුත් , ප්‍රතිවිපාක නිසා තොරතුරු බෙදාහදා ගැනීමට ඔහු බියවේ.

සිද්ධියෙන් කිසියම් රටාවක් මතුවන්නේ නම් එය ඇතුළත්ව ජාතිවාදී ප්‍රහාරය සම්බන්ධයෙන් තොරතුරු ස්ථාපිත කිරීමේ සම්මුඛ සාකච්ඡාවක් කරන්න.

# අත්පත්‍රිකා 7: ප්‍රමිතිගත වාර්තා ආකෘතිය

## ආදර්ශ ආකෘතිය

**වින්දිතයා:** පුද්ගල ☐ කණ්ඩායම/සංවිධානය ☐ විශේෂිත අංකය ......

නම: ...........................................................................................................

ස්ත්‍රී පුරුෂ බව ............... වයස ................ ජාතිකත්වය ..................... පුරවැසිබව .....................

විවහාක අවිවාහකබව: 1. අවිවාහක ☐ 2. විවහා ☐ 3. වැන්දඹු ☐

ස්ථිර ලිපිනය: ගම..................... ප්‍රජාව

දිස්ත්‍රික්කය............................... පළාත.............................

දුරකථනය........................................... දේශපාලන නැමියාව.....................................

වෘත්තිය............................................ තනතුර..........................................

ලිපිනය...........................................................................................................................

වින්දිතයාගේ ස්වභාවය

1. ක්‍රියාකාරික ☐ 2. ගැමි ☐ 3. සේවක ☐

4. මාධ්‍යවේදි. ☐ 5. සිවිල් සේවක ☐ 6. නීතිඥ ☐

7. ව්‍යවස්ථාදායක ☐ 8. වෙනත් (කරුණාකර පැහැදිලි කරන්න) ☐.............................

තමන්ගේ නම බලධාරීන්ට හෝ මාධ්‍යයට අනාවරණ කිරීමට වින්දිතයා එකඟද?

1 ඔව් ☐ 2. නැත ☐

තමාගේ තොරතුරු බලධාරිනට හෝ මාධ්‍ය සමඟ හුවමාරු කරගැනීමට වින්දිතයා එකඟ ද?

1 ඔව් ☐ 2. නැත ☐

වෙනත් කරුණු: .....................................................................................................................

.....................................................................................................................................

අපරාධකරුː පුද්ගල ☐ කණ්ඩායම/සංවිධානය ☐ අනන්‍ය අංකය ☐

අපරාධකරුගේ නමː ..........................................................................................................

ස්ත්‍රී පුරුෂ බව ☐ වයස ☐ ජාතිකත්වය ☐ පුරවැසි බව ☐

1. අවිවාහක ☐ 2. විවහාක ☐ 3. වැන්දඹු ☐

පදිංචි ලිපිනයː ගමː ....................................................

ප්‍රජාව..............................................................

දිස්ත්‍රික්කය............................................... පලාත ...................................................

දුරකථන අංකය ........................................................

දේශපාලන නැම්යාව ............................................... රැකියාව...................................

කාර්යාල ලිපිනය .............................................................

**අපරාධකරුගේ තරාතිරම**

1. ග්‍රාම නිළධාරි ☐ 2. ප්‍රජා නිළධාරි ☐ 3. දිස්ත්‍රිකක නිළධාරි ☐

4. පලාත් නිළධාරි ☐ 5. ජාතික නිළධාරි ☐ 6 පොලිස් ☐

7. මිලිටරි පොලිස් ☐ 8. ආරක්ෂක හමුදා ☐ 9. බන්ධනාගාර නිළධාරි ☐

10 උසාවිය ☐ 11. ව්‍යවස්ථාදායක ☐ 12. පුද්ගලික ආරක්ෂක ☐

13. සංවර්ධන නිලධාරි ☐ 14. හාම්පුතා ☐ 15. සමූහ කලබල...... ☐

16. නොදනි ☐ 17 අනිකුත් සුවිශේෂ ☐

අනිකුත් කරුණු .....................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

## 3. තොරතුරු මූලාශ්‍රය

පුද්ගල ☐ කණ්ඩායම/සංවිධානය ☐ අනන්‍ය අංකය....................

තොරතුරු මූලාශ්‍රයේ නම.......................................................................................................

ස්ත්‍රී පුරුෂ භාවය...................... වයස....................... ජාතිකත්වය................ පුරවැසිබව................

1. අවිවාහක ☐ 2. විවහාක ☐ 3. වැන්දඹු ☐

පදිංචි ලිපින.......................................................................... ගම..........................................

ප්‍රජාව...................

දිස්ත්‍රික්කය.............................. පලාත...........................

දුරකථන අංකය ...........................................................

දේශපාලන නැමියාව ....................................... රැකියාව....................................

කාර්යාල ලිපිනය ......................................................................................................

**තොරතුරු මූලාශ්‍රයේ ස්වභාවය**

1. වින්දිතය ☐ 2 වින්දිතයාගේ සේවා ස්ථානයේ සගයෙක් ☐ 3. වින්දිතයාගෙ ඥාතියෙක් ☐

4. අපරාකරු ☐ 5. අපරාධකරුගේ සේවාස්ථානයේ සගයෙක් ☐ 6. අපරාධකරුගේ ඥාතියෙක් ☐

7. සාක්ෂිකරු ☐ 8. වින්දිතයාට මුදලින් වෛද්‍ය හෝ නීති මගින් සේවා සැපයු අයෙක් ☐

9.වාර්තා ☐ 10 නොදනි ☐ 11 වෙනත්( විස්තර දක්වන්න) ☐

තමන්ගේ නම බලධාරීන්ට හෝ මාධ්‍යයට අනාවරණ කිරීමට වින්දිතයා එකඟද?

1 ඔව් ☐ 2. නැත ☐

තමාගේ තොරතුරු බලධාරිනට හෝ මාධ්‍ය සමඟ හුවමාරු කරගැනීමට වින්දිතයා එකග ද?

1 ඔව් ☐ 2. නැත ☐

වෙනත් කරුණු.........................................................................................................................

.........................................................................................................................................

## සිද්ධියේ තොරතුරු

1 සිද්ධියේ තොරතුරු සංක්ෂිප්තය

1.1 සිද්ධිය නම් කිරීම : (ලුහුඬින්, මතකයේ රඳවාගැනීමට)

1.2 සිද්ධිය වූ ස්ථානය ගම...................... ප්‍රජාව...................... දිස්ත්‍රික්කය..............පලාත................

1.3 ආරම්භක දිනය.............................. අවසන් දිනය............................

සිද්ධිමය ක්‍රියාව ( ලුහුඬින්, සිද්ධිය, කවුද? කුමක් කාටද කළේ)

දිනය ..................................

අපරාධකරු (නම පුද්ගල සහ කණ්ඩායමේ)

ක්‍රියාවේ ස්වභාවය

වින්දිතයා

පුද්ගල හො කණ්ඩායම් ලෙස නම්

අවසන් සිද්ධිය

තරාතිරම

| |
|---|
| 2. සිද්ධි පිලිබඳ විස්තර ( කරුණාකර සිදුවීම පිළිබඳ හැකිතරම් විස්තර කරන්න)<br><br>..................................................................................................................................................<br>..................................................................................................................................................<br>..................................................................................................................................................<br>................................................................................................................................................. |

අතිරේක ආකෘතියක් සාමාන්‍ය වශයෙන් යොදාගන්නේ, දෙන ලද සංසිද්ධියක දී අනිකුත් බොහෝ සංසිද්ධීන්වලට අදාළ කරගත නොහැකි අතිරේක විස්තර තිබෙන තැන්වලදී ය. උදාහරණ ලෙස සියළු වින්දිතයින් නීතිමය ක්‍රියාමාර්ගයන්ට නොබැසීම. මෙසහදි නඩුව, චෝදනා, නඩු අංකය යනාදි ක්ෂේත්‍රයන් වැනි දේ ඇතුල් කිරීමට තිබෙන හිසිතැන් අපතේ යැමට පුළුවන. එවිට බොහෝවිට ප්‍රධාන ආතෘතිය තුළ බොහෝ හිස්තැන් පමණයි ඉතිරි වන්නේ. මෙහිදි අතිරේක ආකෘතියක් අවශ්‍ය වේ.

# අත්පත්‍රිකා 8 : තොරතුරු කාල අනුක්‍රමිකව තොරතුරු සම්පාදනය කිරීමේ ආකෘතිය

| නඩු අංකය/ලිපි ගොණු අංකය | සම්මුඛ සාකච්ඡාකරුගේ සම්බන්ධතාවය | තොරතුරු ලබාදෙන්නාගේ නම සහ සම්බන්ධතා තොරතුරු (වින්දිතයාම නොවන්නේ නම්) | වින්දිතයාගේ නම සම සම්බන්ධතා විස්තර | වින්දිතයාගේ තරාතිරම | ලිංගිකත්වය | දිස්ත්‍රිකකය/ පලාත | අපරාධකරුගේ නම | අපරාධකරුගේ තත්ත්වය | ගැටළුවේ ස්වභාවය | පැමිණිල්ලේ විස්තර | ලේඛණගත සහ අනිකුත් සාක්ෂි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

ඉමඩා යනු සුළු කණ්ඩායම්වල ගෝලීය ජාලයකි. ජපානයේ ආන්තීකරණයට ලක්වූ බාකු ප්‍රජාව විසින් 1988 දී පිහිටුවනු ලැබූ මෙය ආසියාව, යුරෝපය, උතුරු ඇමෙරිකාව හා ලතින් ඇමෙරිකාවේ සහකරුවන් සහ කලාපීය කමිටුවලින් සමන්විත ය. ඉමඩාආයතනයේ දැක්ම හා මෙහෙවරේ පදනම් ආකෘතින් වන්නේ ජාතිවාදිව වෙනස්කොට සැළකිම මුලිණුපුටා දැමීමේ ජාත්‍යන්තර සම්මුතියේ පළල් අරමුණු වැඩිදියුණු කිරීමට ශ්‍රී ලංකාවේ මානවහිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන් අතර ජාලගත කිරීම සඳහා ප්‍රාරම්භනයක් ලබාදීමට 2001 දී ඉමඩා ආසියා කොමිටිය ස්ථාපිත කළේ ය. එහි පළල් අරමුණු සමග සිටින ඉමර්ඩා කොමිටිය දකුණු ආසියාවේ කලාපීය සංවිධාන සමග ජාලගතකිරීම සහ දකුණු ආසියාවේ ගැටුම් සහ සාමය, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ඇතුළත්ව කාන්තාවන්ගේ මිනිස් අයිතිවාසිකම් සහ කාන්තා සුළුතරයේ බහුවිධ ආකාරයේ වෙනස්කොට සැලකීම මත වන වාදකරුණු ආමන්ත්‍රණය කිරීම, එකගතා සඳහා වන සාකච්ඡා සහ පුහුණුව සඳහා පහසුකම් සළසයි.

සහාර් යනු ප්‍රජාතන්ත්‍රවාදි කලාපීය ජාලයකි. එය ජාතික හා කලාපීය යන මට්ටම් දෙකෙහි මානව හිමිකම් වාදකරුණු ආමන්ත්‍රණය කිරීමට බැඳුණු විශාල ජනතාවගේ පළල් සාමාජික පදනමක් සහිත ය. කලාපයේ ප්‍රධන සැළකිල්ලට භාජනය වන වාදකරුණු මත ජනමතය ඇතිකරණ ව්‍යාපාර සහ වැඩසටහන් පැවැත්වීම සහ මානව හිමිකම් මත වන පීඩාකාරි ගැටුමක් ඇති ප්‍රතිපත්තීන් සහ භාවිතයන්, නීති විමර්ශනය කිරීම, මානව හිමිකම් කඩවීම් නියාමනය, කලාපීය මෙවලම් ඇතුළත්ව කලාපීය ප්‍රතිචාරයන් ශක්තිමත් කරමින් යහපාලනය හා සාධාරණත්වය, දකුණු ආසියාවේ ජනතාවගේ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදි අයිතිය යථාර්තවත් කරගැනීමට සහාර් දායකත්වය ලබාදීමට කටයුතු කරයි. ලේඛණගත සාමාජිකයින්ගෙන් පාලනය වන සාමාජිකත්ව කොමිටිය සංවිධානයේ විධායකය ලෙස පත්කරගත් මණ්ඩලය ක්‍රියාකරයි. පිළිවෙලින් සහාර් හි සභාපති හි උප සභාපතිවරු බංගලි දේශයේ සුල්තානා කාමල් මහත්මිය සහ මාලදිවයිනේ මොහොමඩ් ලතීෆ් මහතා වේ. ශ්‍රී ලංකාවේ කොළඹ ලේකම් කාර්යාලය පිහිටා තිබේ.

ජගරන් නේපාල් - ස්ත්‍රී පුරුෂ සමාජ සමානත්වය සහිත සාමකාමි සාධාරණ සමාජයක් දර්ශණය කරගෙන , සංවිධාන ලියාපදිංචි කිරීමේ BS 2034- පනත යටතේ කත්මණ්ඩු දිස්ත්‍රික් පරිපාලන කාර්යාලයේ ආදායම් නොලබන රාජ්‍යනොවන සංවිධානයක් ලෙස 2002 ස්ථාපිත කළේ ය. එතැන් සිට ආරම්භ වූ නේපාල් ජගරන්, ප්‍රජාවගේ ආර්ථික හා සමාජ අවකාශය, දේශපාලනයේ ප්‍රතිපත්ති සම්පාදනයට ප්‍රවේශය සඳහා උපදේශනයන් ලබාදෙමින් සිටියි. රාජ්‍යයේ සහ ප්‍රජාවගේ සියලුම දේශපාලන හා පාලන පද්ධතියේ තීරණ ගැනීමේ කාන්තාවන්ගේ සමාජ සහභාගිත්වය අංශයේ වැඩකරන ප්‍රධාන සංවිධානයක් ලෙස ඉතා කෙටිකලක දි ජගරන් නෙපාල් ස්ථාපිත විය. මේ දිනවල විවිධ සංවිධාන විසින් පුළුල්කර හා සකසා තිබෙන රටේ කාන්තා දේහපාලන- න්‍යාය පත්‍රය බොහොවිට හඳුන්වාදීම සකස් කිරිම ස්ථාපිත කිරිම එය විසින් හඳුන්වා දී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදි භාවිතයන් ස්ථාපිත කිරිම සහ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරිම සහ මානව හිමිකම් සහ සමාජ ආරක්ෂාව සඳහා අඛණ්ඩ ලෙස උපදේශනය හා සහයෝගය ලබාදෙයි.